*2017 මැයි මස 30 අඟහරුවාදා දින*
*2017 மே மாதம் 30 ஆம் திகதி செவ்வாயக்கிழமை* ***Tuesday***
***30 th May 2017***

ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමාගේ මූලාසනාරූඪත්වයෙන් පෙ.ව.10.00 ට සභාව රැස්විය.

கௌரவ தவிசாளர் - கஞ்சன ஜயரத்ன அவர்களின் தலைமை வகித்தார்கள் மு.ப. 10.00 மணிக்கு சபைக் கூடியது.

The Council met at 10.00 a.m Hon.Chairman Kanchana Jayarathna preside the Chair

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------------

සියළු දෙනාටම සුභ උදෑසනක් වේවා! ගරු අමාත්‍යතුමනි , ඒවගේම ගරු විපක්ෂනායකතුමා ,ඒවගේම ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ප්‍රමුඛ ,සභානායකතුමා ප්‍රමුඛ ගරු මන්ත්‍රීතුමන්ලා සියළු දෙනාගෙන්ම අවසරයි. අද දිනට න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා පළමුව තිබෙන්නේ

**අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම්:**

මේ යටතේ කිසිවක් වාර්තා වී නැහැ.

**ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ:**

ඒ යටතේ කිසිවක් වාර්තා වී නැහැ.

**ගරු සභාපතිතුමාගේ නිවේදන:**

මුළු රටම කම්පාවට පත් වෙමින් ඒවගේම විශේෂයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ අපිටත් කෑගල්ල දිස්ත්‍රික්කය ඇතුළු අපේ පළාතේ සහ සමස්ත රට තුළම මේ හදිසි තත්ත්වය යටතේ ජීවිත අහිමි වෙච්ච ඒ ආදරණීයවරුන් සියළු දෙනාටම සබරගමු පළාත් සභාවේ සමස්ත ශෝකය පළ කරන්නට අපි මේක අවස්ථාවක් කර ගන්නවා. අපි දැක්කා අපි නොසිතපු මොහොතක අපි බලාපොරොත්තු වෙච්චි නැති මොහොතක ඉතාමත් ශෝචනීය අන්දමින් ඉතාම අවාසනාවන්ත ලෙස අපේ බොහෝ දෙනෙක් ජීවිත පරිත්‍යාගත කරන්නට සිද්ධ වුණා. ඒවගේම නිවාස අහිමි වුණා. උන්හිටි තැන් අහිමි වුණා. ජීවිත කාලය පුරාම තමන් උපයා ගත්තු සියළුම දේවල් නැති වෙන්නට කටයුතු සිද්ධ වුණා. ඒ නිසා ඒ මිය ගිය පවුල්වල ඥාතීන් සියළු දෙනාටම ශෝකය පළ කරන්නට මේක අවස්ථාවක් කර ගන්නවා.

ඒවගේම ඒ අවස්ථාවේදී අපේ ප්‍රධාන අමාත්‍යතුමා ඒවගේම විශේෂයෙන් සමාජසේවා කටයුතු ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර අමාත්‍යතුමා ඒ අමාත්‍යාංශයේ සියළුම නිළධාරී කාර්යය මණ්ඩලයත් ඒවගේම පළාත් සභාවේ සියළුම මැති ඇමතිතුමන්ලා පක්ෂ භේදයකින් තොරව සියළුම දෙනා විශාල කාර්යය භාරයක්

ඉෂ්ඨ කරමින් ඒ මිය ගිය අයවලුන් වෙනුවෙන් වගේම ඒ පවුල්වල සියළු දෙනාටම මේ අයගේ ශෝකය ඒ පවුල්වලට පළ කිරීමට අපි මේක අවස්ථාවක් කර ගන්නවා. ඒවගේම මේ වෙලාවේදී ඒ සඳහා ඇප කැප වෙලා කටයුතු කරපු සියළුම දේශපාලන අධිකාරියට ඒවගේම රාජ්‍ය නිළධාරීතුමන්ලාට,තුමියලාට ,ත්‍රිවිධ හමුදාවේ සියළුම නිළධාරී මහත්තුරුන්ට මම හිතන්නේ අපි මේකට වෙනම වෙලාවක් වෙන් කළ ගත යුතුව තිබෙනවා. අද සභාව ආරම්භයේදීම පළමුවෙන්ම සමස්ත ශෝකය පළ කිරීම සඳහා අපි සියළු දෙනාම සභාවේ අසුන් වලින් නැගිට අපි ශෝකය පළ කිරීමට මේක අවස්ථාවක් කර ගනිමු කියලා ඉල්ලා සිටිනවා.

ස්තූතියි සියළු දෙනාටම. අපිට ලොකු වගකීමක් තිබෙනවා මීන් ඉදිරියට අද වෙන කොටත් තවදුරටත් අයහපත් කාළගුණ තත්ත්වය ඒ ආකාරයෙන්ම පවතිනවා. ඒවගේම ඒ විපතට පත් වෙච්චි ජනතාවට මේ වෙන කොට කඩිනමින් සහන සලසාදීම සඳහා හැම කෙනෙක්ම ඇප කැපවීමෙන් කටයුතු කරනවා. ඒ සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ඔස්සේ ඒ අයට සහන සැලසීමට සහයෝගය ලබාදීමට අපි සියළු දෙනාම එකතු වෙලා කැප වෙමුයි කියලා මම මේ වෙලාවේ සියළු නොටම ආරාධනා කරනවා.

**නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා:**

*ගරු ආ.ප.සංවිධායක හර්ෂ සියඹලාපිටිය*
*கௌரவ அரச.க.அமைப்பாளர் ஹர்ஷ சியம்பலாபிடிய*
*Hon.Gov.Whip Harsha Siyambalapitiya*
------------------------------------------------------

ගරු සභාපතිතුමනි අද දිනය ප්‍රධාන අමාත්‍යතුමාටත් ගරු ශ්‍රීලාල් වික්‍රමසිංහ අමාත්‍යතුමාටත් නිවාඩු ලබා දෙන ලෙස මතක් කර සිටිනවා.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*
----------------------------------------------------

ගරු සභාපතිතුමනි අද දින නොපැමිණි සියළුම දෙනාට මේ උවදුර නිසා නිවාඩු ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
**----------------------------------------------------------**

ස්තූතියි අද දවසේ මේ අයහපත් කාලගුණ තත්ත්වයත් විපතට පත් වූවන්ට සහන සැලසීමත් ඒවගේම විපතට පත්වූවන් වෙනුවෙන් ඒ කටයුතුවල නිරත වෙලා සිටින ගරු සියළුම මන්ත්‍රීතුමන්ලා වෙනුවෙන් අද දවසේ නිවාඩු ලබාදීම සුදුසුයි කියන එක විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා යෝජනා කරනවා. ඒ අනුව ඒ සියළු දෙනාටම සභාවේ නිවාඩු ලබාදීම අනුමත කරනවා.

**ලිපි ලේඛණ පිළිගැන්වීම:**

මේ යටතේ කිසිවක් ලැබී නැහැ.

**කාරක සභා වර්තා පිළිගැන්වීම:**

මේ යටතේ කිසිවක් නැහැ.

**පෙත්සම්:**

අජිත් කුමාර මැද්දෙගම මැතිතුමාගේ පෙත්සම ඉදිරිපත් කිරීමට අවස්ථාව.

*ගරු මන්ත්‍රී අජිත් කුමාර මැද්දෙගම*
*கௌரவ உறுப்பினர் அஜித் குமார*
*Hon.Member Ajith Kumara Meddegama*
----------------------------------------------------------

ගරු සභාපතිතුමනි රක්වාන කොටල පදිංචි පී.ඕ.ඩී.විජේපාල මහතා විසින් ඉදිරිපත් කරන ලද පෙත්සම පිළිගන්වනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
----------------------------------------------------------

ස්තූතියි ගරු අජිත් කුමාර මැද්දෙගම මැතිතුමනි. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද මහජන පෙත්සම පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා.

**ප්‍රශ්න:**

ප්‍රශ්න ඉදිරිපත් කිරීම යටතේ කිසිවක් ලැබී නැහැ.

**අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ:**

කිසිවක් ලැබී නැහැ.

**පෞද්ගලික ප්‍රකාශ කිරීම්:**

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස*
*கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச*
*Hon.Opposition Leader W.Somadasa*
----------------------------------------------------------

ගරු සභාපතිතුමනි පොදු කටයුතු ආරම්භයේදී දැනුම්දීමක් අවශ්‍ය නොවන යෝජනා යටතේ කතා කරන්න බලාපොරොත්තු වෙන්නම්. 12 යටතේ.

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර* *கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார* *Hon. Minister Ranjith Bandara*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි අද දවසේ සභාවේ කටයුතු අත්හිටුවා රත්නපුර දිස්ත්‍රික්කයත් ඒවගේම මුළු මහත් ශ්‍රීලංකාවටත් ඇති වී තිබෙන හදිසි තත්ත්වය පිළිබඳව ගරු මැති ඇමතිතුමන්ලා සහ මන්ත්‍රීතුමන්ලාට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසාදී අනිකුත් සභාවේ කටයුතු කල් තබන්න කියලා මම යෝජනා කරනවා .

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්*
*கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்*
*Hon.Member M.Y.M.Iflar*
----------------------------------------

ගරු සභාපතිතුමනි අද දිනයේදී සභාවේ සියළු කටයුතු අත්හිටවලා මේ මොහොතේ සිදු වෙමින් පවතින අයහපත් කාලගුණ තත්ත්වය සහ මේ සිදුවී තිබෙන හානිය සම්බන්ධයෙන් සභාවේ අදහස් ප්‍රකාශ කරන්නට අවස්ථාව සලසා දී තිබෙන යෝජනාව ස්ථිර කරමින් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

එහෙම නම් රංජිත් බණ්ඩාර ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව අනුව අද දිනයේදී සාමාන්‍ය පරිදි න්‍යාය පත්‍රයේ අනුමත කාරණා සාකච්ඡා කිරීම මීළඟ සභා වාරයට ඉදිරිපත් කරමින් ඉතාමත් ශෝචනීය ලෙස මේ අයහපත් කාලගුණ තත්ත්වය නිසා විපතට පත්වූවන් පිළිබඳව මේ සභාව තුළ අදහස් දැක්වීම සඳහා , මේ අවස්ථාවේදී ඉඩකඩ ලබා දෙනවා. මේ සඳහා ගරු සිරිපාල කිරිඇල්ල විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට ආරාධනා කරනවා.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි රත්නපුර දිස්ත්‍රික්කය මුල් කරගෙන රටේම වුණ මේ ව්‍යවසනය සම්බන්ධව පළමුවෙන් කණගාටුව ප්‍රකාශ කරමින් ගරු සභාපතිතුමනි රත්නපුර දිස්ත්‍රික්කය ගත්තහම ආපදා වලට ලක් වෙච්චි ජනතාවගේ වුවමනාවන් ඉටු නොවිච්චි ප්‍රදේශ ගැන පළමුවෙන්ම මගේ කණගාටුව ප්‍රකාශ කරනවා ගරු සභාපතිතුමනි. මෙතන මේ මේන්ටේන් එක දිස්ත්‍රික් ලේකම්තුමා හෝ තුමිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක් ගත්තහම මේවේ එන ලේකම්වරු අතර ගත්තහම විශේෂයෙන්ම මම මුල් කරගෙන කතා කරන්නේ මඩබද්දර කලවාන ආසනය සම්බන්ධවයි. මේ සම්බන්ධව ගරු සභාපතිතුමනි අදහස් දක්වන විට මඩබද්දර ප්‍රදේශ කීපයකම ගරු සභාපතිතුමනි ජනතාව දැන් සභාවට එන අවස්ථාවේත් දුරකථනයෙන් කතා කරලා කිව්වා අපිට ආධාර උපකාර නෑ. කෑම බීම අඩුපාඩුවක් තියෙනවා කියලා. මේ සම්බන්ධයෙන් ඊයේ දිනයේදී දිස්ත්‍රික් ලේකම්වරියට කියන විට එතුමිය කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම්තුමියට කියලා මෙතෙන්ට ආහාර යැව්වා කියලා

කියනවා ගරු සභාපතිතුමනි. ගමේ ජනතාව මේ වෙලාවේ විපතට පත් වෙච්චි අය බොරු කියන්නේනෑ ගරු සභාපතිතුමනි. මෙතන ගත්තහම ගරු සභාපතිතුමනි හාල් ටිකක් ඇරලා හරියන්නේ නෑ. අඩු ගානේ ලුනු කැටයක් තියෙන්න ඕනේ ලුනු දාලා හරි කන්න. එහෙම නම් ඉතුරු තුනපහ මාළුවට ඕනෑ කරන දේවල් මඩබද්දර ප්‍රදේශයට ලැබිලා නැහැ ගරු සභාපතිතුමනි. මේ සම්බන්ධව අපි කිසිම කෙනෙකුට දොස් කියනවා නෙමෙයි වුවමනා රාජකාරිය අවුරුද්දකට වතාවක් ගංවතුර එන කොට ඒකට කලින් ලක ලෑස්ති වෙන්න ඕනේ කියලා කියනවා මම. මේ සභාවට ඉස්සෙල්ලා සභාව පටන් ගත්ත වෙලාවේ මේ සභාවේම කිව්වා සියළුම දෙනා ලක ලෑස්ති වෙන්න ගංවතුර එන්න පුළුවන් නාය යෑම් එන්න පුළුවන් සුළි සුළං එන්න පුළුවන් කියලා. මේ සම්බන්ධව ඒ කටයුතු කිරීම ගත්තහම මම හිතන ආකාරයට ප්‍රබල අය මේකට වගකිව යුතු අය ගාල්ලේ ඉඳලා හරි යන්නේ නෑ ගරු සභාපතිතුමනි. ගංවතුර උවදුර ගැන මතක් කරලා මේක එන බව අපි දැනගෙන ගාල්ලේ නෙමෙයි අපි ඉන්නට ඕනේ රත්නපුර දිස්ත්‍රික්කයේ. එහෙම නම් ගරු සභාපතිතුමනි රත්නපුර දිස්ත්‍රික්කයේ කෙනෙක් හිටියා නම් අද අපිට මේ උවදුරට මුහුණ දෙන්නට සිද්ධ වෙන්නේ නෑ කියන එක මගේ මතයයි ගරු සභාපතිතුමනි. ගරු සභාපතිතුමනි මේක හැමදාම හිඟන්නාගේ තුවාලය වාගෙයි. මේක මේ අද ඊයේ නෙමෙයි. වසර ගණනාවක් තිස්සේ මේ ක්‍රමය ආපු දා ඉඳලා ප්‍රශ්නයක්. සුද්දාගේ කාලයේ ඉඳලා සුද්දා රිසිවේසන් කියලා දෙයක් ඇති කරනවා. ඇල දොළ කියලා එකක් ඇති කරනවා. අහස් දිය වැටුණහම නවතින්න කියලා තැනක් ඇති කරනවා ඒවා ගත්තහම ගරු සභාපතිතුමනි මේ රටේ පරිපාලනයේ තියෙන දුර්වලකමින් ඒ සියල්ලක්ම අද විනාශ වෙලා තියෙනවා. අද රිසිවේසන් එකක් කියලා දෙයක් නෑ. පහත් බිමක් කියලා දෙයක් නෑ. මේවා කළමණාකාරිත්වයේ තියෙන දුර්වලකම් ගරු සභාපතිතුමනි. මේ අතරට අපි 93 පළාත් සභාවට ආපු දා ඉඳලා කියපු දෙයක් ගරු සභාපතිතුමනි මේ විපතට පත් ජනතාව ගැන විශේෂ අවධානය යොමු කරලා මේ අයට ස්ථිරසාර ඉඩම් දීලා ඒ අයගේ ගෙවල් හදා ගන්න බැරි නම් ඒ උදව් උපකාර කරලා මේ අය නියම තැනක පදිංචි කරන්න ඕනේ කියලා කියනවා ගරු සභාපතිතුමනි. ඒවගේම මම එක තැනක් තමුන්නාන්සේට උපමාන කරගෙන කතා කරනවා. කීරගලවත්ත ගිය පාරට එහා පාර නාය යන කොට මේ අයට ඉඩම් දුන්නා ගරු සභාපතිතුමනි. ගරු සභාපතිතුමනි තමුන්නාන්සේගේ විශේෂ අවධානයට කියන්නේ කීරගලවත්තේ දුන්නු ඉඩම් යම්කිසි කෙනෙක් මේ ඉඩම් විකුණලා නැවත මෙතෙන්ට පදිංචියට ඒ නැවත කීරගලවත්තට පදිංචියට ගිය අය. ඒ ඉඩම් විකුණපු අය හොයලා බලලා දැඩි දඬුවම් දීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන්න ඕනේ ගරු සභාපතිතුමනි මේක සෙල්ලම් කරලා හරියන්නේ නෑ. හුරතල් කරලා හරියන්නේ නෑ ගරු සභාපතිතුමනි අතිවිශාල ජනතාවක් අද අසරණ වෙලා තියෙනවා. මේකට අපි හැමදාම කියන දෙයක් පහත් බිම ගොඩ කරන්න එපා. පහත් බිමට වැටෙන අහස් දිය සමූපකාර ක්‍රමයට පොළොවට උරා ගන්නා වැඩ පිළිවෙලක් තියන්නට ඕනේ. මේක හරියට තිබුණේ සුද්දගේ කාලයේ විතරයි ගරු සභාපතිතුමනි. අපි ඒ ගැන කණගාටු වෙන අතර හැමදාම කියන දෙයක් තමයි ගරු සභාපතිතුමනි තමුන්නාන්සේගේ විශේෂ අවධානයට යොමු කරන්නේ. මේ නාය යෑම් වලට ලක් වෙන අයට ඉඩම් දෙන්න. ගංවතුරට ලක් වෙන අයට ඉඩම් දෙන්න. මේ රටේ ගරු සභාපතිතුමනි පරාක්‍රම

යුගයේ කෝටි පහක් ජනතාව හිටියා නම් අද ඉන්නේ දෙකෝටි දස ලක්ෂය නම් ඇලට මුහුදට,ගඟට බාදනය වෙච්චි ඉඩම් බොහොම අල්පයයි ගරු සභාපතිතුමනි. දෙකෝටි දස ලක්ෂයක් ඉන්න කොට මේ සබරගමුවේ ජනතාව විපතට පත් වුණහම උතුරු නැගෙනහිර වුණත් කමක් නෑ මේ ලංකාවේ කොටසක් ගරු සභාපතිතුමනි ඒවේ සාමය ඇති කිරීමයි කරන්න ඕනේ රජය ඒ ඇති කරලා ඉවර වෙලා ඒ ඉඩම් ඇති ප්‍රදේශවල මේ ජනතාවට ඉඩම් ලබාදීමේ කටයුත්ත කරන්න ඕනේ. අපි 93 ඉඳලා ලේ රඟ වෙනකන් කෑගහන්නේ මේ අසරණ ජනතාවට විපතට පත් වෙච්චහම පහසුකම් ලබා දෙන්න කියලා. හැමදාම තුවාලක් වෙලා තියෙනවා. රජයට කෝටි ගාණක් අවුරුද්දකට සැරයක් වියදම් වෙලා තියෙනවා. ඒවගේම ව්‍යාපාරිකයන්ට වැය වෙනවා ධානපතියන්ට වැය වෙනවා. හැම අංශයක්ම ගත්තහම මේ මුදල් වතුරේ යන ආකාරයට තමයි වෙලා තියෙන්නේ. මේ අයට අපි කියනවා බහුලව ඉන්න ප්‍රදේශවල ඒ අයට කරන්න පුළුවන් තවත් ක්‍රමයක් තියෙනවා තට්ටු නිවාස හදලා මේ අය ඒවේ පදිංචි කරලා උඹලාට පුළුවන් වෙච්චි කාලයක ඉඩමක් ගෙයක් දොරක් හදලා පදිංචි වෙයල්ලා. එතකන් මේ තට්ටු නිවාසවල ඉන්න කියලා වැඩ පිළිවෙලක් කරන්න ඕනේ ගරු සභාපතිතුමනි. ඒවගේම ඉඩම් දෙන්න පුළුවන් තැන්වල මේ ජනතාවට ප්‍රයෝජනයක් ගන්න පුළුවන් ආකාරයට ඉඩම් ලබාදීම වැදගත් වෙනවා. ඩී.එස්.සේනානායක මැතිතුමා අක්කර පහ පහ දුන්නා. ඒවේ අද පවුල් හතර පහ වෙලා පරම්පරා තුන හතර වෙලා ජීවත් වෙනවා ගරු සභාපතිතුමනි. මේකට විය යුතු කළ යුතු එකම කාර්යය තමයි මේ අහස් දිය වැටෙන තැන ගොඩ නොකොට තියා ගන්න එක. ඒවගේම මේ අහස් දිය වැටිලා ගං වතුරට ලක් වන ජනතාවට අනිවාර්යයෙන්ම ඉඩම් ලබා දෙන්න ඕනේ. මේක රක්ෂිතයක් කරන්න ඕනේ. මේ රක්ෂිත ප්‍රදේශයේ ජනතාව හුරතල් කරලා හරියන්නේ නෑ ගරු සභාපතිතුමනි. ජනතාව හුරතල් නොකර ඒවේ තහනමක් ගහලා ඒ ජනතාවට වුවමනා ආකාරයට ඉන්න වැඩ කටයුතු කරන්නට ඕනේ කියලා මතක් කරනවා. දැන් තමුන්නාන්සේ දන්නවා බොරළුව පන්සල කියන තැන. පන්සලට ඇතුල් වෙන කොටම ගරු සභාපතිතුමනි මහා විශාල කන්දෙන් මෙහාට ගලාගෙන එනවා පස් කණ්ඩිය ඒවගේම ආනන්ද හේවගේ කියන ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාගේ ගේ ගාවින් මේ විදිහට වැටෙනවා . ඇහැලියගොඩ ආසනය ගත්තහම නාය යෑම් 28 ක් තියෙනවා ගරු සභාපතිතුමනි. ඒවගේම මරණ තියෙනවා 30 ක් . 30 න් 26 යි හම්බ වෙලා තියෙන්නේ. 4 ක් හම්බ වෙලා නෑ. මේ සියල්ලටම වගකියන්න ඕනේ කවුරු මොනවා කිව්වත් මේ රටේ එදාත් අදත් රට පාලනය කරන සියළුම දෙනා වගකියන්න ඕනේ මේ විපතට පත් ජනතාව වෙනුවෙන්. මේ අයට සහන ලබා දෙනවා කියලා ඉවර වෙලා සහන නොලැබිච්ච අය ඉන්නවා ගරු සභාපතිතුමනි. ඔරු වලින් ගිහිල්ලාත් කෑම ටිකක් දෙන්න බැරි තැන් තියෙනවා. හැඩ පහරට හසු වෙලා තියෙනවා. ඒවේ ජනතාව ගස් උඩ ඉන්නවා. ගල් උඩ ඉන්නවා. මේ ජනතාවට මේ පහත් බිම් ගොඩ කිරීම උඩ වෙච්චි දේවල් කියන එක මම වගකීමෙන් කියනවා. ඒ නිසා අපි මේ යෝජනා කරන්නේ ගංවතුර අපි ගරු සභාපතිතුමනි කලුතරින් මහ මුහුදට ගලා විනාශ වෙන වතුර ටික අපි කියන්නේ 1953 ගෙනාපු යෝජනාව ඒක හරියට මේ පාරවත් ක්‍රියාත්මක කරලා ඉවර වෙලා කලු ගඟ හදන්න ඕනේ. මහවැලි ගඟ හම්බන්තොට දක්වාවත් දියත් කරන්න ඕනේ. ඒ කරන කොට ගරු සභාපතිතුමනි මේ රටේ හතරෙන්

එකක් ගොවිතැන් කරන්න පුළුවන්. පෝෂණය වෙනවා. විරැකියාවට පිළියම් වෙනවා. අපිට ඕන කරන හාල්, පළතුරු,එළවළු වර්ග උපයා ගන්න පුළුවන්. මේ කියන කාරණය ගැන අවධානය යොමු කරනවා නම් ගරු සභාපතිතුමනි මේ මල්වල මෙතනින් හරස් කරන කොට මේ ඊයේ පෙරේදා කීපදෙනෙක් අපිව මරාගෙන කන්න හැදුවා. ඒක නෙමෙයි මේ සමස්තයක් ගන්න ඕනේ මල්වල ප්‍රදේශයේ පවුල් 200 නම් 400 නම් 500 ක් වෙන්න පුළුවන් පහලොස්දාහක් ලක්ෂ එක හමාරක් දෙකක් මේ රටේ ජනතාව වෙනුවෙන් සුභ සෙත සලසන්න නම් මේ කලු ගඟ ව්‍යාපාරය හම්බන්තොට දක්වා දියත් කරන්න ඕනේ මම එදාත් කියනවා අදත් කියනවා මරාගෙන කෑවත් විරුද්ධ වෙන අයට එහෙම වෙන්න කියලා. මේ සමස්තයක් රට වෙනුවෙන්. මේ කටයුත්ත කරන්න කයමින් අසරණ ජනතාව ඇහැලියගොඩත් එක්ක මේ මරණ වෙච්චි සියළුම දෙනාට මගේ පෞද්ගලික කණගාටුව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. තමුන්නාන්සේ අවස්ථාව සලසාදීම සම්බන්ධයෙන් තමුන්නාන්සේට ස්තූති කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට. මීළගට ගරු අතුල කුමාර රාහුබද්ධ ඇමතිතුමාට ආරාධනා කරනවා.

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ*
*கௌரவ அமைச்சர் அதுல குமார ராஹுபத்த* Hon.
*Minister Athula Kumara Rahubadda*

-----------------------------------------------------

ගරු සභාපතිතුමනි රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති වුණු විශේෂයෙන්ම ඛේදජනක සිද්ධිය පිළිබඳව මේ ගරු සභාවේ වචන කීපයක් කතා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව මම ස්තූතිවන්ත වෙනවා. ඒවගේම ගරු සභාපතිතුමනි අපේ සිරිපාල කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමා කිව්වා වගේ මේක රත්නපුර දිස්ත්‍රික්කය කියන්නේ සාම්ප්‍රදායිකව අපිට ඉතිහාසයේ ඉඳලා එන කතන්දරයක්. එතුමාගේ සියළු දේට එකඟ වෙනවාත් සමහර කාරණා වලට එකඟ වෙන්න ඕනේ අපි. මොකද මේ සම්ප්‍රදාය සබරගමුවේ තියෙන අවුරුද්ද ඉවර වෙලා දවස් 48 ක් යන කොට ස්ථිරවම අපිට ගං වතුර ගලනවා. ඒක ආශ්‍රිතව ඒකට සමගාමීව නාය යනවා. මේවගේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වෙනවා කියන එක ඉතිහාසයේ ඉඳන් පැරණ්නන්ගේ ඉඳලා අද දක්වාම වෙනවා. හැබැයි මේක පිළිබඳව දීර්ඝ කාලීනව අවබෝධයක් නෑ. වැඩ සටහනක් නෑ. හැබැයි අපි මේ වෙලාවේ සිරිපාල මන්ත්‍රීතුමා කිව්වා වගේ කලු ගඟ අපේ කතාවන් කිව්වොත් පෙත්තටම ගඟ යනවා කියන්නේ ස්ථිරවම පහුවදාම කොහේට හරි වැස්සොත් ගං වතුරක් දානවා. එහෙම නැත්නම් යට වෙනවා කියන කාරණය අපේ දිස්ත්‍රික්කයේ ඉන්න නිළධාරීන් දන්නවා. ඒ නිසාම ඔවුන් ඒ වැඩ පිළිවෙල සකස් කරනවා. මේ දින හරියටම ගණන් වෙන කොට දින 58 වෙන්නේ නෑ. අපේ කාලයේ මේක එක්කෝ 60 වෙනවා නැත්නම් තිස් ගණන් වෙනවා ඒකොහොම වුණත් මේ ක්‍රියාදාමය මේ දේ සිද්ධ වෙනවා. ඒ

නිසා අපි දැක්කා පහුගිය දවසක මේ වැඩ පිළිවෙල ක්‍රියාත්මක වෙන කොට ඔබ සියළු දෙනා ස්තුති කලා සියල්ලන්ටම. මම ඒ සියළු දෙනාට ස්තුති කරන්න කලියෙන් මේ සිද්ධිය කන වැටුණු ඇහැ වැටුණු සියළු වෙලාවේ මුලින්ම උදව් කලේ අසල්වැසියෝ වට පිටාවේ පන්සලේ ඉඳලා ගමේ මිනිස්සු. මුලම මිනිස්සු ටික ඇඳ ගත්තේ බේර ගත්තේ. ගෙදර තිබුණ දේ උයලා දුන්නේ මේ සියළු වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන්න ඉස්සෙල්ලා මේකට උදව් කලේ අපේම මිනිස්සු ටික. අන්න ඒ මිනිස්සුන්ට රජයේ නිළධාරීන්ට වගේම ඒ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරනවා වගේ සියළු හමුදාවල් වලට වගේම ඒ කෘතවේදිත්වය දක්වන්න ඕනේ පළමුව අපි ඒ සියළු දෙනාට අසල්වැසියන්ට. ඒ නිසා මේ උදාහරණ ඕන තරම් තියෙනවා පන්සල්වල ඔබතුමා දන්නවා රිල්හේන පන්සලේ හාමුදුරුවෝ දෙනම තමයි පළමුව ජීවිත ටික බේර ගත්තේ කඹේ ගැට ගහලා. එහෙම නොවෙන්න විශාල ජීවිත ගණනාවක් අනතුරු ගණනාවක් පැල්මඩුල්ලේ නැති වෙලා තියෙන්නේ ජීවිත පහකට අඩු ගාණක්. හැබැයි දහය පහළොව එතන නැති වෙන්න ගියා ඒ ස්වාමීන් වහන්සේලා දෙනම තමයි පන්සලේ හිටපු කොල්ලෝ දෙන්නා තුන් දෙනාත් එක්ක ඉස්සෙල්ලාම වැඩේ පටන් ගත්තේ. ඒවගේම කෑම පන්දාහද දහ දාහද සියළු දෙනාත් එක්ක උයලා දුන්නා. හැබැයි රාජ්‍ය නිළධාරීන් එතෙන්ට ගිහිල්ලා කිව්වේ මේවා මොන මෙහෙයුම්ද කියලා. ස්වාමීන් වහන්සේ අඳනකඩය මම යන කොට හයයි අඳනකඩය පිටින්. ඒ වගේ වෙලාවට මේ නිළධාරීන් කිව්වා මේවා මොන වැඩ සටහන්ද කියලා. ඒවගේ නිළධාරීනුත් ඉන්නවා. හැබැයි අපි දකින දේ තමයි මේ වෙලාගේ ගරු සභාපතිතුමනි රජයක් විදිහට හරි අපි දිස්ත්‍රික් නායකයෝ විදිහට දේශපාලන අධිකාරිය විදිහට වැඩ සටහනක් කරන්න ඕනේ. නිළධාරීන්ට නෙමෙයි අපි දකිනවා ඉතිහාසයේ එහෙම තිබුණා. මේ ව්‍යවසනය ළංවෙන කොට අපි සියළු දෙනා එකතු වෙනවා. සාකච්ඡා කරනවා. ඒක තනි තනියෙන් නෙමෙයි.වෙන් වෙන්ව නෙමෙයි. ඒක පළාත නෙමෙයි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල නෙමෙයි. අපි ආයතන විදිහට ඒකාබද්ධ වෙලා දිස්ත්‍රික්කයක් විදිහට එතන ඒ වැඩ සටහන කළා. ඒක ශ්‍රීලංකාද, යූ.එන්.පී.ද, ජේ.වී.පී. ද නෙමෙයි. ව්‍යවසනයට පත් වෙච්චි මිනිස්සුන්ට ඒ අවශ්‍ය සහයෝගය ලබා දෙන්නට ඕනේ. ඒ නිසා අපි දැක්කා මේ වෙලාවේ තමන්ට පුළු පුළුවන් කට්ටිය ඒ ආකාරයෙන් දුවනවා. ඒවගේම කෑමරා ටික දාගන්නවා. එතනින් ගොඩට යනවා. දෙන්න පුළුවන් මේ සියළු ආධාර ලැබුණා. ලැබුණේ ලැබිය යුත්තා ගත යුත්තාම පමණි. අද වෙනතුරුත් නොලැබුණ ස්ථාන දෙකක් තියෙනවා. මේ කතා කරන මොහොතේත් මගේ කාර්යාලයේ සේවකයෙක්ගේ අද වෙන කොට තාම වතුර වීදුරුවක් ලැබිච්චි නැති තැනක් තියෙනවා. ඊයේ මම ප්‍රකාශ කළා හාන්දුකන්දේ. සමහරු මට විහිළු කලා. බොරු කියන්න එපා කිව්වා. එතන හිටිය දේශපාලන අධිකාරිය. එවලේම සාක්ෂි දෙක තුන සාක්ෂි තිබුණා. ඒ නිසා ප්‍රායෝගිකව තමුන්නාන්සේලා අපි හැමදාම මේ චක්‍රලේඛණ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල චක්‍රලේඛණ ක්‍රියාත්මක වෙන්න කලින් ක්‍රියාත්මක වෙච්චි තැන තමයි පළාත් සභාව. හැබැයි ඒ පළාත් සභාව ගැන වචනයක්වත් කතා කරන්නේ නෑ. පළාත් සභාව මතක නෑ. මම ස්තුතිවන්ත වෙනවා මේ පළාත් සභාවේ ඉඳලා ගිය විපක්ෂනායකතුමා පාර්ලිමේන්තුවේ ඒ.ඒ.විජේතුංග මැතිතුමා ඒ වෙලාවේ පළාත් සභාව ගැන කතා කරන කොට එතුමා පළාත් සභාවේ විශාල වැඩ කොටසක් කළා කියලා කටක් ඇරලා කිව්ව දේශපාලඥයා එච්චරයි. ඒ නිසා මේ වෙලාවේ එතුමාට

අපි පළාත් සභාවේ විදිහට ගෞරවයක් දෙනවා. ඒ නිසා අපිට අන පනත් දෙන්න ඉස්සෙල්ලා අපේ නිළධාරීන් ගැන කතා කරන්න ඕනේ තමුන්නාන්සේලාගේ හැමෝගේම එහෙමයි. ඉෆ්ලාර් මන්ත්‍රීතුමා ගත්තහම එතුමා අදහස ප්‍රකාශ කලා එතුමාගේ විදිහට. හැබැයි එතුමාට හදිසි හින්දා එතුමාගේ අදහස ක්‍රියාත්මක කරන්න බැරි වුණා. එතුමා කිව්වේ බඩු නොලැබෙන කතන්දරය නෙමෙයි. මුස්ළිම් ජනතාව මේ උපවාස කාල සීමාව. වියළි බඩු දුන්නට වැඩක් නෑ. ඒ මිනිස්සුන්ට අවශ්‍ය වෙන්නේ කැඳ ටික. ඒ මිනිස්සුන්ට අවශ්‍ය වෙන්නේ රට ඉදි ටික. ඒක අර ගන්න ඕන තැන හදලා දෙන්න ඕන ටිකක් තියෙනවා. එතුමා හදිස්සියේ කියාගෙන ගියහම ඒ මොකුත් හම්බ වුනේ නෑ කියලා නෑ නෙමෙයි එතුමා කිව්වා හම්බ වුණා. හම්බ වුණාට අපි කියන්නේ ඒ මිනිස්සුන්ට අවශ්‍ය දේවල ටික. බත් පාර්සල් පන්දාහ දහ දාහ ගහගෙන යනවා. ගහගෙන ගිහිල්ලා අවසානයේ අන්තිම බත් එක ගන්න මනුස්සයාගේ බත් එක කන්න බෑ. ඒ නිසා අපි පළාත් සභාවක් විදිහට ස්තූතිවන්ත වෙනවා රංජිත් බණ්ඩාර මැතිතුමා එතුමා මේ ප්‍රශ්නය කියපු වෙලාවේ ඉඳලා කිව්වේ ඕනම ග්‍රාම සේවක මහත්තයෙක්ගේ සහතිකය අරගෙන ඉන්න කඳවුරු ඕනම තැනක ඕනම විදිහකට කන්න දෙන්න ව්‍යවසනයට පත් වෙලා පීඩාවට පත් වෙලා ඉන්න ජනතාව වෙනුවෙන් කියලා. ඒවගේම තමයි එතුමාට ඒ ගෞරවය දෙන කොට ගරු සභාපතිතුමනි එතුමාගේ ලේකම්තුමියගේත් ගේ යට වෙලා. ඒ යට වෙලා හිටිය ලේකම්තුමිය තමන්ගේ ගෙදර ගැන බැලුවේ නෑ. අන්න නිළධාරීන්. තමන්ගේ ගෙවල් දොරවල් ගැන බැලුවේ නෑ. ඒවගේම අත්දැකීම් තියෙන ඒවගේ අත්විඳින්න තියෙන නිළධාරීන් ටික කැප වෙලා ඉන්නවා. අපෙන් සත පහක උදව්වක් අවශ්‍යතාවයක් ගත්තේ නෑ. සම්පත් අපි ගාව තියෙන්නේ. ප්‍රාදේශීය සභාවේ ගලි බවුසර් ටික. ඒවගේම මේ වැඩ සටහන් ටික. අපි කාලාන්තරයක් තිස්සේ මේ පක්ෂ විපක්ෂ එකතු වෙලා වැඩ පිළිවෙලක් කළා සබරගමුවේ. ඒක කෑගල්ලද රත්නපුර දිස්ත්‍රික්කයද නෙමෙයි. සිංහලද,මුස්ලිම්ද,දෙමළද නෙමෙයි. කෑගල්ලේ,රත්නපුර ඒ ව්‍යවසනයට පත් වෙච්චි ජනතාව නිතරම හැම වෙලාවේම පළාත් සභාවක් හැටියට ඒ කාර්යය භාරය කළා. විශාල හයියක් ප්‍රධාන අමාත්‍යතුමා හැමදාම. ඒවගේම අපේ ආණ්ඩුකාරතතුමා ඒ වැඩ පිළිවෙල සකස් කළා. අපි කැඳවලා හැබැයි අපි එතනින් එහාට දැක්කේ නෑ. ඒ නිසා හුදකලාවේ ගිය ගමන් මගේ අපේ මිනිස්සුන්ට තමයි පීඩාව දැනුණේ. ඒ නිසා ගරු සභාපතිතුමනි අපි නැවත වතාවක් ඔබතුමාට කියනවා අපි පළාත් සභාවක් විදිහට අපි අපේ අනන්‍යතාවය. අපේ අවශ්‍යතාවය අපේ නිළධාරීන්ගේ වගකීම අවශ්‍යතාවය භාර ගන්න කවුරුත් සූදානම් නැත්නම් පළාත් සභාවක් විදිහට අපිට එදා ඉඳලා කරන්න පුළුවන් හයිය ඒ තිබිච්චි වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරන්න අපි කටයුතු කරමු කියන පනිවිඩය තමයි මේ වෙලාවේ දෙන්නේ. රත්නපුරේ ජනතාව කෑගල්ල ජනතාව වෙනුවෙන්. ඒ නිසා මම නිළධාරීන් දොස් කියන්නේ නෑ. මොකද පළවෙනි දවස් දෙකේ මේ හැමෝටම යන්න බෑ. නිළධාරියාගේ ගෙදරටත් යට වෙලා. බලධාරියාගේ ගෙදරටත් යට වෙලා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට දොස් කියනවා. යන්න විදිහක් නෑ. හැබැයි පුළුවන් වෙලාවේදී හැමෝම ගමට ගියා. හැම දේශපාලන පක්ෂයක්ම තමන්ගේ කාර්යය භාරය කළා. ඒ නිසා දැන් තියෙන්නේ වැඩ පිළිවෙල සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා කිව්වා වගේ ගරු සභාපතිතුමා ඔබතුමාත් නියෝජනය කරන අපේ ආසනයේ දැනට අවුරුදු එක හමාරයි.

වේවැල්වත්තේ ගෙවල් අපි ගරු සභාපතිතුමනි ඒ සියළු දෙනාට ලබා දුන්නා මම ඉඩම් ටික . හැබැයි ඒ ඉඩම් ටික ආපහු වෙනස් කළා. වෙනස් කරලා ගෙවල් හයකට දුන්නා. මැද ගෙදරට දුන්නේ නෑ. නාය යනවා. ආයේ ඒ ගෙදර වතුර බුබුල මතු වෙලා. ඒක තමයි දැන් තියෙන වැඩ පිළිවෙල. ඒ නිසා අපි මේවා ගැන කණගාටු වෙනවා. ඒ නිසා මේ වෙලාවේ ඔබතුමා සභාව විදිහට යෝජනා කරනවා අන්න අර අවුරුද්දකට කලින් පිට්ටනිය මැදින් ගලාගෙන ගිහිල්ලා වටේට ගෙවල් 11 දීලා මැද ගෙදර විතරක් ඉතුරු කරලා තියෙනවා නාය යන්නේ නෑ කියලා. යන්නේ නෑ කියපු ගෙදර දැන් වටේම ගෙවල්. දැන් වතුර බුබුල මතු වෙලා තියෙනවා. මේවා තමයි වැඩ පිළිවෙලවල්. මේ නිසා මේවාටත් පළාත් සභාවක් විදිහට අපි කටයුතු කරමුයි කියන පනිවිඩය ලබා දෙමින් මිය ගිය සියළු දෙනාට අපිට ශෝකය තමයි පළ කරන්න වෙන්නේ පවුලේ ඥාතීන්ට . මුළු පවුලම වැලලුණා. දරු පැටව් වැලලුණා. ඒ සියළු දෙනාට දේපළ වැලලිච්චි ඒ සියළු දෙනාට අපිට පළාත් සභාවක් විදිහට කරන්න පුළුවන් කාර්යය භාරයක් ඔබතුමාලා පෞද්ගලිකව දන්නවා කරන කාර්යය භාරය අපි පළාත් සභාවක් විදිහට එකතු වෙලා ඔවුන්ට ශක්තියක් දෙමුයි කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ගරු පළාත් මාර්ග අමාත්‍ය අතුල කුමාර රාහුබද්ධ මැතිතුමනි. මීළඟට කේ.එල්.රත්නායක ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක*
*கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக* *Hon.Member K.L.Ratnayake* ----------
--------------------------------------

ගරු සභාපතිතුමනි මගේ හිතේ රත්නපුර දිස්ත්‍රික්කයට අපි දන්න කාලයේ ආපු ලොකුම ව්‍යවසනය. ප්‍රථමයෙන්ම ඇහැලියගොඩ විශාල ප්‍රමාණයක් ජීවිත හානි වුණා. 28 ක් ජීවිත හානි වුණා. 2 ක් අතුරුදහන් වෙලා. ඒවගේම රත්නපුර දිස්ත්‍රික්කයේත් කෑගල්ල දිස්ත්‍රික්කයේත් ජීවිත හානි විශාල ප්‍රමාණයක් තියෙනවා. ඒ අය වෙනුවෙන් ශෝකය තමයි අපිට එල කරන්න වෙන්නේ. ඇහැලියගොඩ මිය ගිය සංඛ්‍යාව 28 යි. හැබැයි මම එක මළ ගෙදරකටවත් ගියේ නෑ. මැරිච්ච අය බලන්න ගිහිල්ලා වැඩක් නෑ ගරු සභාපතිතුමා. නාය ගිය තැනට ගිහිල්ලා නාය බලලාත් වැඩක් නෑ, හැබැයි ජීවත් වෙලා ඉන්න මිනිස්සු ටික ගිහිල්ලා ඒ අය ජීවත් කරවන්න වැඩ පිළිවෙලක් තමයි මේ තියෙන්න ඕනේ. හැබැයි ඒක කරන කොට යම් යම් උදවියගේ අදහස් තියෙනවා මේක මේ යහපාලන ආණ්ඩුව හින්දා ඇති වෙච්චි ව්‍යවසනයක් කියලා. ඒක ඕන මිනිහෙකුට අර්ථකතනය කරන්න හැකියාව තියෙනවා. එදා අපි සුනාම එන කොට කිව්වේ නෑ මේක මහින්ද මහත්තයාගේ ආණ්ඩුව තියෙන කොට වුණ කියලා. මේවා ස්වභාවික විපත් එන කොට ආණ්ඩු පළි නෑ. හැබැයි මේවාට වැඩ පිළිවෙලක් තියෙන්න ඕනේ. අද පළාත් සභාවේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට අද ආණ්ඩු පක්ෂයේ නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මම කණගාටු වෙනවා. ඊයේ ඇවිල්ලා ජනාධිපතිතුමා එනවා. ඇවිල්ලා එතන බොරු කියනවා. අතුල කුමාර රාහුබද්ධ ඇමතිතුමා කියපු කාරණාව තමයි මට කියන්න

තියෙන්නේ. මට කවුරුවත් නිළධාරීන් ආරක්ෂා කරලා වැඩක් නෑ. ගෙදර ගිහිල්ලා බුදිකරවා ගන්න නෙමෙයි. කන්න නැති නම් එතෙන්ට ගිහිල්ලා දෙන්න ඕනේ. ඒක කරන්නේ නෑ. ගරු සභාපතිතුමා ඔබතුමා දන්නවා මීගස්වෙල වහල මට්ටමට වතුර. දැන් වතුර හිදිලා. ඊයේ මම මෙතන ඉඳලා යන කොට ගෙවල් ටික බලාගෙන ගියා. ඒ මිනිස්සුන්ට උයාගෙන කන්න බෑ ගරු සභාපතිතුමා. ප්‍රාදේශීය ලේකම්තුමාට කිව්වහම කියනවා ගෙවල්වලට ගිය අයට හිටිය මිනිස්සුන්ට පිසූ ආහාර දෙන්න බෑ කියලා. අර මෙතුමා කියාපු කාරණාව ඇත්ත. චක්‍රලේඛණ වලට යට වෙලා හරියන්නේ නෑ දැන්. ඒ මිනිස්සුන්ට පිසූ ආහාර දෙන්නේ නැතුව වියළි සලාක දීලා කොහොමද උයාගෙන කන්නේ ගරු ඇමතිතුමා. අපි කියන්නේ මේ චක්‍ර ලේඛණ වලින් අයින් වෙලා ඒ මිනිස්සුන්ට යතා තත්ත්වයට පත් වෙනකන් පිසූ ආහාර ලබා දෙන්න කියලා. හාල් කිලෝ පහයි,පොලුයි,සැමනුයි මේ වෙලාවේ දුන්න කියමුකෝ කොහේද උයාගෙන කන්නේ. වහලය උඩ ඉඳලද උයාගෙන කන්නේ. මිනිස්සු අසරණ වෙලා ඉන්නේ. මේක යූ.ඇන්.පී. ශ්‍රීලංකාද නෙමෙයි. කඳවුරුවල ඔක්කෝම ඉන්නවා. මේ දරු පැටව් ඉන්නවා. මේ ටික බලන්න ඕනේ. ඒක කෙරෙන්නේ නැනේ. දැන් අයගම ගත්තහම මම හිටපු සභාපතිතුමාට ස්තූතිවන්ත වෙනවා. අයගම ප්‍රාදේශිය සභාව කඩලා ඒකේ ජේ.සී.බී. එකේ යතුරු අරගෙන පාරවල් ශුද්ධ කළා. ඇත්තටම අපි ස්තූතිවන්ත වෙන්නට ඕනේ. ස්තූතිය පුද කරන්නට ඕනේ. අයගම දවස එක හමාරකට පස්සේ ඇවිල්ලා ප්‍රාදේශීය ලේකම් ආවේ. එතකොට මොකක්ද කරන්නේ. අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බඩු තියෙනවා. බඩු ටික බෙදන්නේ නෑ. අත්‍යාවශ්‍යයි වතුර ටික වතුර ටික බෙදන්නේ නෑ. අර ගවරගිරියේ ඉන්දල කියන ප්‍රදේශයේ නාය ගිහිල්ලා. ග්‍රාම සේවකයේ උපදෙස් පරිදි නාය හරහා මිනිස්සු එනවා එහාට මෙහාට. ඕන් තත්ත්වය . එතකොට අවධානම්. කට්ටියක් නාය ගිහිල්ලා. තව යනවා කියන කොට ග්‍රාම සේවක මහත්තයාගේ උපදෙස් පරිදි එහාට මෙහාට යනවා. මිනිසසු අරන් යනවා. එතකොට හාන්දුකන්දේ ගමේ මිනිස්සු පිරිසක් ඉන්නවා එතනින් අයින් වෙන්නේ නෑ ගරු ඇමතිතුමා. ඒගොල්ලෝ කියනවා අපි අවුරුදු ගාණක් හිටියා මේ ගමේ මෙතන නාය යන්නේ නෑ කියලා. මම පණිවිඩය ඇරියා නාය යන කොට කෝල් එකක් දෙයි එතකොට අයින් වෙන්න කියලා. ඕකනේ කියන්න වෙන්නේ. බලධාරීන් ඉන්නවා නිළධාරීන් ඉන්නවා. අඩුම ගානේ පොලීසිය ගිහිල්ලා අයින් කරන්න බැරි. මැරුණාට පස්සේ අපිට පරීක්ෂණ කරලා වැඩක් නෑ. ඒ නිසා මෙතන බරපතල වගකීමක් තියෙනවා. මම කණගාටු වෙනවා රජය පිළිබඳව . එහෙම නැතුව අපි හදපු ආණ්ඩුව අපේ ජනාධිපතිතුමා කියලා ඉවර වෙලා සංතෝස වෙන්න පුළුවන්කමක් අපිට තියෙන්න ඕනේ. අපි මේ මිනිස්සු වෙනුවෙන් කතා කරන්නේ. එතකොට මේ රජය අපහසුතාවයට පත් වෙන්නේ. කියන දේ කරන්නේ නැත්නම් කාටද අපි මේ කියන්නේ. දැන් මේ ගරු සභාපතිතුමාට කිව්වට තනියෙන් කරන්න පුළුවන්ද. අපි පළාත් සභාවක්. පළාත් මාර්ග ඇමතිතුමාට පාරවල් ටික ශුද්ධ කරන්න කිව්වහම කරන්න පුළුවන්ද. ඇමතිතුමාට කෑම ටික දෙන්න වියළි සලාක ටික දෙන්න කිව්වට කරන්න පුළුවන්ද. වැඩ පිළිවෙලක් සහ නායකත්වයක් ඕනේ. දිස්ත්‍රික් ලේකම්තුමිය එන කොට පහුවදාද කොහේද. එතකොට අවුරුද්දකට සැරයක් රත්නපුරේ යට වෙනවා. මේ රත්නපුර යට වෙන්නේ ගංවතුරට. එතකොට ඒකට වැඩ පිළිවෙලක් අපි ජනවාරි මාසයේ හදා ගන්න ඕනේ. කිරිඇල්ලට බෝට්ටු තුනක් හම්බ වෙලා තියෙනවා. ඔරු අඟුල් දෙකක් තියෙනවා.

එකක යනවා කසිප්පු බොන්න. ඕන ඕන විදිහට යනවා කළමණාකරනයක් නෑ. මම යනවා පොහොරබාවට. සලිත මන්ත්‍රීතුමා ඔරු අඟුල් හතරක් තියෙනවා ගරු ඇමතිතුමා අමාත්‍යාංශය යටතේ දිපුවා වෙන්නට ඇති. දෙකක බජව් දදා කට්ටිය ඔරු පදිනවා. ඒකද මේ වෙලාවේ කරන්න ඕනේ. මම යනවා යටිපව්වට ගරු ඇමතිතුමා වෙච්චි දවසට පහුවදා ඔරු නෑ මෙතෙක් ගිහිල්ලා තමයි කෑම බෙදුවේ. රෑ නවයයි. එක ඔරුවට බජව් දාගෙන බීලා බජව් දාගෙන යනවා. එක වෙලාවක හිතෙනවා අපි මේ මේ විදිහට ඉපදිලා හිටිය එකත් ලොකු වරදක් බවට. මෙන්න මේවගේ තත්ත්වයක් තියෙන්නේ. මේවාට වැඩ පිළිවෙලක් අවශ්‍යයි. මං දන්නේ නෑ මට නම් කතා කරන්න මිනිහෙක් නෑ. සමහරවිට මම මේවා කියන කොට සමහරවිට මාව මන්ත්‍රී ධූරයෙන් අයින් කරලා දායිද දන්නේ නෑ. කමක් නෑ. විෂයභාර නියෝජ්‍ය ඇමතිතුමා ඊයේ රැස්වීමේ නෑ. මම දන්නේ නෑ මොකක්ද කාරණාව කියලා. ඒ නිසා ගරු සභාපතිතුමනි මට දේශපාලනයක් වැඩකුත් නෑ. කොයි ආණ්ඩුව තිබුණත් හරියට නිවැරදිව වැඩ කරන්න ඕනේ. මහින්ද රාජපක්ෂ මහත්තයා පරදියි කියලා කවුද හිතුවේ. ඒ වැඩ පිළිවෙල අවුල් වෙච්චි හින්දා. මේක පරදින එක අහන්න දෙයක්ද මේ විදිහට ගියොත් එහෙම. ඒ නිසා මේකෙන් බේරෙන්න නෙමෙයි මම කතා කරන්නේ. මට දැන් අයින් කළත් මට කමක් නෑ. මට සම්බෝලයි බතුයි කාලා ගෙදර හිටිය හැකියි. හරි දුකයි. දැන් ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හාල් ටික තියෙනවා වතුර ටික තියෙනවා. අර දඹුල්ලේ හය මාසයකටවත් පාර ක්ලිය කරන්න බෑ ගේට්ටුකඩේ. ප්‍රාදේශීය සභාවේ හිටපු විපක්ෂනායකගේත් ගේත් ගිහිල්ලා. කෑම ටික නෑ ඊයේ සවස. ගරු ඇමතිතුමා ඔබතුමාත් හිටපු මහ ඇමතිවරයෙක්. මම කියන්නේ පිසූ ආහාර ටික දෙන්න බැරි නම් වැඩක් නෑ. රු.225 /- ක් වෙන් කරනවා රජයෙන් එක මිනිහෙකුට තුන් වේලක් කන්න. බිත්තරයක් සැමන් සම්බෝලයක් දාලා වේලෙන්න පරිප්පු ටිකක් දාලා රු.50/- කට කෑම එකක් දෙන්න පුළුවන්. ඕනේ නම් යෝගට් එකකුත් දිය හැකියි. අද යෝගට් නෙමෙයි මිනිස්සුන්ට ඕනේ බට පිරෙන්න මොනවා හරි කන්න. ඒක වෙන්නේ නෑ. රු.600/- ඉඳලා රු.1500/- දක්වා වියළි සලාක දෙන්න පුළුවන් නේද ගරු ඇමතිතුමා. ඒක වෙන්නේ නෑ. පොහොරබාවේ දැන් මෙතුමා කිව්වා අපේ රංජිත් බණ්ඩාර ඇමතිතුමාගේ ලේකම්තුමියගේ ගේ යට වෙලා ඒත් එතුමිය ඇවිල්ලා වැඩ කරනවා කියලා. ඒවාට ස්තූති කරනවා. පොහොරබාවට යනවා ග්‍රාම සේවක රාළහාමි නෑ. ගේ හොඳනවලු. එතකොට රජයෙන් පඩි ගන්න නිළධාරියෙක් හැටියට ගේ හොදන වැඩේට මහත්තයා නැද්ද ගෙදර. ඥාතියෙක් නැද්ද ගෙදර. ගිහිල්ලා වසමට ගිහිල්ලා බලන්න බැරිද? පෙළක් නිළධාරීන් කියයි අරයා මෙහෙම කිව්වා. ඊයේ කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම්තුමිය මාත් එක්ක ඔරොප්පු වුණා. ඇත්ත කිව්වේ. ඉඹංගොඩ නගරයේ ලයිට් දෙන්න විදුලි අධිකාරීතුමා කතා කරනවා ඔරුවක් දෙන්න කියලා. ඔරුවක් නෑ කිව්වා. හත්වලාමේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටත් ටවුම් එකටයි විදුලිය තිබුණා නම් අර කඩවල් ටිකේ මිනිස්සු ටිකවත් කඩ ඇරලා ඉවර වෙලා ඒකේ බඩු ටික අරන් කන්න දෙන්න තිබුණානේ. ඉතිං මම කියන්නේ ගරු සභාපතිතුමනි සුදුසු පුද්ගලයා ඔබතුමා දැන් සභාපති පුටුවේ ඉන්නවානේ. දැන් ඇමති පුත්තු පත් වෙලා ඉන්නේ වැඩ කරන්න පුළුවන් නිසානේ. දැන් ඔය පුටුවේ වෙන කවුරුවත් හරි වාඩි කළොත් සභාපතිකම කරන්න පුළුවන්ද. දැන් සභා ලේකම්තුමිය වෙනුවට ඔය

පුටුවේ මාව වාඩි කළොත් ඕක කරන්න පුළුවන්ද. පොලීසියේ ඕ.අයි.සී. මහත්තයා හැටියට මාව පුටුවේ වාඩි කළොත් කරන්න පුළුවන්ද. නොදන්න සෞඛ්‍ය ඇමතිකම මට දුන්නොත් කරන්න පුළුන්ද. එහෙම නම් මේක දැන දැන මග හරිනවා නම් ඒක හොඳ ක්‍රමවේදයක්ද. ඒ නිසා ගරු සභාපතිතුමනි මම ඉවර කරනවා මම කියන්නේ දිස්ත්‍රික් ලේකම්තුමිය හරහා හරි මේකේ ඉන්න ඇමතිවරු හරහා හරි දැන් භාණු ඇමතිතුමා ඔබතුමා දැන් උදව් කරන ඇමතිවරයානේ. ඔබතුමා මේකට මැදිහත් වෙලා කියන්න මේක ලොකු ලොකු මිනිස්සුන්ට කතා කරන්න ගියොත එහෙම ලොකු ලොකු මිනිස්සුන්ට කොයි පැත්තෙන් හරි මොනවා හරි වෙනවා. ඒ නිසා මම කියන්නේ ඔයගොල්ලෝ මැදිහත් වෙන්න. රාජ්‍ය පරිපාලනයේ ඉහළ නිළධාරීන් ටික හසුරුවන්න. හසුරුවන්න වැඩ පිළිවෙලක් සකස් කරන්න කියන්න. මම නම් කියන්න යන්නේ නෑ කියන්න ගියොත් අර අතුල ඇමතිතුමා ඊයේ කිව්වා වාගේ කියන්න වෙන්නේ. ඒ නිසා දැන් ගරු සභාපතිතුමා මේකත් කියන්න වෙනවා. එන්.බී.ආර්.ඕ. එකේ ඉන්නේ දිස්ත්‍රික්කයටම දෙන්නයි. ජනාධිපතිතුමා ඊයේ දෙපාරක් කිව්වා. කණ්ඩායම් හතක් එවනවා කිව්වා තවම නම් ආවේ නෑ. ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තියෙනවා 24 පොළක් බලන්න. ඒ සියළුම දෙනා කඳවුරුවල ඉන්නේ. දැන් දවස් කීයක් ගියාද. ලංකාවේ හැම තැනම ගංවතුර තියේද. නාය යනවාද නෑ. එහෙම නම් දිස්ත්‍රික්කවල ඉන්න නිළධාරීන් හරි ගෙනල්ලා මේක බලන්න බැරිද අතුල ඇමතිතුමා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------------

අපි අවසන් කරමු ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක*
*கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக Hon.Member K.L.Ratnayake*
---------------------------------------------------

ඒ නිසා මම කියන්නේ මේ වැඩ පිළිවෙල විධිමත් වැඩ පිළිවෙලක් කරන්න කියන කාරණාව මතක් කරමින් මම කණගාටු වෙනවා ඒ ක්‍රමවේදය නැති නිසා ගරු සභාපතිතුමනි. එය මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------------

ස්තූතියි ගරු කේ.එල්.රත්නායක මන්ත්‍රීතුමාට. මීළඟට ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.

*ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.*
*கௌரவ ஆ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன*
*Hon.Gov.Whip Asoka Jayawardane*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි පසුගිය දිනවල ඇති වෙච්චි ස්වභාවික විපත් නිසා ගංවතුරත් නාය යෑමත් නිසා විපතට පත් ජනතාව විශාල වශයෙන් දුක් පීඩාවට පත් වෙලා සිටිනවා. බොහෝ දෙනෙකුගේ ජීවිත හානි වෙලා තිබෙනවා. මේ ජීවිත හානි වෙච්චි අයට පිළිබඳවත් ඒවගේම අසහනයට පත් වෙලා සිටින ජනතාව වෙනුවෙනුත් මම පළමුවෙන්ම අපගේ අතිශය ශෝකය ප්‍රකාශ කර සිටිනවා.

ගරු සභාපතිතුමනි මේක ස්වභාවික විපතක්. ඇත්තටම පසුගිය කාලයට වඩා මේ කාලය වෙන කොට ස්වභාවික විපත් වැඩි වෙලා තිබෙනවා. ඒකට හේතු වෙලා තිබෙන්නේ හුඟක් ස්වභාවික හේතූන් සහ මිනිසා විසින් ඇති කර ගත්තු හේතු නිසා මොකද අපි දැක්කා සමහර ගංවතුර ප්‍රදේශවල අනවසර ඉදිකිරීම් ඉවත් කරනවා අපි දැක්කා. අපිට පුළුවන්කම තිබුණා නම් අනවසර ඉදිකිරීම් මීට පෙර ඉවත් කරන්නට . අපි දන්නවා මේ විපත් අවම කර ගැනීමට අවස්ථාව තිබුණා. ස්වභාවික විපත් සම්පූර්ණයෙන්ම නතර කර ගැනීමට අපහසුයි. ස්වභාවික විපත් අවම කර ගැනීමත් ඒවා සිදු වුණාට පස්සේ කළමණාකරනය කර ගැනීමත් ක්‍රමානුකූලව සිදු වෙනවා නම් ඒවෙන් සිදු වෙන හානිය අපිට අඩු කර ගන්න පුළුවන් වෙනවා. අවම කර ගන්න පුළුවන් වෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි මේ සඳහා සකස් කරලා තියෙන වැඩ පිළිවෙලවල් අපි නියමානුකූලව කටයුතු කරනවා නම් එයින් අපිට හුඟක් දුරට මිදෙන්න පුළුවන්. ස්වභාවික විපත් අවම කිරීම සහ කළමණාකරනය කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කරන්නට කියලා නිළධාරීන් දැනුවත් කරන්නට කියලා දේශපාලඥයින් දැනුවත් කරන්නට කියලා අපි මේ සභාවේ බොහෝ අවස්ථාවල කතා කරලා තියෙනවා කියලා තියෙනවා. ඒ නිසා අපිට මේවගේ අවස්ථාවකදී ඒවා හරි හැටි ඉටු නොවී ජනතාවගේ නොදැනුවත්කම නිසාත් ඒවගේම නිළධාරීන් නිසි පරිදි පුහුණු නොකර තිබීම නිසාත් දේශපාලඥයින් නිසි පරිදි දැනුවත් කර නොතිබීම නිසාත් මේ කාරණාවලදී අපිට කණගාටුදායක ලෙස අපිට ශෝකය ප්‍රකාශ කරන්නත් වැඩියෙන් කණගාටු වෙන්නත් සිද්ධ වෙලා තියෙන එක ඇත්ත. මේ අවස්ථාවේදී රාජ්‍ය නිළධාරීන්ට විරුද්ධවත් දේශපාලඥයින්ට විරුද්ධවත් අපි කතා කිරීම ඇත්තටම මේ අවස්ථාවේදී මං හිතනවා අපි අඩුපාඩුකම් ගැන කතා කිරීම හොඳයි. නමුත් අපි ඒවාට ලබා දී තිබෙන පහසුකම් පිළිබඳව ඒ පහසුකම් නිසි අයුරින් සිද්ධ වෙනවාද ඒ පුහුණුවීම් ඒ අයට නිසි පරිදි ලබාදී තිබෙනවාද මේවගේ අවස්ථාවලදී කටයුතු කරන්නේ මොන ආකාරයෙන්ද කියන එක දැනුවත් කරලා තියෙනවාද කියන එක පිළිබඳවත් අපි අපේ අවධානය යොමු කරන්න ඕනේ ගරු සභාපතිතුමනි. මම සඳහන් කරන්නට ඕනේ මේ සිදු වෙච්චි සිදුවීම් වලින් අඩු වශයෙන් අපිට 30% ක් 40 % ක්වත් අඩු කර ගන්න තිබුණා නිසි පුහුණුවීම් දීලා නිසි දැනුවත් කිරීමක් කරලා ජනතාව දැනුවත් කරලා. ඒවගේම ජනතාව ඒ අවවාද වලට ඇහුන්කන් දෙන්නට පුහුණු කරලා තිබුණා නම් මේ විපත් වලින් රාශියක් අපිට අඩු කර ගන්න තිබුණා. නමුත් අපිට එහෙම කරන්න පුළුවන්කම ලැබුණේ නැත්තේ ජනතාව ඒකට පුහුණු වෙලා තිබුණේ නෑ. ජනතාව නිළධාරීන්ගේ අවවාද පිළිගන්නට පුහුණු

වෙලා තිබුණේ නෑ. ඒවගේම නිළධාරීන්ටත් ඒ තත්ත්වය ලබාදීලා නෑ. දේශපාලඥයින්ගේ මැදිහත්වීමද සමහර වෙලාවට සමහර නිළධාරීන් කියන්නට පුළුවන් දේශපාලඥයින්ගේ මැදිහත්වීම නිසා ඒ කරුණු ඉටු කර ගන්නට බැරි වුණා කියලා. දේශපාලඥයින් කියනවා නිළධාරීන්ගේ අඩුපාඩුම් නිසා මේවා සිද්ධ වුණා කියලා. ඇත්ත වශයෙන්ම මේ සියල්ල අවම කර ගන්නට දේශපාලඥයිනුත් නිළධාරීනුත් එකට එකතු වෙලා පුහුණු වැඩ පිළිවෙලක් මේවගේ කටයුතු වලට අවශ්‍යයි කියන එක මම සඳහන් කරන්නට ඕනේ. ඒ නිසා ගරු සභාපතිතුමනි මම දීර්ඝව කතා කරන්න මම බලාපොරොත්තු වෙන්නේ නෑ. ඔබතුමා මේ කාරණාවට අවස්ථාව ලබාදීම ඉතා වැදගත්. නමුත් මම ඔබතුමාගෙන් එක ඉල්ලීමක් කරනවා මේ කාරණාව ගැන අපි සාකච්ඡා කරන්නට සභාව වශයෙන් සාකච්ඡා කරන්නට සිද්ධ වෙච්චි අඩුපාඩුකම් ගැන කතා කරන්නට නිළධාරින්ගෙන් සහ දේශපාලඥයින්ගෙන් සිදු වෙච්චි අඩුපාඩුකම් ගැන කතා කරන්නට අපිට අවස්ථාවක් වෙන අවස්ථාවක් අපිට ලබාදීලා අපිට වැඩිපුර කතා කිරීමට වෙලාවක් ලබා දෙන්න කියලා මම සඳහන් කරනවා.

ඒවගේම අද සිදු වෙලා තියෙන විශේෂයෙන් අපේ දිස්ත්‍රික්කය ගැන කතා කරන කොට අපේ දිස්ත්‍රික්කයට සිදු වෙලා තියෙන හානිය පිළිබඳව කටයුතු කරන කොට මම කියන්න කැමතියි සබරගමු සංවර්ධන අමාත්‍යවරයෙක් අලුතින් පත් කරලා තියෙනවා. විෂය භාර දීලා තියෙනවා. එතුමාට විශාල වශයෙන් මධ්‍යම රජයෙන් මුදලක් වෙන් කරලා මේ සිද්ධ වෙච්චි හානිය අවම කර ගන්නට එක් කරන්නට අවස්ථාව ලබාදීලා සංවර්ධනයක් ඇති කරන්නට කටයුතු කලොත් ඇති වෙලා තියෙන හානිය නැති කර ගන්නට පුළුවන් කියලා රජය දැනුවත් කරන එක හොඳයි කියලා මම සඳහන් කරන්නට කැමතියි. ඒවගේම ඊයේ ජනාධිපතිතුමා ඇවිල්ලා සාකච්ඡා කරලා දේශපාලඥයින් දැනුවත් කරලා අපේ නිළධාරීන් දැනුවත් කරලා කටයුතු කළා. අපි ඒ ගැන අපේ ජනාධිපතිතුමාට අපේ ප්‍රශංසාව ස්තූතිය පළ කරන්නට අවස්ථාවක් කර ගන්නවා මේ වගේ අවස්ථාවක ඇත්ත වශයෙන්ම එතුමා ආරාධනා කළා ජනතාවගෙන් , දේශපාලඥයින්ගෙන්, නිළධාරීන්ගෙන් කරන්න තියෙන දේවල් එතුමාට දන්වන්න කියලා. අපිට පුළුවන් වුණා ඒ අවස්ථාවේදීම සමහර ඒවා දන්වන්නට. නමුත් පසුව හෝ දන්වන්නට අපි නැවතත් සඳහන් කරන්නට අපේ ස්තූතිය ජනාධිපතිතුමාටත් සම්බන්ධීකරණය කරපු සියළු දෙනාටත් අපේ ස්තූතිය පුද කරමින් නැවත වරක් මේ විපත නිසා හානියට පත් වෙච්ච ඒවගේම ජීවිත හානි වෙච්ච සියළු දෙනා වෙනුවෙන් අපේ අතිශය ශෝකය ප්‍රකාශ කරමින් මම මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තූතියි ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමාට. මීළඟට අජිත් කුමාර මැද්දෙගම ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***

***கௌரவ உறுப்பினர் அஜித் குமார***

*Hon.Member Ajith Kumara Meddegama*

----------------------------------------------------------

ගරු සභාපතිතුමනි විශේෂයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා අද සභාවේ වැඩ කටයුතු නවතා මේ සම්බන්ධව කතා කරන්න අවස්ථාවක් ලබාදීම ගැන. ඇත්තටම දිස්ත්‍රික්ක අටකට විශාල වශයෙන් බලපාපු අයහපත් කාලගුණ තත්ත්වය සහ හේතු කොට ගෙන දැනට මරණ 160 ක් විතර සිදු වෙලා. රත්නපුර දිස්ත්‍රික්කයේ විතරක් මරණ 77ක් ජීවිතක්ෂයට පත් වෙලා තියෙනවා. ඒවගේම අතුරුදහන් වෙලා තියෙනවා ලංකාවේම 110 ක්. රත්නපුර දිස්ත්‍රික්කයේ 33 ක්. බොහෝදුරට ඒ 33 දෙනාත් ජීවතුන් අතර ඉන්නවාද නැද්ද කියන එක ගැනත් අපිට කියන්නට අපහසුයි. ඇත්ත වශයෙන්ම ගරු සභාපතිතුමනි නාය යෑමට ගංවතුර අපිට වෙච්චි ව්‍යවසනයට අපි පෙර සූදානමක් වෙන්නට තිබුණා. අපිට ඒ පෙර සූදානම පේන්න තිබුණේ නෑ. අපි දන්නවා ඉතිහාසයේ බැලුවහම වසර 15 ක් විතර යන කොට රත්නපුර දිස්ත්‍රික්කයට සහ අනිත් පළාත් වලට ලොකු ගංවතුරක් ,නාය යෑමක් හරි ව්‍යවසනයක් ඇති වෙනවා. ඒවගේම රත්නපුරේ ජනතාව සෑම අවුරුද්දේම සිංහල අවුරුද්ද ඉවර වෙලා දින 45 ක් 50 ක් යන කොට ලොකු ගංවතුරක් එයි කියලා බලාපොරොත්තුවක් තියෙනවා. හැබැයි ජනතාව බලාපොරොත්තුවෙන් ඉන්නවා මේ දේට මුහුණ දෙන්න අනිත් අය සූදානමින් හිටියාද කියන එක ගැන ගැටළුවක් තියෙනවා. මෙහෙම දෙයක් ඇති වුණොත් කොහොමද අපි ඒකට මුහුණ දෙන්නේ. එහෙම මුහුණ දෙන්න විදිහක් අපි ළඟ තිබුණා නම් අර අසෝක ජයවර්ධන මැතිතුමා කිව්වා වගේ අපිට මේ විනාශය 40% ක් විතර අඩු කර ගන්නට තිබුණා. හැබැයි අද මොකද වෙලා තියෙන්නේ අද අපිට නාය යෑම නිසා ඇති වෙච්චි විනාශය තියෙනවා. නාය යෑමෙන් පස්සේ ගවතුරෙන් පස්සේ මිනිසුන්ගේ ජන ජීවිතය ආරක්ෂා කර ගන්න යහපත් කර ගන්න වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර ගන්න තිබෙනවා. අපිට ගමනාගමනය කර ගන්න බැරි තැන් ඒ පහසුකම් දෙන්න බැරි තැන් තියෙනවා. ඉක්මනින් ඒ තැන්වලට ගිහිල්ලා පහසුකම් ලබලා දෙන්න කියලා ප්‍රශ්නය තිබෙනවා. ඒ තත්ත්වය යටතේ දැන් කරදරෙන් මිදිච්චි කට්ටිය තමන්ට පෞද්ගලිකව ඇති වෙච්චි ව්‍යවසනය කොහොමද කියලා සැලසුම්සහගතව මුහුණ දෙන්න තිබුණා. හැබැයි එයින් පස්සේ මේ නාය යෑම් ගංවතුර ඒ අවශ්‍ය කරන පිළියම් ටික සකස් කරලා එයින් මිදුණාට පස්සේ ඊළඟට ජන ජීවිතය යහපත් කර ගන්න මොන වගේ සැලැස්මක් කර ගන්න ඕනේද කියලා අපිට බලන්න කාරණාවක් තියෙනවා. අපිට අද පේන්නේ නෑ ඒ දේට මුහුණ දෙන විදිහේ වැඩ පිළිවෙලක් තියෙනවාද කියලා. මම අද රංජිත් බණ්ඩාර අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ ඉන්න කොටත් එතනට කතා කළා පුද්ගලයෙක් කතා කරලා කිව්වා අපිට මොකුත් සහනයක් ලැබුණේ නෑ අපි අහවල් තැන 200 ගාණක් ඉන්නවා එක පන්සලක,ඉස්කෝලයක. මේ දෙසිය ගාණටම කන්න බොන්න විදිහක් නෑ. එතුමා ග්‍රාම සේවක මහත්තයාට කතා කරලා කිව්වා අවශ්‍ය කරන පහසුකම් ටික ඔක්කෝම දෙන්න සමූපකාරයෙන් අරගෙන අවශ්‍ය කරන බිල් ටික මට ඉදිරිපත් කරන්න මම ඒ බිල් ගෙවන්න අවශ්‍ය කටයුතු කරනවා කියලා. ඒ තොරතුරු ටිකවත් අපිට ලැබෙනවාද. තොරතුරු ටිකවත් හරියට ගලාගෙන එනවාද ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට. එහෙම නැත්නම් මෙවැනි සහනයක්

පළාත් සභාවෙන් කරනවා. ආණ්ඩුවෙන් කරනවා. මේ සහනය මිනිස්සුන්ට ලබලා දෙන වැඩ පිළිවෙලක් ඒ තොරතුරු ටිකක් ඒ ගම්වලට යනවාද කියන එක පිළිබඳව හරි ප්‍රශ්නයක් තියෙනවා. හැම තැනම දැන් දවස් ගණනක් වෙනවා මේ ව්‍යවසනය වෙලා සමහර තැන්වලට වතුර ගිහිල්ලා නෑ. සමහර තැන්වලට ආහාර ගිහිල්ලා නෑ. සමහර තැන්වලට ආහාර පිස ගන්න බැරි වෙලා තියෙන තැන්වලට වියළි සලාක ගිහිල්ලා දෙන තැන් තියෙනවා. ඉතිං මේ ක්‍රමය මොකක්ද කියන එක ගැන හරි ගැටළුසහගතයි. ඒක නිසා ගරු සභාපතිතුමනි සාමාන්‍ය ජනතාව අතරේ ඊළඟට චක්‍රලේඛ ඉස්සරහට ඇවිල්ලා අද රජයේ සේවකයෝ තමන්ගේ ගෙදර වතුර ටික බැහැලා ගියහම ගෙදරට ඇවිල්ලා ගේ ශුද්ධ පවිත්‍ර කර ගන්න එතනට කොටු වුණහම ඒ අයට සහනාධාර දෙන්නේ නෑ. ඒ අයට දෙන්න බෑ කියනවා චක්‍රලේඛණය අනුව. කඳවුරේ ඉන්නවා නම් පමණක් ආහාර දෙන්න පුළුවන් වියළි සලාක දෙන්න පුළුවන් නැත්නම් පිසූ ආහාර දෙන්න පුළුවන්. ගෙදරට ගියොත් මේ පහසුකම දෙන්න විදිහක් නෑ කියලා. මම පුද්ගලිකව ගියා ඔය තැන් කීපයක්ම බලන්න. සමහර අයෙක්ගේ ගෙවල් අඩි 13 ක් විතර යට වෙලා තියෙන්නේ. අද ඒ ගෙදර ගිහිල්ලා සෝ සුසුම් හෙලලා තමන්ගේ ළමයින්ගේ පොත්පත් ටික එහෙමත් නැත්නම් සහතික ටික,ඇඳුම් ටික එහෙමත් නැත්නම් ඔප්පු තිරප්පු ටික මේවා බලලා අතු ගෑවිලි ටික කරනවා. ඒ අයට ගෙදරට කන්න ටිකක් දෙන්නේ නැත්නම් මොනම විදිහකින්වත් ඉයුම් පියුම් ටික කර ගන්න විදිහක් නෑ. චක්‍ර ලේඛණයක් මේකට හරස් වෙන්න විදිහක් නෑ. චක්‍රලේඛණය පැත්තක තියෙද්දී අනිවාර්යයෙන්ම රජයේ සේවකයාට එහෙම නැත්නම් මුදල් තියෙන මනුස්සයාට ,පොහොසතාද නැත්නම් දුප්පත් මනුස්සයාද කියන එක ගැන කාරණාව නෙමෙයි මෙතන වැදගත් වෙන්නේ මේ ව්‍යවසනයට මුහුණ දීපු කවුරු හරි ඉන්නේ ඒ පුද්ගලයාගේ තරාතිරම කෙසේ වෙතත් ලබාදීම අනිවාර්යය යුතුකමක් කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනේ. ඒ නිසා ඔබතුමාට විශේෂ කාර්යයක් තියෙනවා. ඔබතුමා මේ අවශ්‍ය කාරණා ඒ ඒ තැන්වලට දැනුවත් කිරිම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සොයා බැලීම අපිට මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න තියෙන පුද්ගලයෝ හැටියට ගරු සභාපතිතුමනි ඔබතුමා කටයුතු අරගෙන නායකත්වය අරගෙන කටයුතු කරන්න ඕනේ කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනේ. ඒවගේම ගරු සභාපතිතුමනි සමහර ඉඩම් නාය ගිහිල්ලා ව්‍යවසනයට පත් වෙලා තියෙනවා. අපේ රත්නායක මන්ත්‍රීතුමා කිව්වා වගේ එන්.බී.ආර්.ඕ. එකෙන් ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් ඇවිල්ලා ඒ කටයුතු කරන්න ඕනේ කියන එක අපි මීට ඉස්සෙල්ලා මේ සභාවේ මතක් කළත් මෙහෙම නිළධාරීන් අඩුයි කියලා මෙහෙම ව්‍යවසනයක් වෙච්චි වෙලාවේ වුණත් ඒ සහයෝගය අපිට ලබාගන්න නිළධාරීන්ගේ ඌණතාවයක් තියෙන වෙලාවේ වුණත් තිබෙනවා. හැබැයි මේ අවස්ථාව අපිට කඩිනම් කරලා ලබලා දෙන්න සිද්ධ වෙනවා.

ඒවගේම ගරු සභාපතිතුමනි නාය යෑම්,ඊළඟට ගංවතුර දැන් විශේෂයෙන්ම කෙටේතැන්න ප්‍රදේශයේ කහවත්ත ප්‍රදේශයේ එක පාරටම ගං වතුර ඇවිල්ලා එක පාරට කඩ සාප්පු යට කරගෙන විනාශ වෙලා ගියා. ඒ මිනිස්සුන්ගේ කිසිම දෙයක් අස් කරගන්න පුළුවන්කමක් තිබුණේ නෑ. ඒ මිනිස්සු රත්නපුරේ වගේ නෙමෙයි ඒ මිනිස්සු මොනම විදිහකින්වත් ගංවතුරකට

මුහුණ දෙන්න ලෑස්තියක් සූදානමක් පළපුරුද්දක් විශ්වාසයක් තිබුණේ නෑ ඒ ප්‍රදේශයට වතුර එයි කියලා. ඒ මිනිස්සුන්ගේ ජීවිත අඩාල තත්ත්වයට පත් වුණා. හැබැයි දැන් ගියහම මඩ වතුර ටිකයි පේන්න තියෙන්නේ. මේ අයට අපි මොනවද දෙන්න පුළුවන් සහයෝගය. ඒ අය දන්නේ නෑ සියළුදෙනා ඒ නාය යෑම් ගංවතුරට විනාශයට පත් වෙලා තියෙනවා. අර විනාශයෙනුත් ගරු සභාපතිතුමා ඒ අයගේ ජීවිත සෑහෙන කාලයකට පස්සට යන්නට වෙලා තියෙනවා. තමන්ගේ දූ දරුවන්ගේ පොත් පත් ටික විනාශ වෙලා තියෙනවා. සහතික ටික නැති වෙලා තියෙනවා. ඔප්පු තිරප්පු ටික නැති වෙලා තියෙනවා. වටිනා කියන ලියකියවිලි සියල්ල නැති වෙලා තියෙනවා. ඒ අය පිළිබඳවත් අපි අවධානය යොමු කරන්න ඕනේ. ඒක නිසා ගරු සභාපතිතුමනි මේ අසෝක ජයවර්ධන මැතිතුමා කිව්වා වාගේ අපිට මේ වෙලාවේ යම් යම් දෙයක් විනාඩි කීපයක් කතා කරලා අවසන් කරන එක නෙමෙයි. මීට වඩා පුළුල් ලෙස මේ ගැන සාකච්ඡා කරන්න මේ වෙච්ච විනාශය සෘජුව මේ අයට දෙන්න පුළුවන් සහයෝගය තමයි දැන් දෙන්න තියෙන්නේ. හැබැයි මින් ඉස්සරහට පාසැල් ළමුන්ගේ ජන ජීවිතය යහපත් කරන්නේ කොහොමද ඒ අයගේ නැති වෙච්ච ලියවිලි ටික හොයලා දෙන්නේ කොහොමද වටිනා කියන මිනිස්සුන්ගේ ලියවිලි නැති වෙලා තියෙනවා ඔප්පු තිරප්පු. ඒ අයට සහයෝගය දෙන්නේ කොහොමද කියලා අපි කටයුතු කරන්නේ කොහොමද කියලා මතක් කරමින් ඒ අවස්ථාවත් ඔබතුමා ඉදිරියේදී ලබලා දෙන්න කියලා ඉල්ලා සිටිමින් , ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

බොහොම ස්තුතියි අජිත් කුමාර මැද්දෙගම ගරු මන්ත්‍රීතුමනි. මීළඟට අජිත් ශ්‍යාමින්ද ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී අජිත් ශ්‍යාමින්ද*
*கௌரவ உறுப்பினர் அஜித் ஷாமிந்த*
*Hon.Member Ajith Shyaminda*

---------------------------------------------------------

ගරු සභාපතිතුමනි අද සභාවේ අපේ පළාතට මුහුණ දෙන්න සිද්ධ වෙච්ච හදිසි ව්‍යවසන තත්ත්වය පිළිබඳව කතා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. විශේෂයෙන් අපේ මන්ත්‍රීතුමන්ලා සඳහන් කළා මේ හදිසි තත්ත්වය යටතේ අපේ පළාතෙන් රත්නපුර දිස්ත්‍රික්කයට තමයි වැඩියෙන්ම හානියක් වුණේ කෑගල්ලට වඩා. ඒවගේම තමයි මරණ සිද්ධ වෙච්ච වෙලාවේත් අනිකුත් කළුතර, මාතර, ගාල්ල දිස්ත්‍රික්කවලට වඩා මරණ 71,77 ක් සිද්ධ වුණේ රත්නපුර දිස්ත්‍රික්කයේ. තවත් මිනී සොයා ගත්තු නැති ටිකකුත් තියෙනවා. ඒ අතර මම නියෝජනය කරන දිස්ත්‍රික්කය විදිහට කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයටත් මේ ගංවතුර නාය යෑම බලපෑවා. විශේෂයෙන් එහිදී මරණ හතරක් සිද්ධ වුණා පාසැල් දරුවෝ දෙදෙනෙක් සහ කාන්තාවෝ දෙදෙනෙක් ස්ථාන දෙකකදී නාය යෑම් වලට හසු වුණා. දැන් මේ වන කොටත් අද උදේ බලන කොටත් අවතැන් කඳවුරු හතක් දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තියෙනවා. ඒවගේම ගංවතුරට පවුල්

1500 කට අධික සංඛ්‍යාවක් යට වුණා. දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම සේවක වසම් කීපයකම. ඒවගේම තව නාය යෑම් කීපයක්ම සිදු වුණා . ජීවිත හානි නැති වුණත් නිවාස විදිහට දහයකට වැඩි ගාණක් තියෙන තැන්වත් නැති වෙන ගානට නාය යෑම් වුණා. අපිට එක අතකින් පොඩි කණගාටුවක් තියෙන්නේ ගරු සභාපතිතුමනි මේ රටේ පළාත් කීපයකම මේ සිද්ධ වෙන කොට කෑගල්ල දිස්ත්‍රික්කයේ අපේ ආපදා කමිටුව විදිහට නැත්නම් දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලය හරහා අපේ කෑගලු දිස්ත්‍රික්කයේ දෙහිඕවිට කොට්ඨාසයට විතරක් මේ කටයුත්ත සිද්ද වුණ නිසා එච්චර නොසැලකිලීමක් සිද්ධ වෙලා තියෙනවා. අපේ ජනතාව කතා කරන කොට මේක දේශපාලන ප්‍රශ්නයක් විදිහට මම දකින්නේ නෑ. ශ්‍රීලංකා,යූ.එන්.පී., ජේ.වී.පී. විදිහට මම දකින්නේ නෑ. අර ගම්වල මම ඊයේ වෙන කොට අවතැන් කඳවුරු ඒ හානි වෙච්චි හැම එකකටම ගියා. ඒ බලන කොට කිසිම දෙයක් ලැබිලා නෑ. ගොඩක් තැන් වලට. හේතුව හොයලා බලන කොට ආපදා කමිටුව දිස්ත්‍රික් ලේකම්තුමන්ලා තීරණය කරලා තියෙනවා මේ පිටින් ලැබෙන ආණ්ඩුවෙන් ලැබෙන ආධාර වලට අමතරව ස්වෙච්ඡා මිනිස්සු ආධාර දෙනවා. ඒ කිසිවක් කෑගලු දිස්ත්‍රික්කයට අවශ්‍ය නැහැ කියලා දැනුම්දීලා. ඒ නිසා දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අසරණ ජනතාවට ලැබෙන්න තියෙන දේවල් නොලැබුණා. මම මේ තත්ත්වය සිද්ධ වෙච්චි දවසේම අපේ රංජිත් බණ්ඩාර ඇමතිතුමාට කතා කළා මොකද අවතැන් කඳවුරු ගණනාවක්ම ඇති කරන්න ඕනේ. ඒ වෙලාවේ එතුමාත් අවතැන් වෙලා හිටියේ ගෙදර එතුමාත් කොටු වෙලා හිටියේ. එතුමාත් කිව්වා අවශ්‍ය දෙයක් තියෙනවා නම් බලලා කරන්න කියලා. ඒ අවස්ථාවේදී මම අර ඉස්කෝලවල අවතැන් කඳවුරු දාන කොට අවශ්‍ය පැදුරු ටිකක් සහ මදුරු දැල් ටිකක් මොකද ආහාර ගැන අපි පළාත් සභාවෙන් එච්චර දැහලුවේ නෑ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කරයි කියලා. ඒ අනුව අපි මදුරු දැල් ටිකක් පැදුරු ටිකක් ඇමතිතුමා කිව්වා ඒවා පස්සේ මැදිහත් වෙලා කටයුතු කරන්නේ කියලා. ඊයේ වෙනකන් රජයෙන් කියලා ගොඩක් තැන්වලට ඒ මදුරු දැල් ටික විතරයි ලැබුණේ. පැදුරු ටික. තාමත් අර අනිත් මිනිස්සුන්ගෙන් ලැබුණේ නෑ. ප්‍රාදේශීය ලේකම්වරයෙක් නෑ දෙහිඕවිට. වැඩ බලන ලේකම්වරයෙක් ඉන්නේ. දවස් කීපයක් ඊයේ වෙනකන් වැඩ කළා. ඒ අනුව ඒ ලැබෙන වියළි ආහාරත් ක්‍රමානුකූලව අනිත් ඒවාට යවා ගන්න හැකියාවක් ලැබුණේ නෑ ගොඩක් තැන්වල. ඒ නිසා මම ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි ක්ෂණිකව අපි දිස්ත්‍රික් ලේකම් එහෙම නැත්නම් කෑගලු දිස්ත්‍රික් ආපදා කමිටුවටත් දැනුම් දෙමු රජයෙන් ලබා දෙන ඒවාට අමතරව යම්කිසි තියෙනවා නම් මොකද පාසැල් දරුවන්ගේ පොත්පත් ටික ගහගෙන ගියා ගොඩක් ඉස්කෝලවල. ඇඳුම් ටික ගහගෙන ගියා. මම ගරු අධ්‍යාපන ඇමතිතුමාටත් දැනුම් දෙනවා අනිත් පළාත්වල පාසැල් දරුවන්ට ඇඳුම් සහ අනිත් දේවල් දෙන කොට දෙහිඕවිට අධ්‍යාපන කොට්ඨාසයේ දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේත් මේකට ඇතුල් කර ගන්න කියලා. මං හිතන්නේ මෙතුමා ඒක ඇතුල් කරලා ඇති. නැත්නම් මම ඉල්ලා සිටිනවා ඒ හා සමානවම ව්‍යවසනයක් ඒ දරුවන්ට වුණා. ඒ විදිහට පාරවල් විදිහට ගත්තහම 35 ක් විතර කැඩිලා ගිහිල්ලා තියෙනවා. මේ වෙන කොටත් පාරවල් කීපයක්ම කොටු වෙලා තියෙන්නේ. පස් ටික ඉවත් කර ගන්න බැරි වුණා. දැන් ඒකෙදී දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට එක බැකෝ යන්ත්‍රයයි තිබුණේ. තල්දූව ,දෙහිඕවිට ඒ ප්‍රධාන නගරවල කුණු අයින්

කරන එක විශාල ලෙස රොන් මඩ ඒවා ඇවිල්ලා කාණු පද්ධතිය අක්‍රිය වෙලා තියෙනවා. මෙහේ දැනුම් දුන්නහම කොමසාරිස්තුමා රුවන්වැල්ල ඒ සභාවේ යන්ත්‍රය අනියුක්ත කළාට ඒ රියදුරුත් එක්ක එතෙන්ට ආවා විතරයි ඒයා ක්‍රියා කරලා නෑ. ඊයේ දිනයේදී ඒ රියදුරු නිවාඩු දාලා. ගරු සභාපතිතුමනි මේවා අපි දේශපාලඥයෝ වශයෙන් විතරක් නෙමෙයි නිළධාරීනුත් යම් වගකීමක් දරන්න ඕනේ. මේවගේ දෙයක් වුණහම. ඒ නිළධාරියා නිවාඩු දාලා ගිහිල්ලා. ඒ නිසා ගරු සභාපතිතුමනි මම ඉල්ලා සිටිනවා මම ඊයේ ප්‍රධාන ඇමතිතුමාට දැනුම් දුන්නා ප්‍රධාන ඇමතිතුමා ඒක සොයලා බලනවා කිව්වා. මං හිතන්නේ කටයුතු කරලා ඇති. මම ඉල්ලා සිටිනවා යටියන්තොට හරි වෙනත් ප්‍රදේශවල බැකෝ යන්ත්‍ර තියෙනවා නම් දෙකක් තුනක් දාලා අර අවතැන් වෙච්චි එන්න බැරි පාරවල් ටික පාරවල් 35 ක් විතර මම සභාවේ ලේකම්වරයාගෙන් ඇහුවහම පොඩි පොඩි පස් කඳු නායවල් වලින් වැහිලා ගිහිල්ලා තියෙන්නේ. ඒ ටික සක්‍රිය කර ගන්න ඒ යන්ත්‍ර ටික යොදවලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒවගේම තමයි අනිකුත් දේවල් දිහා බැලුවහම මේ වෙන කොට ගංවතුර බැහැලා පානීය ජල ප්‍රශ්නය ළිං ටික ඔක්කෝම යට වෙලා. අද මෝටර් කීපයක්ම දීලා තියෙනවා. මොකුත් ප්‍රමාණවත් නෑ. අපි ඊයේ මැණික් සංස්ථාවට කතා කළහම ඉලෙක්ට්‍රික් මෝටර් හයක් දුන්නා. ඒකත් ප්‍රමාණවත් නෑ. අපි බලනවා පුළුවන්කමක් තියෙනවා නම් ඒවාත් තව යොදවා ගන්න ඕනේ ජල ප්‍රශ්නය ප්‍රධානම ප්‍රශ්නයක්. ඊළඟට අපිට මුහුණ දෙන්නට සිද්ධ වෙන තත්ත්වය තමයි ඊට ඉස්සෙල්ලා තිබුණ තත්ත්වය නාය නෙමෙයි දෙහිඕවිට කොට්ඨාසයේ ඩෙංගු තත්ත්වය. ගොඩාක් මේ වන කොට ඉස්පිරිතාලයේ තියෙන්නේ. ගංවතුර බහිනයාත් එක්කම අනිවාර්යයෙන් අපි දන්නවා නැවතත් ඩෙංගු වසංගතය ඉදිරියට එනවා. ඒ නිසා අපි යෝජනා කරනවා රත්නපුර දිස්ත්‍රික්කයේත් විශේෂයෙන් ඒ පැත්තේත් සායන කීපයක් සංවිධානය කරලා දෙන්න කියලා අපි ප්‍රධාන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා අඩුම ගානේ කොට්ඨාස මට්ටමට වසම් දෙක දෙක හරි එකතු කරලා වෛද්‍ය සායන ටිකක් තියලා ඒවගේම පවිත්‍ර කටයුතු කරන්න ඒවගේම අපේ යට වෙච්චි ඒ ගෙවල්වල දෛනික බෙහෙත් ගන්න අය හිටියා. ප්‍රෙසර් එකට,සීනි වලට අනිකුත් දේවල් වලට . ඒ බෙහෙත් ඔක්කෝම විනාශ වෙලා තියෙන්නේ. ඒ අයගේ ජීවිතත් ආරක්ෂා කර ගන්න වෛද්‍ය සායන ටිකක් හරි තියලා ඒ කටයුතු කරන්න අපේ අවධානය යොමු කිරීම වටිනවා. ඒවගේම තමයි අපි දන්නවා මේ නාය ගිය ස්ථාන දිහා බැලුවහම හැම එහෙකම දැක්ක කාරණාවක් තමයි අපේ මන්ත්‍රීතුමන්ලා කීපදෙනෙක්ම සඳහන් කළා තේ වගාව තමයි මේකට ප්‍රධානම හේතුව. හේතුවක් විදිහට අපි දකින්නේ. වෙලන්ගල්ලේ පාසැල් දරුවෝ දෙන්නාත් යට වුණ තැනත් දෙපැත්තේ කැළේ එයාගේ ගේ උඩ දිගටම තේ වගා කරලා. එක තමයි කඩාගෙන ආවේ. ඒ නිසා අපේ පළාත්වල නොයෙකුත් ආර්ථික වාසි වෙනුවෙන් අපි නොයෙකුත් වගා කරනවා. නමුත් ඒවා පස සංරක්ෂණය කරන්න ක්‍රමවේදය අපි හරියට අනුගමනය කරන්නේ නෑ. දැන් අර කටුපොල් වගාවත් ඒ විදිහටමයි සීඝ්‍රයෙන් මේ ප්‍රදේශයේ වගා කරගෙන යනවා. තව කාලයක් යන කොට සතියක් යන කොට ජල හිඟය තියෙනවා ඒක දෙගුණ තෙගුණ වෙලා තමයි අපිට බලපාන්නේ.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

අපි අවසන් කරමු ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී අජිත් ශාමින්ද*
*கௌரவ உறுப்பினர் அஜித் ஷாமிந்த*
*Hon.Member Ajith Shyaminda*
---------------------------------------------------------

ගරු සභාපතිතුමනි තව කරුණු කීපයක් තිබුණත් මම කාලය ගන්නේ නෑ. විශේෂයෙන් අපි මේ සභාවේ කීප වතාවක් මේ ව්‍යවසනය වෙන්න ඉස්සෙල්ලාත් සතියකට ඉස්සෙල්ලා මේ සභාව හරහා අපි කතා කළා. අපේ පළාත වෙනුවෙන් මේ ස්වභාවික විපත් සඳහා කමිටුවක් ආයතනයක් ස්ථාපිත කරමු කියලා. ඒකේ අවශ්‍යතාවය අපිට පේනවා. විශේෂයෙන් නාය යන කොට මැරුණා නාය බලන්න ගිහිල්ලා. නායක් එනවා කියලා දැන ගත්තහම අපේ පාසැල් දරුවා හරි කවුරු හරි ඒකට මුහුණ දෙන ක්‍රමය දන්නේ නෑ. අවබෝධය ලබලා දෙන්න ඕනේ. ඇහැලියගොඩ වුණත් ඒක බලන්න ගිහිල්ලා දෙන්නෙක් තුන්දෙනෙක් මැරුණා. ඒ තත්ත්ය තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි කඩිනමින්ම අපේ පළාතේ අපේ අතුල ඇමතිතුමා කිව්වා වගේ මේ අවුරුද්ද ඉවර වෙලා දවස් 45 න්, 47 න්, 48 න් ගංවතුරක් නාය යෑමක් එනවා. මේවාට මුහුණ දෙන්න අපි ආයතනයක් අපේ සමාජ සේවා අමාත්‍යාංශය අනුබද්ධ කරලා අනිවාර්යයෙන් මේ වතාවේ අපි පිහිටුවන්න කටයුතු කරමු කියලා යෝජනා කරමින් මම ඉස්සෙල්ලා කියපු කරුණු කාරණා පිළිබඳව ගරු සභාපතිතුමා මැදිහත් වෙලා අදාල නිළධාරීන්ට අපේ ආයතන වලට දැනුම් දෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියන මතක් කරමින් නිහඬ වෙනවා ස්තූතියි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තූතියි ගරු අජිත් ශාමින්ද මන්ත්‍රීතුමනි. සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා කලින් පෙන්වා දුන් ආකාරයට මේ කාරණාව පිළිබඳව අපි පුළුල්ව පළාත් සභාවක් හැටියට අපි ඉදිරියේදී සාකච්ඡා කළ යුතුව තියෙනවා. පශ්චාත් කටයුතු පිළිබඳවත්. පූර්ව කටයුතු පිළිබඳවත් සාකච්ඡා කළ යුතුව තියෙනවා. ඒ නිසා හැම කෙනෙකුටම අවස්ථාව ලබාදිය යුතුව තියෙනවා ඉදිරියේදී වෙලාව ඉල්ලලා තියෙන. ඒ නිසා ඒ අනුව අපි සභාවේ සාකච්ඡා කරන්න කියලා ආරාධනා කරනවා සියළු දෙනාටම. මීළඟට යෙහෙයියා එම්.ඉෆ්ලාර් ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්*
*கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்*
*Hon.Member M.Y.M.Iflar*
---------------------------------------

ගරු සභාපතිතුමනි ප්‍රථමයෙන් ඔබතුමා මේ අවස්ථාව ලබාදීමත් අද දිනයේදී සියළු කටයුතු අත්හිටුවලා මීට දින කීපයකට ඉහතදී සබරගමු පළාතත් සමස්ත ශ්‍රීලංකාවේ දිස්ත්‍රික්ක අටක මේ

ඇති වෙච්චි ව්‍යවසනය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට අවස්ථාව සලසාදීම පිළිබඳව ප්‍රථමයෙන්ම ස්තූතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි අපි මේ කතා කරන මොහොත වනවිටත් ජීවිත විශාල සංඛ්‍යාවක් අහිමි වෙලා උස් පහත් භේදයකින් තොරව කිසිම ජාති භේද ,කුළ,ආගම්, පක්ෂ භේදයකින් තොරව මේ ජීවිතවලට සහ මේ ව්‍යවසනයට සම්බන්ධ වෙච්චි උදවිය ලක් වෙච්චි මොහොතක තමයි අපි කතා කරන්නේ. ගරු සභාපතිතුමනි අපි මොනවා කතා කළත් අපි මොන දේ කිව්වත් මීට ඉහතදී මම දන්නවා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු කීපයකදීම වාරි මාර්ග දෙපාර්තමේන්තුව විසින් අවුරුදු 15 ට සැරයක් මේ විදිහට ව්‍යවසනයක් වෙන්න පුළුවන් 2003 ආවා. ඉන් අනතුරුව ව්‍යවසනයක් එන්න පුළුවන් කියලා අනතුරු හැඟවීම් ලබා දුන්නා. ඒ ලබා දුන්නත් අපි දකින දේ තමයි අපි හිතන දේ තමයි අපි කිසි දවසක මේ තරම් ආපදාවකට ලක් වෙයි කියලා සූදානමක් අඩුයි කියන එක තමයි මගේ හැඟීම. මොකද එහෙම තිබුණා නම් අද රත්නපුර පොලීසිය ගත්තහම මෝටර් බෝට්ටු දෙකක් තිබුණා. එකක් සහන සේවා කියනවා. අනිත් එක කැඩිලා දුවන්න බෑ කියනවා . අනිත් එක රත්නපුර නගරයේ මම ජීවත් වෙන්නේ. මම කතා කරන මගේත් සියළු දේවල් කැඩිලා යට වෙච්චි මොහොතක තමයි මම ඉන්නේ. නමුත් මම ගත්තොත් මගේ ව්‍යාපාර ස්ථානය යට වෙලා. මගේ නිවස යට වෙලා. මගේ කාර්යාලය සියල්ල යට වෙලා ඒත් අපි එතන නෙමෙයි ඉන්නේ. පෙර සූදානමක් තියෙන්න ඕනේ. ඒ එක්කම මම අගය කරනවා අද මේ මොහොතේ මොනවා හිටියත් අපේ ගරු සමාජ සේවා ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර අමාත්‍යතුමා. මම එදා උදේ කතා කළා හෙට උදේ එන්න කිව්වා ඔරු අඟුල් දෙකක් දෙන්න. එක අඟුල් දෙකට මේවා කරලා දෙන්නේ. ඒවා අපි තැන් දෙකකට දීලා ජීවිත කීපයක් අපි ආරක්ෂා කළා. මේ වගේ තත්ත්වයක් තමයි ඉතා ක්ෂණිකව අපි පළාත් සභාව සහ මධ්‍යම ආණ්ඩුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මේ වෙලාවේ අපේ අතුල කුමාර රාහුබද්ධ මැතිතුමා මෙතන නොසිටියත් එතුමා පැහැදිලිවම කිව්වා ඊයේ දිනයේදී අතිගරු ජනාධිපතිතුමා ඇවිල්ලා සාකච්ඡා පවත්වලා අපි මේ පිළිබඳව විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම හොඳයි. ඒ ක්‍රියාත්මක කරන කොට කියන්නේ හැමදේම හරි කියලා නිළධාරීන්. අපි හරි නෙමෙයි විවිධ බාධා ඇතුව වැඩ කරනවා. නිළධාරීන්ට දොස් කියනවා නෙමෙයි. නිළධාරීන් විශාල කැප කිරීමක් කරනවා. නිළධාරීන්ට යන්න බැරි අවස්ථාවල් තියෙනවා. කොටු වෙලා තියෙනවා. අවතැන් වෙලා තියෙනවා. අපි කොච්චර කතා කළත් මේ තියෙන ගංවතුර සහ නායයෑම් තුළ අපි කවුරු කතා කළත් යන්න බැරි ස්ථාන තියෙනවා. අර අපේ මෙතන කතා කළ සිරිපාල මන්ත්‍රීතුමා කිව්වා කැටේපොළ තැන් කිව්වා. ඒවගේම එතුමා මඩබද්දර පැහැදිලිවම මේ මොහොතේත් යන්න බෑ. නමුත් මේ අයට ජීවත් වෙන්න විදිහක් නෑ. කන්න බොන්න දෙන්න විදිහක් නෑ. කඩ සාප්පු නෑ. අනිත් පැත්තෙන් ගත්තහම ඒ අයට බඩු ගෙන්න ගන්න විදිහකුත් නෑ. මෙහෙම තියෙන අවස්ථාවකදී ගුවනින් ගිහිල්ලා යම් යම් වැඩ පිළිවෙලක් කරනවා. නමුත් ඒ කොහොම කළත් මේකට පෙර සූදානමක් තියෙන්න ඕනේ. සෑම පොලිස් ස්ථානයකටම මෝටර් බෝට්ටු සහ ඔරු අඟුල් ලබා දෙන්නට ඕනේ. සෑම ග්‍රාම සේවක වසමකටම අද ගත්තහම ග්‍රාම සේවක වසම් පන්සිය ගාණෙන් තුන්සිය ගාණක්ම මේ ආපදාවට ලක්

වෙලා ඉන්නවා. අපි ඇහුවහම ග්‍රාම සේවක වසම්වල කීපයක් ඇරුණහම ඔරු අඟුල් කීපයක්වත් නෑ. අද ඔරු අඟුල ගත්තහම මට ඉස්සෙල්ලා කතා කරපු රත්නායක මන්ත්‍රීතුමා ඉතා පැහැදිලිවම කිව්වා මොකක්ද යන්නේ සමහර අය මේක විනෝදයට බලන්න යනවා. සමහරු මේක යම්කිසි දෙයක් පානය කරලා බලන්න යනවා. මේක නරඹන්න යනවා. නමුත් අද කොටු වෙලා ඉන්න අසරණභාවයට පත් වෙලා ඉන් අහිංසක ඒ උදවිය බේර ගන්න ක්‍රමවේදයක් නෑ. සමහර අය තමන්ගේ ගෙවල්වල තට්ටු දෙකක නිවසක් ඉදිකරලා තිබුණා නම් පළවෙනි තට්ටුව යට වුණහම උඩ තට්ටුව ගියා බලන කොට අවාසනාවකට උඩ තට්ටුවටත් වතුර ටිකක් ආවහම මේක බේර ගන්න විදිහක් නෑ. සමහර අය හිටියේ තමන්ගේ වහලය උඩ. තව සමහර අය හිටියේ තමන්ගේ ෆිරිජ් එක උඩ. අනූ නවයයි දශම නවයෙන් සමහර අය බේරුණේ. ගරු සභාපතිතුමනි මෙවැනි ව්‍යවසනයක් ඇති වෙන කොට ජීවිත විශාල සංඛ්‍යාවක් අහිමි වෙලා තියෙනවා. වටිනා ජීවිත. ඒවගේම දරුවන් වැඩි ප්‍රමාණයක් නැති වෙලා තියෙන්නේ අපේ දිස්ත්‍රික්කයේ. සබරගමු පළාතේ තමයි වැඩිම දරු පිරිසක් අපිට අහිමි වෙලා තියෙන්නේ. ඒ එක්කම මේ ව්‍යවසනයට පෙර සූදානම්වීමක් වගේම මේක අද අපි කතා කරයි. මේ සම්බන්ධයෙන් සියළු දේ ප්‍රකාශ කරයි. මේක අවසන් වුණාට පස්සේ මේ සියළු දේ අමතක වෙයි. ආපහු තව අවුරුදු පහළොවක් යන කොට එදාට කතා කරයි ආපහු ඒ ව්‍යවසනය ගැන. 2003 දී අපි මේ විදිහටම කතා කළා. 2003 ඉතිහාසයේ වැඩිම ගංවතුර ආවා. මෑත ඉතිහාසයේ එවැනි දෙයක් වෙලා විනාශ වුණාට පස්සේ ආපහු නැවත වාරි මාර්ගයෙන් දිගින් දිගටම අනතුරු ඇඟවීම් කරලා දුන්නා. අපිට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී ඒ වාරි මර්ගයේ නිළධාරී මහත්තයා කිව්වා සංඛ්‍යා ලේඛණ ඇතුව ඒවගේම ක්‍රමවේදය කියලා දුන්නා මෙන්න මේකයි මේ විදිහයි 2017,2018 නියත වශයෙන්ම වෙන්න ඕනේ කියලා. එතුමා මේ තියෙන පැවිල්ල මේ සියළු දේවල් වලට අවබෝධයක් දීලා අපිව දැනුවත් කළා. නමුත් ආපදාවට ලක් වෙච්ච මේ අය වෙනුවෙන් අපි ආපදාවට ලක් වූවන්ට කටයුතු කරන ආකාරය පිළිබඳව අපි අඩුවක් දකිනවා. ජීවිත නැති වෙලා ඉවරයි. මම ඉල්ලීමක් කරනවා සමහර අවස්ථාවලදී අපි කෑම බීම ලබා දෙනවා. සමහර අයට කෑම බීම ලබාදීලා හරි යන්නේ නෑ. සමහර අයට අද නිදා ගන්න තැනක් නෑ. ඉන්න තැනක් නෑ. සමහර අය හිතන්නේ කඳවුරුවල ඉන්න පිරිස පමණයි. නමුත් අද කඳවුරුවල නැති ගෙවල් වලට කොටු වෙලා එන්න බැරි පවුල් කීපයක් තිබෙනවා. සමහර තැන්වල මම දැක්කා ගමේ ඇතුලේ වටේම යට වුණහම කොටු වෙලා ඉන්නවා පිරිසක් ඒ පිරිසට එන්න විදිහකුත් නෑ යන්න විදිහකුත් නෑ. ඔරු අඟුලක්වත් නෑ. අඩුම ගානේ ඒ ප්‍රදේශය ගැන බලන්නේත් නෑ. සමහර අය කියනවා ග්‍රාම නිළධාරී වාර්තාව ගේන්න කියලා. අද ග්‍රාම නිළධාරී ගත්තහම 65% ක් 70% ක් ඉන්නේ කාන්තාවෝ. සමහර ග්‍රාම නිළධාරී මහත්තුරු ගත්තහම ඒ අය යට වෙලා ඉන්නවා. මේ ප්‍රදේශයේ ඒ අයට ගමන් කරන්න විදිහක් නෑ. තොරතුරු ගන්න විදිහක් නෑ. තොරතුරු නිරන්තරයෙන් ලබා දෙන්න විදිහක් නෑ. නමුත් අපි යම්කිසි වැඩ පිළිවෙලක් ඇති කරලා ඒ අය වෙනුවෙන් සහනදායී වැඩ පිළිවෙලක අනුගමනය කරලා ඒ අහිංසක ඒ උදවියට සහනයක් දෙන්න ඕනේ. සමහර අවස්ථාවලදී ඔහු රජයේ සේවකයෙක්ද ඔහු මුදල් තියෙන පුද්ගලයෙක්ද කියන එක නෙමෙයි බලන්න ඕනේ මේ ව්‍යවසනයට ලක් වෙලා ඉඳලා මේ සියළු චක්‍රලේඛණ පැත්තක තියලා ඔහුට ලබා දෙන්න යම් දෙයක් තියෙනවා නම් ඒවා ලබාදීමට

කටයුතු කිරීමට අපි උත්සාහ කළ යුතුයි. ඒවගේම සබරගමුව පළාත් සභාවේ සහ මධ්‍යම ආණ්ඩුවේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමග සම්බන්ධතාවයක් පවත්වලා ඒ අයට යම්කිසි ක්‍රමවේදයක් අනුගමනය කරලා මේ ව්‍යවසනය අපිට පුළුවන් තරම් අවම කර ගන්න තිබුණා. මම දැක්කා ඊයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ලේකම්තුමිය කිව්වේ ජනාධිපතිතුමාගේ රැස්වීමේදී අඩුපාඩුව තියෙන්නේ වාහන කිව්වා. එතකොට කිව්වා ඉක්මනට ගන්න කියලා. පළාත් සභාවට කතා කළා නම් පළාත් පාලන ආයතන සියල්ලම හිමි වෙන්නේ අපේ පළාත් සභාවට. ඒ පළාත් පාලන ආයතනවල මේ වෙන කොට සියළු වාහන පද්ධති තියෙනවා. යම් යම් කටයුතු කරන්න පුළුවන් ශක්තියක් තියෙනවා. ඒවගේම මේ පළාත් සභාවේ කැපවීම් කරන්න පුළුවන් උදවිය මේ අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධාන ඇමතිතුමා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය සූදානමින් ඉන්නවා නිළධාරීන් සූදානමින් ඉන්නවා. නමුත් සම්බන්ධීකරණය හරියට වුණේ නෑ. දැන් ඒ සිද්ධ වෙච්චි දේවල් අවසන් වුණත් මේවා පාඩමකට අරගෙන මේවා ක්‍රියාත්මක කරගෙන නිසි සම්බන්ධීකරණයක් පවත්වලා මේවෙන් වෙන හානිය අවම කරලා ජීවිත හානි අවම කරලා ඒ එක්කම නැවතත් ඒ එක්කම විවිධ ප්‍රදේශවල විවිධ අවස්ථාවල නාය යෑම් ගැන කතා කරනවා. හැම අවස්ථාවකම සෑම ගෙදරකම ඉන්න මිනිහෙක්ම බයෙන් ඉන්නේ කන්දක් තියෙන තැනක. මෙතන පුපුරලා තියෙනවා. මේ කන්දෙන් ඉවත් වෙන්න කියලා. මෙහෙම කිව්වහම මිනිස්සු අසරණභාවයට පත් වෙනවා. අසරණ මිනිස්සුන්ට මේක සමහර තැන්වල එක පැත්තකින් යට වෙලා අනිත් පැත්තෙන් ගැහුවහම ගහෙන් වැටිච්චි මිනිහාට ගොනා අනිනවා වගේ වැඩක්. අනිත් පැත්තෙන් කියනවා මේක නාය යනවා කියලා. අද ඉන්නවා ගොරොක්ගොඩ පැත්තේ නාය යනවා කියලා. රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ. මේවගේ විවිධ දේවල් වැරදි ප්‍රචාර යාම තුළත් මේවගේ දේවල් තියෙනවා. මම ඉල්ලීමක් කරනවා යම්කිසි වැඩ පිළිවෙලක් ඇති කරලා මේ ව්‍යවසනයෙන් අහු වෙලා ඉන්න අයට සහනයක් සලසාදීම සඳහා අපි සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා ඔබතුමාගේ ඔරු අඟුල් ලබාදීම සහ බෝට්ටු ලබාදීම සහ විවිධ සහන සේවා කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිළධාරී හරහා ක්‍රියාත්මක කරලා ඒ තුළින් වැඩදායී වැඩ කොටසක් ප්‍රදේශයේ ජනතාවට කිරීමට ශක්තිය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරමින් ඔබතුමා මට අවස්ථාව සලසාදීම ගැන ස්තූතිවන්ත වෙමින් මේක ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට ශක්තිය ලැබේවා යැයි ප්‍රාර්ථනය කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------------

ස්තූතියි ගරු යෙහෙයියා එම්.ඉෆ්ලාර් මන්ත්‍රීතුමාට. මීළඟට නිලන්ත ජයකොඩි මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී නිලන්ත ජයසිංහ***
***கௌரவ நிலந்த ஜயசிங்க***
*Hon Member Nilantha Jayasighe*

---

ගරු සභාපතිතුමනි ස්තූතිවන්ත වෙනවා කාලය ලබාදීම පිළිබඳව. ඇත්තටම මේ සිදු වූ ව්‍යවසනයෙන් අවතැන් වූ විපතට පත් මිය ගිය අසරණ

ජනතාව වෙනුවෙන් ශෝකය හා කණගාටුව ප්‍රකාශ කරන අතරම මම හිතනවා මෙම ගංවතුර පිළිබඳව රත්නපුර දිස්ත්‍රික්කයේ අපි සියල්ලටම දැනුමක් තියෙනවා මේ 45 වතුර කියන මතය. මට මතකයි 2006 වර්ෂයේදී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී දිස්ත්‍රික් ලේකම්ගෙන් අපේ හිටපු අමාත්‍යතුමා රංජිත් සොයිසා අමාත්‍යතුමා ප්‍රශ්න වගයක් ඇහුවා 45 වතුරට කොහොමද සූදානම කියලා. ඇත්තටම එදා පෙර සූදානමක් තිබුණා. අවශ්‍ය ඔරු අඟුල් ටික තිබුණා. ආහාර සියල්ල කූඩාරම් පවා සූදානම් කරලා තිබුණා. මම හිතන්නේ මේ අවස්ථාවේදී 2003 වඩා අඩු ගංවතුරක් තමයි මේ වෙලාවේ ආවේ. නමුත් විපත වැඩියි. ඒකට විශාල හේතුවක් වුණා අපේ පෙර සූදානමක් තිබුණේ නෑ. මමත් බටුගෙදර ප්‍රදේශයේදී මමත් ගංවතුරට කොටු වුණු පුද්ගලයෙක් හැටියට දැක්කා සමහර අය ගිහිල්ලා උඩ තට්ටුවේ හිටියා වතුර බැහැලා යයි කියලා. ඒක තමයි සාමාන්‍ය තත්ත්වය. රත්නපුර දිස්ත්‍රික්කයේ සාමාන්‍ය තත්ත්වය මිනිස්සු ගෙවල්වල උඩ තට්ටුවට වෙලා ඉන්නවා මේ ගංවතුර බැහැලා යනවා. නමුත් අවාසනාව කියන්නේ ගංවතුර එන්න එන්නම වැඩි වෙලා ඒ උඩ තට්ටුත් යට වුණා. ඒ උඩ තට්ටුව යට වෙන වෙලාව වෙන කොට ඒ අයට සහන සලසන්න අපිට හරියට ඔරු අඟුලක් තිබුණේ නෑ. ඔරු අඟුල් බැඳගෙන තිබුණේත් නෑ. වෙන වෙනම තිබුණේ. මේ ගරු ඇමතිතුමාටත් මම කතා කළා. මේ අවස්ථාවේදී මෙතුමාත් අපිත් එකම විදිහට තමයි කොටු වෙලා තියෙන්නේ. අපිට වගකීමක් හා යුතුකමක් තියෙනවා ඒ සඳහා යම්කිසි සහනයක් සලසන්නට. ඒ එක්කම මම දිස්ත්‍රික් ලේකම්තුමියට කතා කළා. නමුත් ඒ පිළිබඳව ඇත්තටම සතුටු වෙන්නට බෑ. නමුත් සහකාර දිස්ත්‍රික් ලේකම්තුමාට කතා කළාට පස්සේ එතුමා එ අවස්ථාවේදීම ක්‍රියාත්මක වෙලා නාවික හමුදාවේ බෝට්ටු දෙකක් එව්වාට පස්සේ තමයි ඒ ජනතාව මුදා ගන්න පුළුවන් වුණේ. එතනත් ජීවිත 35 ක් 40 ක් බේර ගන්න පුළුවන් වුණා. ඒ අවස්ථාවේදී ක්‍රියාත්මක වෙන්න පුළුවන් වුණේ. අපිට පෙර සූදානමක් තිබුණා නම් අපිට මීට වඩා සැළසුම්සහගතව ක්‍රියාත්මක වෙන්න තිබුණා. මොකද මේ අනතුර හැමදාම එන අනතුරක්. ඒක ලොකු වෙන්න පුළුවන්. පොඩි වෙන්න පුළුවන්. යම් යම් තැන් වලදී යම් යම් කාලවල් වලදී වර්ෂවලදී පොඩියටත් එනවා. මේක විශාල අනතුරක් බවට පත් වෙලා අවසන්. දැන් මේ වනවිට හැම තැනම නාය යෑම් තර්ජන විශාල වශයෙන් තියෙනවා. මම ඊයේ ඉඳලා වෙන කොට අයගම ප්‍රදේශයට ගියා. ප්‍රධාන අමාත්‍යතුමාට ස්තූතිවන්ත විය යුතුයි එතුමාට කතා කළා විතරයි එතුමා පළාත් පාලන ආයතන ටිකට කතා කරලා ඉවර වෙලා අවශ්‍ය බැකෝ යන්ත්‍ර ටික අරන් යන්න කිව්වා. මේ පාරවල් ටික ශුද්ධ කරන්න කිව්වා. දැන් කලවාන කොට්ඨාසය පිළිබඳව අයගම පිළිබඳව කිසිම තොරතුරක් විදුලිය විසන්දිවීම තුළ මං හිතන්නේ සෙලියුලර් දූරකථනයක්වත් වැඩ කලේ නෑ. ඒක ටවර්වල දෝෂයක් වෙලා තියෙනවා. විදුලිය විසන්ධිවීම පමණක් නෙමෙයි ඒ අයගේ වගකීමක් වෙලා තියෙනවා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව හරහා ඒ පිළිබඳව පරීක්ෂණයක් කරලා මොකද ඒ ටවර් ඕෆ් වෙන්න විදිහක් නෑ. ඒගොල්ලෝ යම්කිසි ගිවිසුමකට ඇවිල්ලා තමයි ටවර් එකක් ඉදිකරන්නේ. ඒ ටවර් එකක් ඕෆ් වෙන විදිහට ජෙනරේටර් සවි කරලා තියෙන්න ඕනේ. විදුලිය විසන්දි වුණා කියලා කිසිම අවස්ථාවක ටවර් එකක් ඕෆ් වෙන්න විදිහක් නෑ. සන්නිවේදනය නොමැති වෙලා තිබුණා. දැන් මේ වෙන කොට අයගම ප්‍රදේශයේ 18 කට අධික ප්‍රමාණයක් ජීවිත අහිමි වෙලා තියෙනවා.

ඒවගේම තවත් මම ඊයේ දිනයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බඩු තියෙනවා. ජනතාවට අවශ්‍ය බඩු ටික තියෙනවා. නමුත් බෙදන්නේ නෑ. ජනතාවට එතෙන්ට එන්න කියලා. අවතැන් වූ ජනතාවට එතෙන්ට ඒමේ හැකියාවක් නෑ. නාය ගිහිල්ලා හැම තැනම වැහිලා. පාරවල් වැහිලා. ගුවනින් බඩු ටික ගෙනියන්නේ. හැබැයි ඒ අයට පහසුකම් සපයන ක්‍රමවේදයක් තාම නිර්මාණය වෙලා නෑ. ඒ සඳහා මොනවා හරි වැඩ පිළිවෙලක් අපේ ඉන්න මන්ත්‍රීවරු යම්කිසි වැඩ කොටසක් කළා කියලා පළාත් සභා මන්ත්‍රීවරු විදිහට අපිට ඇත්තටම සතුටු වෙන්නට පුළුවන්. අපේ ඇමතිතුමා රංජිත් බණ්ඩාර ඇමතිතුමා ගංවතුරට යට වෙලා හිටියත් එතුමා කිව්වේ ග්‍රාම නිළධාරියාට කියන්න අදාල වසමේ සමූපකාරයක් හෝ මොනවා හරි කඩයක් තියෙනවා නම් ඒ අයට වගකීම භාර ගන්න කියන්න. අරගෙන ඒ මිනිස්සුන්ට කන්න දෙන්න කියන්න. හැබැයි අද ඒක ක්‍රියාත්මක වෙනවා. හැබැයි ඊට එහා ගිය වැඩ පිළිවෙලක් අපි කළ යුතුයි. මොකද මේ වනවිට වෙළඳ ආයතන විශාල වශයෙන් හානියට පත් වෙලා තියෙනවා. කහවත්ත ප්‍රදේශයේ අර මෙතුමා කිව්වා වගේ කිසිම දවසක ලොකු ගංවතුරක් ඇවිල්ලා නෑ. ගංවතුරට ලොකු විනාශයක් වෙලා නෑ. නමුත් මෙවර විශාල විනාශයක් වෙලා තියෙනවා. මම ප්‍රාදේශීය ලේකම්තුමියටත් කතා කළහම කිව්වා අඩුම ගානේ මේ පිළිබඳව සංගනනයක්වත් ගත්තාද. අපි කියනවා වෙළඳ ආයතන පිළිබඳව අපි සංගනන අරන් වැඩක් නෑ. ඒක ගෙවීමේ හැකියාවක් නෑ. මේ චක්‍රලේඛ ,අන පනත් ,නීති හැදෙන්න ඕනේ ජනතාවට සහන සලසන්න. එහෙම නැත්නම් ඒ නීති වලින් වැඩක් නෑ. එතනින් එහාට හොරකමකට වෙන දේකට නෙමෙයි. ඒවා වලක්වන්න නීති තියෙන්න ඕනේ.

හැබැයි ජනතාවට සහන සැලසීම සඳහා ඒ නීති වෙනස් විය යුතුයි. මං හිතන්නේ ඒවා පාර්ලිමේන්තුවට දාලා හරි වෙනස් ඒ අයට සහන සලසන්න ඕනේ. හැබැයි පළවෙනි දේ අදටත් ජනතාවට එන බඩු ටික නිසියාකාරයෙන් බෙදී යනවාද කියන එක සොයා බලන්න දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ඒ කටයුතු ටික සිද්ධ වෙනවාද කියලා බලන්න ඕනේ. අපේ පළාත් පාලන ආයතනවල වගකීම 100% ඉෂ්ඨ කරන්න බැරි වෙලා තියෙනවා. අපිට එදා පළාත් පාලන ආයතන ටික තිබුණා නම් මන්ත්‍රීවරු ටික හිටියා නම් ගමේ වෙන දේ අපිට කතා කරනවා. අද ඒ හිටපු මන්ත්‍රීවරු ටික හෝ කතා කරනවා. පක්ෂ විපක්ෂ භේදයක් නෑ. හැම මන්ත්‍රීවරයාට කතා කරනවා. මම ඊයේ අයගම ප්‍රදේශයට ගියා එහි හිටපු සභාපතිතුමා, විපක්ෂනායකතුමා දෙන්නාම එතන ඉන්නවා. හැබැයි එතුමන්ලා දෙන්නා අසරණයි. යම්කිසි බලයක් යොදවන්න බෑ . ඇහේ හයියයි හිතේ හයියයි තියෙන්නේ එතුමන්ලාට. එතුමන්ලාට යම් ශක්තියක් දෙන්න කිසිම කෙනෙක් නෑ. මොකද සන්නිවේදනය නෑ. ඊයේ දවල් දෙක වෙන කොට තමයි දුරකථන ටික වැඩ කරන්න පටන් ගත්තේ. දවස් තුනක් තිස්සේම දුරකථනයක්වත් වැඩ කරන්නේ නෑ. එතුමන්ලා ඊට පස්සේ තමයි තැන් තැන්වලට කතා කරලා ඉවර වෙලා අවශ්‍ය පහසුකම් ටික ඉල්ලුවේ. ප්‍රධාන ඇමතිතුමා අපිට බැකෝ යන්ත්‍ර ටික ලබලා දුන්නා. මම ගියේ පොතුපිටිය හරහා ආර්.ඩී.ඒ. එක උදව් කරලා තිබුණා. ආර්.ඩී.ඒ. එක උදේ ඉඳන් වැඩ පටන් අරන් තිබුණා. බැකෝ යන්ත්‍ර කුළියට අරගෙන ඊට අමතරව අපි පළාත් පාලන ආයතනවල බැකෝ යන්ත්‍ර දාලා තවත් වැඩ කරනවා. එහි තාමත් තියෙනවා භූවිෂමතාවල ප්‍රශ්නයක්. තාමත් නාය යන තත්ත්වයක් තියෙනවා. පුපුරලා යන තත්ත්වයක් තියෙනවා.

හැබැයි අපි ඒ තැන් වලින් පාරවල් හදනවාද නැද්ද කියන එකට කරන්න භූවිද්‍යා එකෙන් හැකි ඉක්මනින් නාය එනවා කියන තැන් වලට පතල් හා කැනීම් කාර්යංශයෙන් යවලා ,ඒ තැන් වලට නාය එනවාද නැද්ද කියලා බලන්න ඕනේ. අයගම රෝහල පවා නාය යෑමට ලක් වෙලා තියෙන්නේ. දැන් රෝහල පවත්වාගෙන යන්නේ ප්‍රාදේශීය සභාවේ. එතෙන්ට යන්න පාර තියෙන්නේ නගරයේ ඉඳලා කිලෝමීටර් හතරක් වට රවුමේ තමයි යන්න තියෙන්නේ. ඒකේ ත්‍රීවිල් එකක් පොඩි වාහනයක් තමයි යන්නේ. ලොකු වාහනයක් යන්න බෑ. ඒවගේම පොලීසිය මැදිහත් නොවුණා නම් මීට වඩා ජනතාව විනාශයට පත් වෙන්න තිබුණා. පොලීසිය තමයි බලහත්කාරයෙන් මිනිස්සු එතනින් ඉවත් කරලා තියෙන්නේ නාය ගිය හරිය. ඒවගේම අපේ කිරිබත්ගලකන්ද නාය යනවා. අපි බැකෝ යන්ත්‍ර ,ස්කැවේටර් එහෙන් මෙහෙන් හොයලා යැව්වා. යැව්වාට එවා ප්‍රමාණවත් නෑ. හැබැයි එතෙන්ට විශාල ප්‍රමාණයේ එස්කැවේටර් යන්ත්‍ර ගෙනියන්නත් බෑ. පොඩි ඒවා තමයි ගෙනියන්න වෙන්නේ. දැනට තියෙන එස්කැවේටර් කැඩිලා. ඒ තැන්වලට මොනවා හරි යවලා මොකද එතන විශාල ගල් සහිත ප්‍රදේශයක්. බැකෝ යන්ත්‍ර වලට අමතරව එස්කැවේටර් යන්ත්‍ර එතෙන්ටත් අයගමටත් ඒ ප්‍රදේශවලට යන්ත්‍ර සූත්‍ර ටිකක් යවලා ජනතාවට සහන සලසන්න මොකද මේ කැටේපොළ,මඩබද්දර යන ප්‍රදේශවලට කිසිම සහනයක් ලැබිලා නෑ. ඒ නිසා මේ පිළිබඳව දැනුවත් කරලා මේක පළාත් සභාවේ මේ සාකච්ඡා කළා වගේ කමිටුවක් අපි හදලා අපි මන්ත්‍රීවරු එක එක්කෙනාගේ ස්වෙච්ඡාවෙන් අපි ඒ ඒ තැන් වලට යමු. මේ වෙලාවේ අපි ඡන්ද මනාප හොයන එක නෙමෙයි කරන්න ඕනේ ජනතාවට සහන සැලසීම. ඒ නිසා අපි සියළු දෙනාම එකතු වෙලා හරි අපි ඒ අයට දැන් පළාත් පාලන ආයතන නැති නිසා පළාත් පාලන වලට දිගින් දිගට ගිහිල්ලා හරි ඒ තැන්වල ඒ අවශ්‍යතාවය ඉෂ්ඨ කරන්න කටයුතු කරමුයි කියමින් අපේ ප්‍රධාන ඇමතිතුමා ඒවගේම අපේ සමාජසේවා ඇමතිතුමාටත් අපේ ස්තූතිය හා ගෞරවය පිරිනමමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තූතියි ගරු නිලන්ත ජයකොඩි මන්ත්‍රීතුමාට. මීළඟට ගරු අධ්‍යාපන අමාත්‍ය භාණු මුණිප්‍රිය අමාත්‍යතුමා.

*ගරු අමාත්‍ය භාණු මුනිප්‍රිය*
*கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய* *Hon. Minister Bhanu Munipriya* -----------
-------------------------------------------------

ගරු සභාපතිතුමනි ඔබතුමාට මම ඉතාම ගෞරවනීය ස්තූතිය පුද කරනවා. සබරගමු පළාත් සභාවේ මේ සිදුවී තිබෙන ආපදා තත්ත්වය ප්‍රධාන පළාතක් වන සබරගමු පළාතේ සභාව ඒ සම්බන්ධයෙන් කතා කිරීමට පූර්ණ අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන්. ඒවගේම අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට අපි සියළු දෙනාගේම ගෞරවය මේ අවස්ථාවේදී පුද කරනවා. ඊයේ දිනයේ ආපදා තත්ත්වය සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කමිටුව හැටියට සියළු දෙනා රැස් කරලා අවශ්‍ය කාරණා ඉෂ්ඨ කිරීමට කටයුතු ඉටු කිරීම සම්බන්ධයෙන්. එතුමාගේ පැමිණීමෙන් එතුමා බලාපොරොත්තු වෙන පළවෙනි

ප්‍රශ්නය තමයි ඊයේ දිනය වෙන කොට තවමත් ජීවිත අනතුරට ලක්වීමට හැකියාවක් තියෙන ජනතාව කොහේ හරි ඉන්නවාද. කිසිම තැනක සබරගමුවේ මේ ආපදා තත්ත්වය හේතු කරගෙන කෙනෙක්ගේ ජීවිතයට අනතුරක් මේ වනවිට තියෙනවා නම් ඒක කොහොමද මේ ජීවිතය බේර ගන්නේ. ඒක තමයි පළවෙනි ප්‍රශ්නය වුණේ. දෙවෙනි එක විදුලිය විසන්දිවීම කොහොමද ක්‍රියාත්මක කරන්නේ. පානීය ජලය ලබාදීම. ඇතුළට යන්න පුළුවන් ගම කලවාන,අයගමට ඒ අයට කෑම ලබාදීම සඳහා තවමත් ප්‍රවේශවීමට පුළුවන්කම තිබුණාද නැත්නම් කොහොමද ඒකට ඇතුල් වෙන්නේ. ඇතුල් කිරීමට නියෝග කළා. ඒවගේම අධ්‍යාපනය,සෞඛ්‍ය සම්බන්ධයෙන් අදාල වෙන කාරණා නිළධාරීත් එක්ක කතා කරලා දේශපාලන අධිකාරියට අදහස් ඉදිරිපත් කිරීමට ඉඩ දීලා අවශ්‍ය කටයුතු සඳහා එය ක්‍රියාත්මක කිරීම පසුවිපරමක් කිරීමත් ඒ සම්බන්ධයෙන් නියෝගදීමට සබරගමුවට පැමිණීම සම්බන්ධයෙන් අපගේ අතිශය ගෞරවය අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඇතුළු ඒ ප්‍රධාන නායකයින්ට මම පුද කරන්න කැමතියි.

අධ්‍යාපන මට්මට සම්බන්ධයෙන් දැන් අද මේ වෙන කොට තියෙන වාර්තාවල් අනුව සබරගමුවේ රත්නපුර දිස්ත්‍රික්කයේ අපිට අදාලව කෑගල්ල දිස්ත්‍රික්කයටත් අදාලව මරණ 79 කුත් අතුරුදහන්විම් 29 කුත් තිබෙනවා. මේවා එකතු වුණොත් මේ දෙක එකතු වුණහම 108 ක් පවුල් 36511 ක් ආපදාවට ලක් වෙලා තිබෙනවා. පුද්ගලයේ එක්ලක්ෂ හතළිස්දාස් නවසිය අනූහතක්. කඳවුරු එකසිය අසූහතක්. ඒ අතර අවතැන් කඳවුරු සහිත පාසැල් ගණන 21 දක්වා මේක වර්ධනය වෙලා තියෙනවා. ගණන මෙතන මට දැන් කියන්නට බැහැ. අද උදේ වාර්තාවට තව එකතු වෙන්නට ඕනේ. පාසැල් 21 යි. රත්නපුරට 20 යි. දෙහිඕවිට අවතැන් කඳවුරු එකයි. මම මේ කියන්නේ අධ්‍යාපන කලාප මට්ටමින්. කෑගල්ලට එකයි. රත්නපුර 20 යි. හානි වෙච්ච පාසැල් 48 කට මෙහි සඳහන් වුණත් 62 දක්වා දැන් වර්ධනය වෙලා තියෙනවා. මේ වෙන කොට 48 සංඛ්‍යා ලේඛණ ගන්න කොට සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයට පාසැල් 40 ක් හානි වෙලා තියෙනවා. 08 ක් කෑගල්ල දිස්ත්‍රික්කයේ එකක් දෙහිඕවිට කලාපයේ තියෙන්නේ. මේක 62 වෙච්චි එකේ වාර්තාව අපි ගාව තියෙනවා. පස්සේ දෙන්න පුළුවන්. ශිෂ්‍ය මරණ 16 යි. රත්නපුර දිස්ත්‍රික්කයේ 14 යි. දෙහිඕවිට කලාපයේ ශිෂ්‍ය දෙදෙනයි. අපේ මන්ත්‍රීතුමා කිව්වා වගේ. ගරු සභාපතිතුමනි අපි අවුරුදු ගාණක් මේ ප්‍රදේශයේ දේශපාලනය කරපු නායකයෝ. අපිට තියෙනවා මේ ප්‍රශ්න කතා කරන්න ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව කියලා එකක්. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව කියලා තව එකක් තියෙනවා. ගිය අවුරුද්දේ ගංවතුර ආවා. ඒකෙන් යට වුණෙත් ඇලපාත ,අයගම,කලවාන, රත්නපුර කොටස්. අංගම්මන ඒ කොටස් ලොකු හානියක් සිද්ධ වුණා. ඊට ඉස්සෙල්ලා අවුරුද්දේත් ගංවතුර ආවා. මේක අවුරුදු ගාණක් මේ ප්‍රදේශයේ ජනතාවට ගංවතුර එන කොට ගංවතුරට හුරුයි. හුරු නැත්තේ නාය යෑම්වලට පමණයි. හැබැයි මේ හුරු වෙච්ච ජනතාවගේ දුක දන්න දේශපාලන නායකයෝ හැටියට ගංවතුරක් එන කොට ජීවිත හානියට අනතුරක් වෙන කොට ඒවා බේරා ගැනීමට උපකරණයක් ඒහා සමානව සාධාරණව අපි ඒවාට සූදානම් කරලා තිබුණාද කියන කාරණය සම්බන්ධයෙන් බලන කොට දේශපාලන වගකීමක් තියෙනවා. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ වගකිමක් තිබෙනවා රත්නපුර නගර සභාවට කොච්චර බෝට්ටු තියෙන්න

ඕනේද කියලා. අයගම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට වගකීමක් තිබෙනවා අයගම හැමදාම යට වෙනවා නම් ඒකේ පවුල් කීයද යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වෙන බෝට්ටු අර ජනතාවට ගේන්න පුළුවන් අඟුල් කොපමණ ප්‍රමාණයක් මහා වැස්සක් ආවොත් තියෙන්න ඕනේද කියන කාරණය අපි සාකච්ඡා කරනවා. එම නිසා ගරු සභාපතිතුමනි ප්‍රශ්නයක් එන කොට ඒකේ වගකීමත් අපිට තුන් ආකාරයට තියෙනවා. එකක් තමයි දේශපාලන වගකීම. දේශපාලනය කරපු අය. ජනතාවගේ ඡන්දයෙන් පත් වෙච්චි ප්‍රාදේශීය සභාව, පළාත් සභාව හා පාර්ලිමේන්තුවේ දිස්ත්‍රික් නායකයින්ගේ වගකීමක් තියෙනවා. ඊළඟට තියෙනවා කාලගුණ විපර්යාස නිසා වෙනස් වෙච්චි ඒවා අපිට වලක්වන්න බෑ. ඊළඟට තියෙනවා ජනතාවගේ වගකීම. ජනතාව ගංගාදාරයේ ගෙවල් හදනවා. දැන් නගරවල ගොඩනැගිලි හදන කොට ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ පරීක්ෂා කළාට පස්සේ ඊළඟට පරිසර අමාත්‍යාංශයෙන් පරීක්ෂා කළාට පස්සේ ඒගොල්ලන්ට වගකීමක් තියෙනවා තට්ටු දෙකේ තුනේ ගොඩනැගිලි හදන කොට ජල ටැංකියක් ඒ ගොඩනැගිල්ලේ තියෙන්න ඕනේ. ඇයි ගිනි ගැනීමක් ආවොත් ඒ ගොඩනැගිල්ල වහාම ගින්න නැවැත්වීම සඳහා අවශ්‍ය ප්‍රමාණයෙන් ජලය ඒ ගොඩනැගිල්ල තුළ තියෙන්න ඕනේ. එතකොට සමහර ක්‍රියාකාරිත්වය නිසා ජනතාව මේවා ගිහිල්ලා අල්ල ගත්තහම මේවා සම්බන්ධීකරණ කමිටුවට ආවට පස්සේ අපිම කියනවා ඒගොල්ලන්ගේ ජීවනෝපාය ඉන්න අරින්න කියලා කියනවා. ජනතා නියෝජිතයෝ වැලි ගොඩ දැමීම ,මැණික් ගැරීම පරිසරයට හානි කරන ආකාරයේ ගොඩනැගිලි තැනීම මේවාට අපේ වගකීමක් තිබෙනවා. හැබැයි ගරු සභාපතිතුමනි අපිට මේවා ඉදිරියේත්

එනවා කියලා දැනගෙන එදා අතිගරු ජනාධිපතිතුමා ආපු වෙලාවේ වරුණ ලියනගේ ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව මම හිතනවා මේ පළාත් සභාවේ නැවත යෝජනා කරලා ස්ථිර කර ගන්නට ඕනේ. අපිට අවුරුදු 29 ක් පළාත් සභා ක්‍රමයට තියෙන හැකියාව මේවාට මුහුණ දීම අපි සංවිධානය කරගෙන තියෙනවාද. අපි සංවිධානය කරගෙන නෑ. සමාජසේවා සුභසාධන අමාත්‍යතුමා ඉන්නවා. අපි ආපදා අවස්ථාවකට රැස් වෙන්න නායකයෙක් ඉන්නවාද. ආපදාව සම්බන්ධයෙන්. අපේ ප්‍රධාන ඇමතිතුමා ඉන්නවා ඒක හරි. එතුමාට ඒවා කරන්න පුළුවන්. අපි ඒ ආපදාව සඳහා ඒ ඇමතිවරයාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් හදලා එහෙම එකක් වුණා නම් ඒ රාජ්‍ය නිළධාරීන් ඒකේ සමතැන්වල තියලා ඉන්න නිළධාරීන් එහෙම එකක් වුණා නම් වහාම ක්‍රියාත්මක වෙන්නට ඕනේ. අපිට ක්‍රියාත්මක වෙන්නට ආයතනයක් තිබුණේ නෑ. එම නිසා අපි මේ පළාත් සභාවෙන් කරපු වගකීම ඉෂ්ඨ කිරීමට හුදෙක් තනියෙන් පුද්ගලයෙක් තනියෙන් ඔහු විසින් කැපවීමක් පමණයි.සංවිධානගත නෑ. ඒක සමාජ සුභසාධන අමාත්‍යාංශය විසින් කරපු වගකීමක්. ඒක හරි. නමුත් සමස්ත පළාත් සභාව බද්ධ කරලා ඒකට අවශ්‍ය දේවල් සබරගමු පළාතේම බෝට්ටු තියන්න පුළුවන්. මෙතන කුරුවිට හමුදාව තියෙනවා. පළාත් සභාවයි ඒ හමුදාවයි එකතු කරන්න පුළුවන්. ඒකට ඕනේ නම් අපිට කියලා නාවික හමුදාවේ නිළධාරීන් ගණනාවක් මේකේ ගෙනල්ලා තියාගන්න පුළුවන්. අදාල කාල පරිච්ඡේදය තුළ. අපි දන්නවා මේ නාය යාම ,ජල ගැල්ම සබරගමුවට රත්නපුරට එන්නට ඇවිල්ලා තියෙන්නේ ඉතිහාසයේ කොයි කාලයේද කියලා බලන්න පුළුවන්. ඒක විවිධ වෙලාවේ ඇවිල්ලාද . ඒක හිතා ගන්න බැරි වෙලාවේ ඇවිල්ලාද. නැත්නම් ජනවාරි මාසයේ ඉඳලා ජූලි

මාසය දක්වා විතරද ඇවිල්ලා තියෙන්නේ. එහෙම නැත්නම් අප්‍රේල් මාසයේ ඉඳලා ජූලි මාසය දක්වා විතරද ඇවිල්ලා තියෙන්නේ. ඒ කාලයට අපේ කුරුවිටට නාවික හමුදාව ගෙනල්ලා ඊට පස්සේ අවශ්‍ය බෝට්ටු ටික අපි මුදල් දීලා පළාත් සභාවෙන් අරගෙන එතෙන්ට තියලා. හදිස්සියක් වෙන කොට ඇලපාතට යන්න. හදිස්සියක් වෙන කොට අයගමට යන්න. හදිස්සියක් වෙන කොට කලවානට යන්න ගරු සභාපතිතුමනි මේ පාරවත් අපි එකතු වෙලා කතා කරලා මේක තීන්දු කරන්න අවශ්‍යයි. මේ රට හදීසි ආපදා තත්ත්වයකට පත්වෙමින් තිබෙන රටක් කියලා ස්වභාවධර්මයා විසින් ඔප්පු කරලා තිබෙනවා, තව වතාවක්. මුහුදුකරයේ ජීවත් වෙන ජනතාවට මුහුදු ගැල්ම, සුනාමි එන්න පුළුවන් කියලා දැන් පේනවා. ඊයේ පෙරෙයිදා බෙංගාල බොක්කේ මෝරා කියලා සුළි සුළඟක් ආවා. සුළි කුණාටුව දැන් බංග්ලාදේශයට ගියා. කිලෝ මීටර් 120 ක වේගයක්. ඒක ලංකාව පැත්තට ඇවිල්ලා ඉන්දියාවෙයි 120 ක් මැරුනා. එතකොට ඒක ලංකාවටත් ඇවිල්ලා ගියේ. 120 ක් මරුනා. හැබැයි දැන් බංග්ලාදේශයට ඉතාම බරපතල තත්ත්වයට යනවා. ඒ අය සම්පූර්ණ නිවාස, ඒ ප්‍රදේශ ඉවත් කර ගන්නවා ඊයේ පෙරෙයිදා ඉඳන්. දැන් දවස් ගාණක ඉඳන්. බංග්ලාදේශයේ මිලියනයක් ජනතාවට බලපානවා. මම ඉතා කෙටියෙන් ඉවර කරන්නම්. දැන් ඊළඟට අපේ වියලි කලාපයට නියගය එනවා. ඒක ආපදාවක්. මේ පැත්තෙන් තෙත් කලාපයට ගංවතුර එනවා. කඳුකරයට නාය යෑම් යනවා. සුළි සුළඟ එනවා. මේක වර්ෂය හරියට අරගෙන බැලුවාම වර්ෂය අපට බෙදා ගන්න පුළුවන්. කඳුකරයට කොයි කාලෙද ? තෙත් කලාපෙට කොයි කාලෙද ? අර පැත්තට කොයි කාලෙද ? එහෙම. ඉතින් ඒ නිසා මේක ගරු සභාපතිතුමනි, පළාත් සභාව විසින් විශ්ලේෂණය කරගෙන, පළාත් සභාව විසින් අපේ පළාත් සභාවේ ඔබතුමාට මම කියන්නම් හරියටම. අපේ පළාත් සභාවේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 17 න් රත්නපුර දිස්ත්‍රික්කයේ මේකට බලපෑවේ හයයි හෝ හතයි. ඊට වඩා නැහැනේ. අඩුම තරමේ අටක් හෝ නවයක ඇත්තෙම නෑ. බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකේම නෑ. ඇඹිලිපිටිය කොට්ඨාස තුනේම නෑ. එහෙම ගත්තාම අපට ඉලක්ක කරගන්න පුළුවන් මේ ප්‍රශ්නය. කලාපීය වශයෙන් ගත්තාම අධ්‍යාපන කලාප හතෙන් තුනක පමණයි ප්‍රශ්නය තියෙන්නේ. දෙහිඕවිට කලාපෙයි, නිවිතිගල කලාපෙයි, රත්නපුර කලාපෙයි විතරයි. අනෙක් හතරෙම නෑ. එමනිසා ගරු සභාපතිතුමනි, මේ ජල ගැල්ම කියන කාරණය නම් ජනතාව දන්නවා. ඒ පැත්තට විතරමයි එන්නේ. ඒක පාලනය කිරීම, ඒකට අවශ්‍ය දේවල් ලබා ගැනීම දේශපාලන නායකයෝ හැටියට අපේ වගකීමක්.

ඒක නිසා තමයි මම කියන්නේ එදා මේ ප්‍රශ්නය දැනගෙන අපේ බලන්ගොඩ කට්ටිය අංගම්මන ගියා. අංගම්මන වහලයක් උඩ ඉඳගෙන මට දුරකථනයෙන් කථා කළා. මම ප්‍රාදේශීය ලේකම්තුමියට කථා කළා. ඒ පාර එතුමිය කිව්වා අනේ කොහොම හරි බෝට්ටු ටිකක් හොයන්න මන්ත්‍රීතුමා. මේ කඳවුරුවල ඉන්න කට්ටිය එකක්. වහල උඩ ඉන්න කට්ටිය තව එකක්. එන්න බැරුව හිර වෙලා ඉන්න කට්ටිය එකක්. එහෙමයි මේ එක්ලක්ෂ ගාණ හැදෙන්නේ ගරු සභාපතිතුමනි. ඉතින් මම බය වුනා මේගොල්ලෝ ජීවිතක්ෂයට පත් වෙයිද ? මොකද වෙන්නේ ? මම ගරු රංජිත් බණ්ඩාර මැතිතුමාට කථා කළා. එතුමාට කථා කරලා දුරකථන අංක සම්බන්ධ කළා. එමනිසා අංගම්මන පැත්තේ හිරවෙලා හිටපු ගෙවල් හතරක ජනතාව, එතන අනිවාර්යයෙන්ම කොටු වෙන තැනක්. ඒ කට්ටිය අරගෙන එළියට එන්න පුළුවන්කම

ලැබුණා. මම කථා කළා අනෙකුත් දේශපාලන නායකයින්ට. ඔරු ගේනවා. බෝට්ටු ගේනවා. හොරණ පැත්තේ ඉංගිරිය පැත්තේ හිර වෙලා. දැන් අපි මේ ගංවතුර ගලනකොට ගේන්නේ. මම කියන්නේ ඒකයි. අපේ ලොකු වගකීමක් තියනවා ඉෂ්ඨ නොවුන. ඒ ඉෂ්ඨ නොවුන වගකීම ඉෂ්ඨ කිරීමට මේ අවස්ථාවේවත් හරියට කටයුතු කරන්න ඕන කියන කාරණය කියමින් ගරු සභාපතිතුමනි, අපේ පළාත් සභාවේ මේ සම්බන්ධයෙන් දීර්ඝ කාලයක් ඉදිරියට පවත්වාගෙන යන කමිටුවක් සකස් කිරීම සඳහා අවශ්‍ය ප්‍රඥප්ති කාරක සභාවට හරි දාලා, යෝජනා සියළුදෙනාගෙන් අරගෙන සියළුදෙනා එකතු වෙන ආකාරයකට මේකට මුහුණ දීම සඳහා වැඩ පිළිවෙලක් හදන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලනවා. ඒ වගේම ජාතික තළයේ තිබෙන ආපදා කළමනාකරණ කමිටුවට සියළුම විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය එකට එකතු කරපු කමිටුවක් හදන්න කියලා මම ඉතාමත්ම ගෞරවයෙන් යෝජනා කරනවා. එක එක මාධ්‍යය එක එක විදිහට මේකට මැදිහත් වීම වෙනස් කරලා එක ජාතික ආපදා කමිටුවක් හැටියට මැදිහත් කිරීම ඉතාම සුදුසුයි කියන කාරණයත් කියමින් ගරු සභාපතිතුමනි, ආණ්ඩුකාරතුමාගේ උපදෙස් මත අපේ ප්‍රධාන ඇමතිතුමා මේකෙදී කරනු ලැබූ කැපවීම්, සමාජ සුභ සාධන ඇමතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලා කරපු කැපවීම්වලට ගෞරව කරමින් මේ වගකීම් අපි භාර අරගෙන ඒ අනුව ඉදිරියේ දී මේවාට මුහුණදීමට අවශ්‍ය වන්නා වූ සියළුම උපකරණ, මේ වෙනුවෙන් ලබාගෙන, ඒ වෙනුවෙන් ජනතාව දැනුවත් කරලා ජනතාවට දැනුවත් කිරීමේ ප්‍රමාණය වැඩි කරලා අපිත් මැදිහත් වෙලා මේ ජීවිත අනතුරට වන්නට තියන තත්ත්වයන් අවම කරගෙන මෙයට සභාවක් වශයෙන් පළාත් සභාවේම ජීවත් වෙන ජනතාවත් එක්ක එකට එකතු වෙලා මේවාට මුහුණ දීමට ඉතාමත්ම විශ්වාසයෙන්, ඉතාමත්ම සැළසුම් සහගතව මුහුණ දීමට හැකි අවස්ථාවක් උදාකර ගනිමු කියමින් මිය ගිය, අතුරුදහන් වුන, අනතුරට පත්වුන, පීඩාවට ලක්වුන සබරගමුවේ ජනතාවට, ලංකාවාසී සියළුම ආපදාවට ලක්වුන ජනතාවට සබරගමුව පළාතේ ශෝකයත්, ඒ වගේම මියගිය අයට අපේ දර්ශණය අනුව නිවන් සුව ප්‍රාර්ථනා කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි !

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු භාණු මුණිප්‍රිය ඇමතිතුමාට. දැන් වේලාව පෙරවරු 11.50 යි. මෙම ගරු සභාව තේ පානය සඳහා මිනිත්තු 10 කට නවත්වනවා. නැවත මධ්‍යාහ්න 12.00 ට සභාව රැස්වෙනවා.

(තේ පානයෙන් පසු සභාව යළි රැස්වේ)

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

තේ පානයෙන් පසුව මෙම සභාවේ කටයුතු ආරම්භ කරමින් නිහාල් ෆාරුක් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

*ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක්*
*கௌரவ உறுப்பினர் நிஹால் பாறுக்* *Hon.Member Nihal Farook* -
-------------------------------------------

ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, වර්තමානයේ රට තුළ ඇතිවෙලා තිබෙන ඒ වගේම සබරගමුව පළාතට බලපාලා තිබෙන අයහපත් ආපදා තත්ත්වය පිළිබඳව සාකච්ඡා කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳ. මේ පිළිබඳව මම ගිය සභාවාරයේ ආපදා සම්බන්යෙන් යෝජනාවකුත් මේ පළාත් සභාවට ගෙනාවා. ඒක ගෙනල්ලා සතියකින් තමයි යළිත් අපි ගිය අවුරුද්දේ මැයි මාසය වෙනකොට කෑගල්ල දිස්ත්‍රික්කයට විශාල ආපදා තත්ත්වයක් ඇති වෙලා අවුරුද්දක් ගතවෙනකොටම අද නැවතත් අපේ සබරගමුව පළාත තුළ ඒ වගේම අනෙකුත් දිස්ත්‍රික්ක කීපයකට මේ ආපදා තත්ත්වය බලපාලා තිබෙනවා. ප්‍රථමයෙන්ම මම මේ ආපදා තත්ත්වය නිසා ජීවිත හානියට පත් වුන, ඒ වගේම ඒ ව්‍යසනයට පත් වුන සියළුදෙනාටම අපගේ ශෝකය මේ අවස්ථාවේ දී කණගාටුව ප්‍රකාශ කරන්නට මම මේක අවස්ථාවක් කරගන්නවා.

විශේෂයෙන්ම මේ ස්වභාවික ව්‍යසනයත් එක්ක විශාල ජීවිත හානි, දේපළ හානි ඇති වෙලා තිබෙනවා. ඉතින් අපි දන්නවා පහුගිය වර්ෂයේ කෑගල්ල දිස්ත්‍රික්කයේ විශාල නාය යෑමක් සිද්ධ වුනා. ඒ වගේම ගංවතුරත් එක්ක විශාල ජීවිත හානියක් සිද්ධ වුනා. ඒක ඉවර වෙලා අවුරුද්දක් යනකොටම අපට නැවතත් මේ වගේ ස්වභාවික විපතකට මුහුණ දෙන්නට සිද්ධ වෙලා තිබෙනවා. ඉතින් මේ පිළිබඳ අපි හැමදාම කථා කරනවා. අපි මේ ගංවතුර තත්ත්වයට, නාය යෑම් අවස්ථාවලට මුහුණ දීපු පළවෙනි අවස්ථාව නෙමෙයි. ඉතින් අපි රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්ක දෙකේ අපේ ජනතාව නොයෙකුත් අවස්ථාවල දී මේකට මුහුණ දීලා තිබෙනවා. ඉතින් දැන් එල්ල වෙන චෝදනාව මේකට හරියට වැඩ පිළිවෙලක් තවම සකස් කරලා නෑ කියන එක. ඉතින් ඇත්ත වශයෙන්ම සෑම රජයක්ම, ආණ්ඩුවක්ම උත්සාහ දරනවා මේ එන ස්වභාවික විපත්වලට කොහොමද අපි මුහුණ දෙන්නේ ? කොහොමද මේ ජනතාවට සහන සළසන්නේ ? කොහොමද ජනතාව බේරා ගන්නේ කියන එක පිළිබඳව හැමදාමත් කථා කරනවා. හැමදාමත් මේ පිළිබඳව වැඩ පිළිවෙලවල් සකස් කරන්න ඕන කියලා අදහස් දක්වනවා. නමුත් තවමත් මේක හරියට දේශපාලඥයන්ට ඒ වගේම රජයේ නිළධාරීන්ට එක්ව තවමත් මේක හරියට අපට පිළිවෙලකට හදාගන්න බැරිවෙලා තිබෙනවා. ඒක තමයි අපි දකින අඩුපාඩුව. විශේෂයෙන්ම මේ ව්‍යසනයට පත් වෙන්න මාසයකට කලින් අපේ ආපදා කළමනාකරණ අමාත්‍යතුමා කෑගල්ල දිස්ත්‍රික්කයට පැමිණියා. පැමිණිලා විශේෂයෙන්ම ඉදිරියේ දී එන ආපදා තත්ත්වයන් පිළිබඳව, ඒකට මුහුණ දෙන ආකාරය පිළිබඳව විශේෂ කමිටුවක් එතුමා පත් කරලා මේකට සූදානම් වෙන මොහොතක තමයි මේ ව්‍යසනයට අපි මුහුණ දුන්නේ. විශේෂයෙන්ම කෑගල්ල දිස්ත්‍රික්කයේ තමයි මේක පටන් ගත්තේ. ඊළඟට රත්නපුරට, අනෙකුත් දිස්ත්‍රික්කවලට මේ කමිටු පිහිටුවීමේ අවස්ථාව තිබුණා. නමුත් අවාසනාවකට අපට මේ ව්‍යසනයට ඉක්මණින්ම අපට නැවතත් මුහුණ දීමට සිදුවීම කණගාටුදායක තත්ත්වයක්. ඒ වගේම අපේ අජිත් ශ්‍යාමින්ද මන්ත්‍රීතුමාත් දන්නවා අපේ කෑගල්ල දිස්ත්‍රික්කයට මේ ගංවතුර සහ නායයෑම් වලින් දැඩි බලපෑමක් නොවුනත් විශේෂයෙන්ම දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අපේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් දෙදෙනෙක් ජීවිතක්ෂයට පත් වුනා. ඒ වගේම තවත්

කාන්තාවන් දෙදෙනෙක් මරණයට පත් වුනා, නාය යෑම නිසා. ඒ වගේම ගංවතුරෙන් පවුල් 1500 කට වැඩි පිරිසක් මේ ව්‍යසනයෙන් හානියට පත්වෙලා තිබෙනවා. ඒ වගේම එතුමා ප්‍රකාශ කළා ඒ ප්‍රදේශයේ ජනතාවට අර සහන, පිටින් එන ආධාර භාරගන්නේ නෑ කියලා තීරණයක් අරගෙන තියනවා කියලා. මම ඒක පිළිබඳව අපේ වැඩ බලන ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් විමසුවා. නමුත් ඒ වගේ තීරණයක් තවම අරගෙන නෑ කියලා තමයි එතුමා ප්‍රකාශ කළේ. ඒ නිසා මම හිතන්නේ ඒ ගැන වැඩිය හිතන්න අවශ්‍යතාවයක් නෑ. යම්කිසි ආධාරයක් කවුරු හරි ගෙනල්ලා දෙනවා නම් ඒක භාරගන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සූදානමින් ඉන්නවා කියන එකත් මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න ඕන. ඒ වගේම මම මෙතන දැකපු දෙයක් තමයි මේ රත්නපුර දිස්ත්‍රික්කයේ විශේෂයෙන්ම රාජ්‍ය නිළධාරීන්ගේ මැදිහත්වීම අඩුයි කියන එක පැහැදිලිව පේනවා. නමුත් මම පැහැදිලිව කියන්න ඕන කෑගලු දිස්ත්‍රික්කයේ දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තමයි මේ ගංවතුරට සහ නාය යෑමට ලක්වුනේ. නමුත් අපේ දිසාපතිතුමා ඒ සිද්ධිය වෙච්ච දා ඉඳලා අද වෙනතුරු විශේෂයෙන්ම අපිත් එක්ක සාකච්ඡා කරලා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අපි එකට වාඩි වෙලා, තීන්දු තීරණ අරගෙන, අවශ්‍ය උපදෙස් ලබාදීලා, දේශපාලන අධිකාරියත් එක්ක එකට එකතු වෙලා ඒ අවශ්‍ය පහසුකම් ටික ජනතාවට ලබාදෙන්නට කටයුතු කළා. ඒ වගේම ග්‍රාම නිළධාරීන්ට කෙලින්ම උපදෙස් දීලා තියනවා ආහාර ඒ අවශ්‍ය ප්‍රදේශවලට ලබාදෙන්න. විශේෂයෙන්ම කඩවල්වලින්, කොතනකින් හරි සමූපකාරයෙන් හරි අවශ්‍ය බඩු ටික අරගෙන උයලා දෙන්න කියලා පැහැදිලිව උපදෙස් ලබාදීලා තිබුණා. ඒක සමහර ග්‍රාම නිළධාරීන්, රජයේ නිළධාරීන් පැහැර හැරලා තියනවා නම් ඒක කණගාටුදායක සිද්ධියක්. මේ පිළිබඳව හොයලා බලලා අපි දන්නවා රජයේ නිළධාරීන් හැටියට ජනතාවගෙන් නඩත්තු වෙන පිරිසක්. ඒ නිසා ඒ අයට වගකීමක් තිබෙනවා මේ වගේ රටේ, ප්‍රදේශයක ව්‍යසනයක් ඇති වෙනකොට ඒ සඳහා තමන්ගේ දායකත්වය සෘජුව ලබාදීම. ඉතින් මේකට යම්කිසි කෙනෙක් යම්කිසි හේතුවක් නිසා මේකට අකුල් හෙළනවා නම් ඒ පිළිබඳ දැඩි තීන්දු තීරණ ගැනීම දේශපාලන අධිකාරියේ වගකීමක් කියන එකත් මම මේ අවස්ථාවේ දී මතක් කරන්න ඕන.

ඒ වගේම අපේ පළාතේ අපි පහුගිය කාලවල්වල අපේ අජිත් ශ්‍යාමින්ද මන්ත්‍රීතුමා කියපු විදිහට ඩෙංගු ව්‍යසනයට මුහුණ දුන්නා. ඒකත් එක්කම දැන් ගංවතුර ඇවිල්ලා ඒක පහවීගෙන යනකොට නැවතත් ඩෙංගු හිස ඔසවන තත්ත්වයක් අනිවාර්යයෙන්ම මතු වෙනවා. මේකටත් අපි මුහුණ දෙන්න වෙනවා. ඒ වගේම පාරවල්, පාළම් විශාල වශයෙන් මේ වෙනකොටත් හානියට පත් වෙලා තිබෙනවා. ඉතින් මේ පිළිබඳව අපගේ විශේෂ අවධානය යොමු කරන්න වෙනවා. ඒ වගේම පාසැල් ගත්තාම වෙලංගල්ල කණිෂ්ඨ විද්‍යාලය මම එදා ගියා ගංවතුර අවස්ථාවේ දී. ඒ පාසැලේ වහළය දිරාපත් වෙලා කඩා වැටෙන්න ඔන්න මෙන්න තත්ත්වයක් තියෙන්නේ. ඒ වගේම දෙහිඕවිට දෙමළ විද්‍යාලය. පහුගිය වර්ෂයේ ඇති වෙච්ච නාය යෑමට ලක් වුනා. නැවතත් මේ අවුරුද්දෙත් ඒ පාසැල නාය යෑමේ තර්ජනයට ලක්වෙලා තිබෙනවා. ඉතින් මේ පිළිබඳව අපේ දැඩි අවධානය යොමු කරලා මේ පාසැල් නැවතත් නඟාසිටුවීම සඳහා විශේෂ වැඩ පිළිවෙලක් සකස් කිරීම මම හිතන්නේ අපේ අධ්‍යාපන ඇමතිතුමාට, පළාත් සභාවට විශාල වගකීමක් තිබෙනවා. ඉතින් මේ පිළිබඳවත්

විශේෂ අවධානය යොමු කරලා අපි මොන දේ කථා කළත් මේ පිළිබඳව, මේ ව්‍යසනයන් පිළිබඳව දේශපාලන අධිකාරියෙන්, ඒ වගේම නිළධාරීන්, මහජනතාව මේ තුන්ගොල්ලෝම එකතු වෙලා යම්කිසි වැඩ පිළිවෙලක් සකස් කළොත් පමණයි මේකට අපිට ඉදිරියේ දී මුහුණ දෙන්න පුළුවන්කම ලැබෙන්නේ. මොකද අපි දන්නවා අනෙකුත් රටවල්වල ගත්තාම කාලගුණ වර්තාව ඒ ජනතාව පිළිගන්නවා. නමුත් අපේ රටේ කාලගුණ වාර්තාව, අනාවැකි ජනතාවට පැහැදිලි කරලා කිව්වාට මේක කිසිම ගණන් ගන්නේ නැති තත්ත්වයක් තිබෙනවා. ඒ පිළිබඳව අපේ විශේෂ අවධානය යොමු කරන්න ඕන. ඒ නිසා මොන තාක්ෂණයෙන් ඉහළ දියුණු රටවල් ගත්තාමත් අපට දකින්න ලැබෙනවා විශාල, මේ වගේ ආපදා වලින් විශාල ජීවිත හානි සිද්ධ වෙන අවස්ථා. ජපානය ගත්තාම, ඇමරිකාව ගත්තාම, අනෙකුත් රටවල් ගත්තාම තාක්ෂණයෙන් දියුණු රටවල්, ඒ වගේම සංවර්ධනය පැත්තෙන් ගත්තාම දියුණු රටවල්. නමුත් මේ ස්වභාවික ව්‍යසන එනකොට මේ තාක්ෂණයට සමහර වෙලාවට මේකට මුහුණ දෙන්න බැරි වෙනවා. සංවර්ධන අංශයෙන් ඉදිරියෙන් හිටියට මේ එන ව්‍යසනයට ඒ අයට මුහුණ දෙන්න බැරි තත්ත්වයක් තිබෙනවා. මේ තත්ත්වය තුළ අපේ පුංචි රටක් හැටියට, සංවර්ධනය වෙමින් පවතින රටක් හැටියට මේ වගේ ස්වභාවික අවස්ථා එනකොට අපට මේවාට පිළියම් යොදනකොට, මේවාට අපි ජනතාවට සහන ලබාදෙනකොට යම් යම් අඩුපාඩු සිද්ධ වෙනවා. නමුත් මේක ඉදිරියේ දී නොවෙන්නට අපි කටයුතු කිරීම තමයි අපි හැම කෙනාගේම වගකීම හා යුතුකම වෙන්න ඕන.

ඒ නිසා මම හිතන්නේ ඒ සඳහා මම ගිය සභා වාරයේ ඉදිරිපත් කරපු ඒ යෝජනාව අනුව අපි සියළුදෙනාම පක්ෂ පාට භේදයකින් තොරව එකතු වෙලා පළාත් සභාවක් හැටියට, අපේ සමාජ සේවා ඇමතිතුමා ඉන්නවා. එතුමාගේ ප්‍රධානත්වයෙන්, අපේ මහ ඇමතිතුමාගේ මූලිකත්වයෙන් අපට පුළුවන් නම් අපට කියලා වැඩ සටහනක් පළාත් සභාව තුළ, අපි දන්නවා කොයි පළාත ද අපේ දිස්ත්‍රික්ක දෙකේ ගංවතුරට මුහුණ දෙන්න පුළුවන්, ඒ වගේම නාය යෑමට ලක්වෙන ප්‍රදේශ කොහේද කියන එක හඳුනාගෙන ඒ සඳහා නිසි වැඩ පිළිවෙලක් සකස් කිරීමට අපට හැකියාවක් ලැබෙනවා නම් ඒක තමයි අපි පළාත් සභාවේ අපි මහජන නියෝජිතයන් හැටියට මේ ප්‍රදේශයේ ජනතාවට කරන ලොකුම සේවය කියන එක මේ අවස්ථාවේ මතක් කරමින්, අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමාට. මීළඟට ගරු සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න*
*கௌரவ உறுப்பினர் சலித கருணாரத்ன*
*Hon.Member Salitha Karunaratne*

---

ගරු සභාපතිතුමනි, පසුගිය දිනක සිදුවූ හදිසි ගංවතුර සහ නාය යෑමෙන් සඳහටම සමුගත් ඇහැළියගොඩ අරබ්බඩ කන්දේ දහතුන්දෙනා, තලාවිටිය වත්තේ

තුන්දෙනා, බෝපැත්තේ තුන්දෙනා, බෝගොඩ කන්දේ එක්කෙනෙක්, දම්මුල්ලෙ දෙන්නා, කරඳන කණුග්ගල්ලෙ පස්දෙනා ඇතුළු ඇහැළියගොඩ විසිහත්දෙනා ඇතුළු රත්නපුර දිස්ත්‍රික්කයේ අසූවකට ආසන්න සංඛ්‍යාවක්, සමස්ත ලංකාවේම 177 දෙනෙක් හා අතුරුදහන් වූ 109 දෙනා වෙනුවෙන් මගේ හිතේ 109 දෙනාගෙන් බොහෝ දෙනෙක් අපි අතරින් වියෝවෙලා ඇති. ඒ සියළුදෙනා වෙනුවෙන් සබරගමුව පළාත් සභාවේ බලවත් සංවේගය ප්‍රකාශ කරන අවස්ථාවට අපි ද ඉතාමත් කණස්සල්ලෙන් එකතු වෙනවා. ගරු සභාපතිතුමනි, මේ හදිසි විපත සිදුවෙද්දී මා පළමුකොට අවස්ථාවක් කරගන්නවා මේ සංඛ්‍යාව මීට වඩා තරමක් හෝ වැඩිවෙන්න තිබ්බා ඒ ඒ ප්‍රදේශවල තරුණයන්ගේ හා පිරිසගේ මැදිහත්වීම නොවෙන්න. උදාහරණයක් විදිහට ඇහැළියගොඩ අරබ්බඩ කන්ද පාන්දර 6.00 ට විතර නාය යනකොට 6.30 ට විතර ගිය ගමේ තරුණයෝ එකතු වෙලා මහා කැප කිරීමක් කරලා යම් යම් අය බේරා ගත්තා. බොහෝ දෙනෙක් බේරාගන්න උත්සාහ කළත් රෝහලට ගේන්න වුනේ, ජීවග්‍රහයෙන් ගේන්න පුළුවන් කමක් වුනේ නෑ. ත්‍රිවිලර්වලින් ගෙනල්ලා පණ තියනවා කියලා බැහැලා අරගෙන ට්‍රොලියේ තිබ්බාම දොස්තර මහත්මයා පරීක්ෂා කරලා කිව්වේ මේ අය මිය ගිහින් කියලා. මම මේ කියන්න හදන්නේ ගරු සභාපතිතුමනි, ඇහැළියගොඩ අරබ්බඩ කන්ද විතරක් නෙමෙයි මේ ලංකාව පුරාම මේ නාය යෑමෙන් විපතට පත් වෙච්ච අය බේරා ගැනීමේ පළවෙනි කාර්යය කළේ ප්‍රදේශවාසී ජනතාව. ඒ නිසා පළාත් සභාවක් විදිහට ඒ බේරාගත්ත සහ අඩුම ගානේ මෘතදේහ පවා ගොඩගත්ත ප්‍රදේශවාසී ජනතාවට අපේ කෘතඥතාවය පුද කරන්න ඕන. ඊට පස්සේ තමයි ආරක්ෂක හමුදාව හා රජයේ ආයතන ඒ මැදිහත්වීම වුනේ.

ඊළඟ කාරණාව ගරු සභාපතිතුමනි, ඉතා කණස්සල්ලෙන් කියන්නේ දැන් උදාහරණයක් විදිහට ඔබතුමා දන්නවා තලාවිටි කන්දේ තාත්තයි, දරුවෝ දෙන්නයි මිය ගියා. ප්‍රදේශවාසීන් නොවෙන්න අඩුම ගානේ මෘතදේහවත් අපට ගොඩගන්න පුළුවන් කමක් ලැබුනේ නෑ. මැදිහත්වීමක් වුනේ නෑ. ගමේ තරුණයෝ ටික එකතුවෙලා බේරා ගන්න බැලුවා. බැරි වුනා. අන්තිමට ලොරියක දාගෙන මළ මිනී තුන රෝහලට ගෙනාවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, අර මෙතනදී කියවුනා වගේ ආපදාවක් එන බව දන්නවා. නාය යන බව දන්නවා. හැබැයි අපේ තියන බරපතල දුර්වලතාවය හින්දා අපට මේ කණගාටුදායක තත්ත්වය මතු වුනා කියන එක ඉතා කණස්සල්ලෙන් අපි මතක් කරන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, ඊට පස්සේ දැන් ඇහැළියගොඩම ගරු සභාපතිතුමනි, ඔබතුමා දන්නවා ස්ථාන තිස් හතරක නාය යෑමේ අවධානම් තියන හින්දා ස්ථාන 34 ක අද සහන කඳවුරු විදිහට පවත්වාගෙන යනවා. හැබැයි මේ 34 තියෙන්නේ හරියටම නාය යන හින්දා ද, නැද්ද කියන කාරණාවවත් පැහැදිලි නෑ. ඇයි මේ ස්ථාන නාය යන ස්ථාන ද කියලා හරියටම විද්‍යාත්මකව සනාථ කරන්න විදිහක් නෑ. ගමේ මිනිස්සුන්ට පොඩි මඩ පාරක් එනවා නම්, කන්දෙ පොඩි පැළුම් පාරක් එනවා නම් ගමේ මිනිස්සු බය වෙනවා, මේ තියන මහා විපතත් එක්ක. ඒ හින්දා ගරු සභාපතිතුමනි, එහෙම තැනක් තියනවා නම් හරියට තොරතුරක් කේන්ද්‍රගත වෙන තැනක් තියෙන්න ඕන. එහෙම තැනක් නෑ. එන්.බී.ආර්.ඕ. එකට මේ පණිවිඩය ගිහිල්ලා කඩිනමින් එතන ඉන්න සංඛ්‍යාව අඩුයි තමයි. සංචිතය අඩුයි තමයි. හැබැයි ඉන්න නිළධාරීන් පවා කඩිනමින් ඒ තැන්වලට යවලා බලලා, මෙතන නිශ්චිතවම නාය යනවා. මෙතනින් ඉවත්

වෙන්න කියලා කියාගන්න ක්‍රමවේදයක් නෑ. උදාහරණයක් විදිහට කැකුණලියැද්ද කන්දේ නාය ගිහිල්ලා තුන්දෙනෙක් මැරුනා. හැබැයි ඊට එහා පැත්තේ ඒ පැළුම් පාර තියනවා කියලා අද ගමේ මිනිස්සු බය වෙලා නාගරුක්ඛාරාම පන්සලට ඇවිල්ලා ඉන්නවා. ඒ මිනිස්සු කියනවා අපට හරියට කියන්න නාය යනවාද ? නැද්ද ? කියලාවත් කියන්න කියලා. අපි ඒකට අසමත්. ගරු සභාපතිතුමනි, මේක මේ ඇහැළියගොඩ විතරක් නෙමෙයි රත්නපුර දිස්ත්‍රික්කයේම නාය යන අවධානම් තැන් තියනවා කියන එක කාරණාවක්. දැන් කියවුනා අයගම, ගවරගිරිය, කොළබෑව අපටත් කථා කරලා කියනවා ඊයේ හවස් වෙනකොටත් ඒ නාය ගිය තැන්වල මිනිස්සු ඉදලා තියෙන්නේ බස් හෝල්ට් එකේ. ඉන්න තැනක් නැතුව. ක්‍රමවේදයක් නෑ ගරු සභාපතිතුමනි. ඒ ගැන අපේ කණස්සල්ල පළ කරන්න කැමතියි.

ඊළඟ කාරණය ගරු සභාපතිතුමනි, දැන් මේ සහන කඳවුරු ගැන කියද්දී මම විශේෂයෙන් සඳහන් කළාට කමක් නෑ ආගම් භේදයෙන් තොරව බොහෝ තැන්වල මේ අය රැකබලා ගන්නේ විහාරස්ථානවල විහාරාධිපති හාමුදුරුවරු. උන්වහන්සේලා මහා කැප කිරීමක් කරලා, ඒ ජනතාවට කන්න බොන්න දීලා තමුන්ගේ කාර්යය භාරය කරනවා කියන කාරණාව නමස්කාර පූර්වකව කියන්න කැමතියි. ගරු සභාපතිතුමනි, දීර්ඝ වශයෙන් කථා කරන්න වෙලාවක් නෙමෙයි මේක. ඒ හින්දා නැවතත් මේ මහා විපතින් විපතට පත් වෙච්ච, මිය ගිය ජනතාව වෙනුවෙන් ශෝකය පළ කරන ගමන් මේ ජනතාව වෙනුවෙන්, අනාථ අසරණ වෙච්ච ජනතාව වෙනුවෙන් සහනදායී ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් වියයුතුයි කියන කාරණාව කෙටි කාලීනව හා දීර්ඝ කාලීනව කියන්න කැමතියි. ගරු සභාපතිතුමනි. මට අවසාන වශයෙන් කාරණාවක් කියන්න දෙන්න. එකක් තමයි කඩිනම් වැඩ පිළිවෙලක් විදිහට පළාත් සභාව මැදිහත් වෙන එක ඇත්ත. අපි ආහාර පාන ලබාදෙනවා සමාජ සේවා අමාත්‍යාංශයෙන්. ඊට පස්සේ වියළි සහනාධාර ලබාදෙන්න ලෑස්තියි, ගරු ඇමතිතුමා කිව්වා පවුල් 1000 ක් වුනත් කමක් නෑ, කියන්න කියලා. ගරු සභාපතිතුමනි, පවුල් දහස් ගාණක් ඉන්නවා තමයි. ඇහැළියගොඩ විතරක් පවුල් 1022 ක්. කුරුවිට පවුල් 280 ක්. කිරිඇල්ලේ පවුල් 300 ක්. මේ විදිහට දහස් ගාණක් ඉන්නවා තමයි. ඒ අයව අපි දවස් කීයක් පළාත් සභාව විදිහට නඩත්තු කරනවා ද කියන ප්‍රශ්නය මතු වෙයි. මීට වැඩිය ගරු සභාපතිතුමනි, අනෙක් පැත්තෙන් ඔබතුමා දන්නවා අර දංකුඹුරේ, මීගස්වැව පැත්තේ කවදාවත් නොහිතපු විදිහට හදිසියේ ගංවතුර ඇවිල්ලා ගෙවල්වල වහළ මට්ටමට ආවාට පස්සේ දරුවන්ගේ පාසැල් පොත් ටික, සහතික පත්‍ර ටික සියල්ලම විනාශයි. ගරු සභාපතිතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශය විදිහට මේ අධ්‍යාපනයේ නිරත දරුවන්ගේ එක් පැත්තකින් පාසැල් පොත් ලබාදීම, නිළ ඇඳුම් ලබාදීම, පාවහන් ලබාදීම සහ විශේෂයෙන් ගරු සභාපතිතුමනි, හෙට අනිද්දා පාසැලට ඇතුළත් කරන ළමයින්ට දැන් ඇතුළත් වීමේ ගාස්තු ගෙවා ගන්න බැරුව මහා කණස්සල්ලෙන් ඉන්නවා. ඒ හින්දා ගරු සභාපතිතුමනි, පළාත් අමාත්‍යාංශයට කියන්න තීන්දුවක් ගන්න කියලා ළමුන්ගෙන් ගාස්තු අය කරන්නේ නෑ කියන එක ප්‍රකාශයට පත් කරන්න කියලා. මේවා අය කරන්න එපා කියලා කියන්න ගරු සභාපතිතුමනි.

ඊළඟට ගරු සභාපතිතුමනි, පානීය ජල ගැටළුව. බරපතල විදිහට දැන් ගංවතුරෙන් ළිං යට වුනාට පස්සේ මිනිස්සුන්ට බොන්න වතුර නෑ. පිටින්

ගේන වතුර බෝතල් වලින් විතරයි ඒ මිනිස්සු යැපෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, කඩිනමින් පානීය ජලය ලබාදෙන්නත්, ඒ එක්කම තියන ලිං ඉසීමේ ක්‍රමවේදයක් හැදෙන්නත් ඕන. විශේෂයෙන්ම පළාත් පාලන ආයතන මැදිහත් වෙලා. ගරු සභාපතිතුමනි, මම දන්නේ නෑ පළාත් පාලන ආයතන විදිහට කොයි තරම් මේකට කාර්යයක්ෂමද ? ශක්තිමත්ද ? කියන කාරණාව. හැබැයි ගරු සභාපතිතුමනි, අපි විශේෂයෙන් බරපතල අවධානය යොමු කරලා මිනිස්සුන්ගේ පානීය ජලය, දවස් කීපයක් වතුර බෝතල් කීපයක් දීලා අපට පවත්වාගෙන යන්න පුළුවන්. හැබැයි ගරු සභාපතිතුමනි, මේක දිගින් දිගට කරන්න පුළුවන් දෙයක් නෙමෙයි. ඒ හින්දා පළාත් පාලන ආයතනවල බරපතල අවධානය යොමු කරලා පානීය ජලය ලබාදීමේ කඩිනම් වැඩ පිළිවෙලක් හැදෙන්න ඕන ගරු සභාපතිතුමනි.

අවසාන වශයෙන් ගරු සභාපතිතුමනි, දීර්ඝ කාලීන වැඩ පිළිවෙලක් විදිහට අපි හැමදාම අර වඳුරෝ ගෙවල් හදනවා වගේ හැමදාම නාය ආවාම මේවා ගැන කතා කරලා අත හරින දෙයක්. ගරු සභාපතිතුමනි, ඔබතුමා හොඳටම දන්නවා අර තලාවිටියේ අමුහේන්කන්දේ තලාවිටිය වත්ත, වැටුම්මල කන්ද, වැටුම්මල පන්සලේ ඉන්නවා. මේ මිනිස්සු හැමදාම නාය යන කතන්දරය එනකොට පන්සලට ඇවිල්ලා මේක අමතක වුනාට පස්සේ ආපහු යනවා. ගරු සභාපතිතුමනි, මේක තවදුරටත් වෙනවා නම් මේක කථා කිරීමේ තේරුමක් නෑ. ඒ හින්දා ගරු සභාපතිතුමනි, මේගොල්ලන්ට මේ නාය යෑමේ අවධානමින් තොර තැන්වල පදිංචි වෙන්න ඉඩකඩ හදලා දෙන්න ඕන. ගරු සභාපතිතුමනි, මේකට ඉතා හොඳ තැන තමයි පරකඩුවේ, බෝධිමළුවේ මැරේකැලේ වත්ත. අක්කර 27 ක් තියනවා. ගරු සභාපතිතුමනි, පහුගිය කුරුවිට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී මේ අක්කර 27 වෙන ව්‍යාපෘතියකට, වෙන පුද්ගලයෙකුට ගන්න කියලා යෝජනාවක් ඇවිල්ලා තිබ්බා ගරු සභාපතිතුමනි. අපි කෑ ගහලා, කෑ ගහලා යෝජනාව නතර කළා. ගරු සභාපතිතුමනි, මම මේක අවස්ථාවක් කරගන්නවා, මේ ගරු සභාවේ මම ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මෙන්න මේකට සභා තීන්දුවක් ගන්න, ඒ අක්කර 27 වෙන පෞද්ගලික ව්‍යාපෘති සඳහා ලබාදෙන්නේ නැතුව මේ විපතට පත් වෙච්ච, නාය යන මිනිස්සුන්ට පදිංචිය සඳහා මේ අක්කර 27 පවරා දෙන්න මේ සභාවේ අනුමැතිය දෙන්න කියන ඉල්ලීම කරමින් ගරු සභාපතිතුමනි, මේ ඇරෙන්න හැමදාම මේක ගැන කථා කරලා වැඩක් නෑ. නැවතත් මේ විපතේ දී මැදිහත් වෙච්ච හැම දෙනාටම, උදව් උපකාර කළ හැම දෙනාටම අපේ ප්‍රසාදය පළ කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි !

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

බොහොම ස්තුතියි ! සලිත කරුණාරත්න මැතිතුමාට. මීළඟට ගරු අන්නමලෙයි බාස්කරන් මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී අන්නාමලයි බාස්ගරන්*
*கௌரவ அண்ணாமலை பாஸ்கரன்*
*Hon Member Annamalei Basgaran*
---------------------------------------------------------------------------------------

ගරු සභාපතිතුමනි, நான் இந்த நேரத்தில் கேகாலை மாவட்டத்திலும் ,இரத்தினபுரி மாவட்டத்திலும் மண் சரிவினால் பாதிக்கப்பட்ட , உயிர் நீர்த்த சகோதர சகோதரிகளுக்கு என்னுடைய ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றேன்.நான் நினைக்கின்றேன் இந்த சமயத்திலே இங்கு வந்திருக்கும் அனைத்து மக்கள் பிரதிநிதிகளும் இந்த மண்சரிவைப் பற்றி கதைக்கின்றார்கள். நான் சற்று வித்தியாசமாக கூற விரும்புகின்றேன். உங்களுக்கு தெரியும் மறைந்த எங்களது முன்னால் ஜனாதிபதி ஜே.ஆர்.ஜயவர்தன அவர்கள் கூறினார்கள், මේ ව්‍යවස්ථාවෙන් මේ ජනාධිපති බලතලෙන් ගෑණු පිරිමි කරන්න බෑ. පිරිමි ගෑණු කරන්න බෑ. ඒ කියන්නේ ඒ තරම් මේ ව්‍යවස්ථාවේ බලතල තියනවා. එහෙම නම් මම අහන්න කැමතියි දෙහිඕවිට දෙමළ මහා විද්‍යාලය ළමයි 1200 ක් ඉගන ගන්න මේ දෙහිඕවිට දෙමළ මහා විද්‍යාලය නාය යෑම සිද්ධ වෙලා අවුරුද්දක් පහුවෙලා ඉවරයි. කාරණාවල් කියන්න පුළුවන්. අරයා අත්සන් කරලා නෑ. මෙයා අත්සන් කරලා නෑ. කැළණිවැලි ප්ලාන්ටේෂන් එකෙන් ඉඩම දීලා නෑ. ඒක නෙමෙයි කතන්දරය. අවුරුද්දක් පහුවෙලා ඉවරයි. ඉස්කෝලෙට ඉඩම දීලා නෑ.

(මේ අවස්ථාවේ දී ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක් මැතිතුමා යමක් පවසයි. අපැහැදිලියි.)

*ගරු මන්ත්‍රී අන්නාමලයි බාස්ගරන්*
*கௌரவ அண்ணாமலை பாஸ்கரன்*
*Hon Member Annamalei Basgaran*
---------------------------------------------------------------------------------------

ඉස්කෝලේ බැදලා ඉවරද ? ළමයි දාලා ඉවරද? ගරු මන්ත්‍රීතුමනි, එදත් ඔබතුමා කථා කරනකොට ඕක තමයි කිව්වේ. මේක දේශපාලනය කථා කරන්න එපා. අවුරුද්දක් වෙලා ඉවරයි. ළමයි නවසීයම මැරුනාට පස්සේද කථා කරන්නේ ? ඔබතුමා දන්නෙ නෑ ඔබතුමා නියෝජනය කරන දෙහිඕවිට ආසනයේ ගංවතුර පිරිලා අඩි 12 ක් එනකොට ඔබතුමා හිටියේ නෑ. මම බලන්න ගියා. එතනට ගියාට පස්සේ ඒ කඩේ හිටපු මනුස්සයා මගෙන් ඇහුවේ මන්ත්‍රීතුමා, අර ඉස්කෝලේ මොනවාද කරන්නේ කියලා මගෙන් ඇහුවා. මම වතුර බලන්න ගියාට පස්සේ. අනාථ වෙච්ච අය බලන්න ගිහාම පස්සේ. ගරු සභාපතිතුමනි, දෙහිඕවිට ඉස්කෝලේ අවුරුද්දක් වෙලා ඉවරයි. මොකුත් වෙලා නෑ. අතිගරු ජනාධිපතිතුමා කෑගල්ලට ඇවිල්ලා, ඔබතුමාත් හිටියා ගරු නිහාල් සහෝදර මන්ත්‍රීතුමනි, ඔබතුමාත් හිටියා. ජනාධිපතිතුමා හිටියා. ලංකාවේ වගකිවයුතු සියළුම නිළධාරීන් හිටියා. ජනාධිපතිගෙන් පස්සේ වෙන කවුද ඉන්න ඕන එතන. අතිගරු ජනාධිපතිතුමා හිටියා. අපේ සජිත් ප්‍රේමදාස ඇමතිතුමා හිටියා. දිගම්බරන් ඇමතිතුමා හිටියා. සියළුම ඇමතිවරු හිටියා. මොනවාද කිව්වේ ?

*ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක්*
*கௌரவ உறுப்பினர் நிஹால் பாறுக்* Hon.Member
*Nihal Farook* -
------------------------------------------

කැබිනට් මණ්ඩලයේ අනුමැතියට දාලා තියෙන්නේ.

***ගරු මන්ත්‍රී අන්නාමලයි බාස්ගරන්***

***கௌரவ அண்ணாமலை பாஸ்கரன்***

*Hon Member Annamalei Basgaran*

---------------------------------------------------------------------------------------

ගරු මන්ත්‍රීතුමා හෙට මැරුනාට පස්සේ කළාට වැඩක් නෑ. මේක අද කරන්න ඕන දෙයක්. අවුරුද්දක් තල්ලු දාලා හරියයිද ? ඒකනේ වෙලා තියෙන්නේ. ඒකනේ දැන් ඔක්කෝම කථා කළේ. ඒකයි මම කථා කරන්නේ. දැන් කළුපහණ වත්ත. අවුරුද්දක් ඉවරයි. දිගම්බරන් ඇමතිතුමා ඇවිල්ලා කිව්වා ගෙවල් 100 ක් දෙන්නම් කියලා. එතන ගියාට පස්සේ මුල්ගල් තිබ්බේ ගෙවල් 16 කට. පවුල් 16 කට. එතකොට ඉතිරි ටික කොහේද යන්නේ ? අන්තිමට ඒ මිනිස්සු නාය යෑම මෙතන සිද්ධ වෙලා එතනම මුල්ගල් තියලා තියනවා. අද වෙනතුරු ගරු මන්ත්‍රීතුමනි, ගේ හදලා තියනවාද ? පදිංචි වෙලා තියනවාද ? අවුරුද්දක් ඉවරයි. එකනේ මම ඉස්සෙල්ලා කිව්වේ ගෑණු පිරිමි කරන්න බෑ. පිරිමි ගෑණු කරන්න බෑ කියපු මේ ව්‍යවස්ථා බලතල තියාගෙන මේ හිතාමතාද මේවා කරන්නේ ? ජනාධිපතිතුමා ඇවිල්ලා කිව්වා වහාම පර්චස් 20 ක් දෙන්න. තවම ගරු සභාපතිතුමනි, ඩෙන්ස් වත්ත ඒ කූඩාරමේ තමයි මිනිස්සු ඉන්නේ. මම එක්සත් ජාතික පක්ෂයේවත්, නිදහස් පක්ෂයේවත් අරකේ මේකේ කථා කරන්නේ නැහැ මම. ඒක අයින් කරන්න. මම කියන්නේ මට වුනත්, ඔයාට වුනත්, ගෙදර ළමයෙක් කොටහළු වුනාම පස්සේ ඒ ළමයා ඒ දවසට කරන්න ඕන. කසාද බදින දවසේ ද කරන්නේ ? එහෙම වැඩක් නැහැනේ කරලා. ඒ දවසේ ඒක කරන්න ඕන. කරන්න පුළුවන් දේවල් තියනවා. කරන්න බැරි දේවල් තියනවා. අපි දන්නවා. දැන් කළුපහණ වත්තේ දැන් ගෙවල් 16 ම හරි කියමුකෝ. අවුරුද්දක් යකෝ යනවාද ? බොරුනේ මේක.

ගරු සභාපතිතුමනි, දැන් මේ මන්ත්‍රීවරු ඔක්කෝම කියපු දේ තමයි මම කියන්න වෙන්නේ. දැන් දෙහිඕවිට ඉස්කෝලේ උදාහරණයක් වශයෙන් කියන්න පුළුවන්. කළුපහණ විතරක් නෙමෙයි. අරණායකත් ඔය විදිහට වෙලා තියනවා. කොස්ගම කෑම්ප් එකෙත් ඔය විදිහට සිදුවෙලා තියනවා. මම කියන්න කැමතියි මෙතන අතිගරු ජනාධිපතිතුමා ඇවිල්ලා පර්චස් 20 ක් දෙන්න කිව්වා. ලක්ෂයක් දෙන්න කිව්වා. මොනවාද වෙලා තියෙන්නේ ? නිළධාරීන් ගාවට ගියාට පස්සේ මොනවාද කියන්නේ ? නිළධාරීන් නොයෙකුත් රටේ නැති නීති කියනවා. ඒ නීති හදලා අවුරුදු දහයකින්වත් කරන්න බෑ ගරු සභාපතිතුමනි. ඒ.ජී.ඒ. එකක් කියනවා. ග්‍රාම සේවක එකක් කියනවා. දැන් බලන්න දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළේ වත්තේ ගිහිල්ලා තියනවා නාය යෑමක්. තලපිටිය වත්ත. අපේ නිහාල් මන්ත්‍රීතුමා නිතරම යන එන තැන. ගිය සැරේ නාය, යනකොට එහේ ලැයින් කාමර අටක් තියනවා. මට ආරංචියි මඟුල් ගෙදරකටත් ගිහින් ආවා කියලා ඔබතුමා. ගෙවල් අටක් තියනවා ලැයිමේ. මේ පැත්තේ අටයි, ඒ පැත්තේ අටයි දාසයයි. එතකොට ඒ දාසය ගිය සැරේ නාය යනකොට ගරු සභාපතිතුමනි, දකුණු පැත්තෙන් ඇවිල්ලා. එදත් ගිහිල්ලා බඩු එහෙම දීලා ආවා නිහාල් මන්ත්‍රීතුමා. ඊට පස්සේ මේ පැත්තෙන් ආවා. ඊයේ මොනවාද වෙලා තියෙන්නේ ? මැද ලැයිම තියලා අනෙක් පැත්තෙන් ඇවිල්ලා. කළුපහණ වත්තට හරියන නාය යෑමක් ඒක. අඩි 10 ක් ගියා නම්, මට ආරංචියි ඇමතිතුමා ගිහිල්ලා බැලුවා කියලා. ස්තුතියි. අඩි 10 ක් ඇවිල්ලා තිබුණා නම් ඒ ලැයිම එහෙමම ඉවරයි. පෙරෙයිදා ගිහිල්ලා ග්‍රාම සේවක නිළධාරීතුමා කියනවා දැන් දෙපැත්තම ඇවිල්ලානේ. මැද එන්නේ නෑ, ඉන්න කියලා. බලන්නකෝ. ඒ මිනිස්සු අර ළමයි දාන මේවා එකේ ලයිට්වත් නෑ. ටොයිලට්ස් නෑ. මොකුත් නෑ. පුල්ලෙමඩමේ ඉන්නේ.

මේක මම මේ කියන්නේ මේ සභාව විහිළුවකට ගන්න එපා. මම කියන්න කැමතියි දේශපාලන නායකයෝ රුස්වීම්වලට ගියාට පස්සේ අරක කරන්නම්. මේක කරන්නම්. ඒ වගේම තමයි මෝදි නායකතුමාත් ආවා. ගිය සැරේ ඇවිල්ලා කියලා ගියා අපි යනවා සබරිමලෙයි, ස්වාමියාත්‍රා යනවා කළු ඇදලා. කියලා ගියා වීසා ඕන නෑ, ඉන්දියන් වීසා ඕන නෑ කියලා. අවුරුද්දක් කියලා, ඒක තවම දුන්නේ නෑ. මට ලැජ්ජයි. මොකද මේ දේශපාලනය කියන්නේ ඉතාමත් වැදගත් දෙයක්. ඇයි මේ දේශපාලකයෝ මෙහෙම වෙන්නේ ? ලොකු ලොකු නායකයෝ ඇයි මෙහෙම වෙන්නේ ? එදා ඇවිල්ලා කියනවා ගෙවල් 10,000 ක් දෙන්නම් කියලා. අපි සන්තෝෂයි. කියපු වීසා තවම දීලා නෑ. ඒ වගේ තමයි අපේ නායකයොත්. ඇවිල්ලා කියනවා, අපේ අතිගරු ජනාධිපතිතුමා ඊයේ රත්නපුරේට ආවා. සන්තෝෂයි. ගිය නාය යෑම වෙලාවේ ඇවිල්ලා කියලා ගියා ගරු මන්ත්‍රීතුමනි, පර්චස් 20 ක් දෙන්නම්. අඬේ මේ කැළණිවැලි ප්ලාන්ටේෂන් එකට කථා කරපන්. වාඩි කරපන්. ඔන්න තොන්ඩමන් ඇමතිතුමා කරලා තියනවා ඒවා. දැන් යටියන්තොට යනකොට ඉස්කෝල 1000 ක්, මහින්දෝදය තවුසන්ඩ් ස්කීම් එකේ දෙමල විද්‍යාලය සෙන්ට් මේරිස් එක. ගරු සභාපතිතුමනි, හම්බ වුනාට පස්සේ ප්‍රයිමරිවලට ඉස්කෝල දෙන්න ඉඩ නෑ. ඔන්න දහනලනවා, වටේම දහලනවා. කැළණිවැලි ප්ලාන්ටේෂන් ගියා. ගරු මන්ත්‍රීතුමා කැළණිවැලි ප්ලාන්ටේෂන් කිව්වා අරහේ දාන්න ඕන. මෙහේ දාන්න ඕන. දැන් අපේ මන්ත්‍රීතුමා කිව්වා වගේ පාර්ලිමේන්තුවට දාන්න ඕන. කැබිනට් අනුමැතිය ගන්න ඕන. ඔන්න තොන්ඩමන් ඇමතිතුමා ගියා රෑ 10.00 යි. සරම උස්සාගෙන කොහේද රබර් ගස් කීයක් ද ගලවන්න ඕන ? 40 යි සර්. ගලවපන්. ඔන්න ගැලෙව්වා. ඔන්න ඉස්කෝලේ හැදුවා. ඔන්න දේශපාලනය. ඔන්න ඇමතිතුමනි, දෙහිඕවිට ඉස්කෝලේ අද ඇමතිතුමා හිටියා නම් අපි හදලා ඉවරයි ඉස්කෝලේ. මම ආඩම්බරයෙන් කියනවා. වගකීමෙන් කියනවා. හිටියා නම් අර අනෙක් ගස් ටික ගලවලා දාලා ඉවරයි. වරකාපොල ඉස්කෝලේ මේ ෆයිල් එකක් තියනවා, ඇමතිතුමාට කථා කළා. මහ ඇමතිතුමා පටන් ගත්තේ. මහ ඇමතිතුමා වරකාපොල දෙමළ ඉස්කෝලයක් නෑ කියලා පටන් ගත්තා ඉස්කෝලයක්. සිංහල ඉස්කෝල දැම්මේ. හෝඩිය පන්තිය. හෝඩිය පන්තිය දාලා, හෝඩිය පන්තිය දැන් 5 පන්තියට ඇවිල්ලා. 6 වෙනි පන්තියට දැන් ළමයි දාගන්න තැනක් නෑ. තව මාස තුනයි, හතරයි තියෙන්නේ. මේ ෆයිල් එක පිරිලා ගරු සභාපතිතුමනි. එහෙන් ලියුම් දානවා. මෙහෙන් ලියුම් දානවා. තවම ඉඩම හම්බ වුනේ නෑ. කරන්න පුළුවන් දේවල් මේවා. මම පොදුවේ කියන්නේ ගරු ඇමතිතුමා, මම ඔබතුමා එක්ක තරහා නෑ. කියාගෙන කියාගෙන යන්න පුළුවන්. වෙලාව මදි හින්දා මම කියන්නේ.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

මන්ත්‍රීතුමා, අනෙක් අයටත් අවස්ථාව දෙන්න ඕන.

***ගරු මන්ත්‍රී අන්නාමලයි බාස්ගරන්***
***கௌரவ அண்ணாமலை பாஸ்கரன்***
*Hon Member Annamalei Basgaran*

---

සභාපතිතුමනි, මට මේක කියන්න විතරක් අවස්ථාව දෙන්න. මම කියන්න

එන්නේ, කරන්න පුළුවන් දේවල් තියනවානේ. එතන කැළණිවැලි ප්ලාන්ටේෂන් ඩිරෙක්ටර්ට කථා කළා. මෙහේ එන්න, මේක හදීසි දෙයක්. මේ රබර් ගස් 40 ගලවලා මේක හෙටම රිලීස් කරන්න. මේක අතිගරු ජනාධිපතිතුමාට ඇයි බැරි නියෝගයක් දෙන්න ? අපි අරහේ ගිහිල්ලා, මෙහේ ගිහිල්ලා, විහිළු කර කර ඉන්න ඕන නැහැනේ. පණ ගියාට පස්සේ ඒක මිළ කරන්න බැහැනේ. රත්නපුරේ වේවා, සිංහල වේවා, දෙමළ වේවා, මුස්ලිම් වේවා. මේකට කරන්න පුළුවන් දේ එවෙලේ දෙන්නෙ නැත්නම් පණ ගියාට පස්සේ ලියුම් හුවමාරු කරලා මොකටද කියලා මම අහන්න කැමතියි. මෙච්චර වියදම් කරගෙන මේ වගේ පළාත් සභාවක් මොකටද? ආණ්ඩුවේ මෙච්චර සල්ලි වියදම් කරන්නේ මොකටද ? මෙච්චර නිළධාරීන් මොකටද ? කියලා මම අහන්න කැමතියි. මොකද ග්‍රාම සේවක මහත්මයා කියනවා තලපිටියෙන් කියනවා හෙට එන්න. එතකොට එයා කියනවා නෑ ගිහිල්ලා ඔයා ඉන්න. වත්තේ මහත්මයා කියනවා උඹ ගිහිල්ලා තිබ්බොත් වැඩ නවත්වනවා. වැඩ දෙන්නේ නෑ. ඔන්න බලන්න ගරු සභාපතිතුමනි, ඒ නිසා මම දැන් යෝජනා කරනවා තලපිටියේ අර නාය යැමට පත්වෙලා පුල්ලෙමඩමේ ඉන්න කට්ටියට ගෙවල් 16 ක් ඉන්නවා, ඒ ගෙවල් 16 යෝගම නැත්නම් බටන්ගල හොඳ ඉඩම් තියනවා. ඒක යෝජනා කරලා ඒ නිළධාරීන්, ඒ අයට ඒක දෙන්න කියලා යෝජනා කරමින් තව එක ප්‍රශ්නයක් තියනවා එන්.බී.ආර්.ඕ. රිපෝට්. මොකද කියන්නේ නිළධාරීන් නෑ. අපි බලනවා පෙළක් ආණ්ඩුවේ තැන්වල පුරවලා. නිකම් ඉන්නේ. කයිවාරු ගහගෙන ඉන්නේ. ඇයි මේ පණ බේරා ගන්න පුළුවන් එන්.බී.ආර්.ඕ. රිපෝට් එකට ඉක්මණට කරලා ගන්න බැරිද ? රටේ ඉගන ගත්තු ළමයි නැද්ද ? කෙල්ලෝ කොල්ලෝ නැද්ද ? අර මේ එන්.බී.ආර්.ඕ. රිපෝට් ගන්න පොඩ්ඩක් වැඩිපුර දැම්මොත් මොකද වෙන්නේ ගරු

සභාපතිතුමනි. නිකම් පුරවනවා. අරකේ පුරවනවා. ඉස්පිරිතාලේ පුරවනවා. කියාගෙන යන්න පුළුවන් ගරු සභාපතිතුමනි. ඒ හින්දා මේ වගේ දේවල්වලට යොමු කරන්න. ඔබතුමාට මම මේ අවස්ථාවේ දී මේ සභාවෙන් තව අන්තිම ඉල්ලීමක් කරලා මම නිහඬ වෙනවා. මෝදි මහත්මයා ඇවිල්ලා තියනවා අපේ අගමැතිතුමා ඇවිල්ලා කියලා තියනවා ගෙවල් 10,000 ක් දෙන්නම් කියලා තියනවා. ඒ නිසා අපේ නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමායි අපි දෙන්නාම ඉල්ලන්නම්. අර ගෙවල් 10,000 න් රත්නපුරට ගෙවල් 1000 කුයි, කැගල්ල දිස්ත්‍රික්කයට ගෙවල් 1000 කුත් අරන් දෙන්න කියලා, අතිගරු ජනාධිපතිතුමාට කියලා වහාම ලබාදෙන්න කියලා ඔබතුමාට යෝජනා කරලා, මේ අවස්ථාව ලබාදීපු එක ගැන මම ස්තුති කරලා, නාය යෑමට පත් වෙච්ච, අනාථයට පත් වෙච්ච සියළුම අයට මගේ හෘද පූර්වක කණගාටුව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි !

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! අන්නමලෙයි බාස්කරන් ගරු මන්ත්‍රීතුමාට. මීළඟට බී.ආරියවංශ ගරු මන්ත්‍රීතුමා.

කොට්ඨාශවල නාය යෑමත් සිදුවෙනවා. එමනිසා ඒ තුළින් අපි දීර්ඝ කාලයක සිට දැක්කා 2003 සිදුවීමක් සිදුවුනා. ඊට පසුව

*ගරු මන්ත්‍රී බී.ආරියවංශ*

*கௌரவ உறுப்பினர் பீ.ஆரியவங்ஷ* *Hon.Member B.Ariyawansha* ------

-------------------------------------

ගරු සභාපතිතුමනි, පසුගිය දින ඇද හැළුණු වර්ෂාවත් සමඟ මේ රටේ දිස්ත්‍රික්ක අටකට බලපෑ නායයෑම් හා ගංවතුර හේතුවෙන් විපතට පත් අය පිළිබඳව ඒ අයගේ සුභ සිද්ධීන් සඳහා මේ සභාවේ අද කාලය වෙන් කිරීම පිළිබඳව අපි ඔබතුමාට අද ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, මේ වෙනකොට අපි දන්නවා අපේ දිස්ත්‍රික්කයේ රත්නපුර දිස්ත්‍රික්කයේ සහ කෑගලු දිස්ත්‍රික්කයේ කොටසකුත් ඒ පසුගිය වර්ෂාව නිසා ඇති වී තිබෙන ඉතාම ඛේදනීය තත්ත්වය. ඒ තුළින් අද මේ වෙනකොට 108 කට ආසන්න පිරිසක් ජීවිතක්ෂයට පත් වෙලා, ඒ වගේම දහස් ගණනක් අවතැන් වෙලා ඉන්න මොහොතක මහජන නියෝජිතයින් වශයෙන් අපි දැක්කා පක්ෂ විපක්ෂ සියළුදෙනාම විශාල වෙහෙස මහන්සියක් වෙලා තමන්ගේ ප්‍රදේශවල ඒ වගේම මේ දිස්ත්‍රික්කය තුළ ඒ ස්ථානවලට ගිහිල්ලා ඒ අයට සහන සැළසීම් කටයුතු සිදු කරනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, මේ වෙනකොටත් ස්ථාන කීපයක, විශේෂයෙන් කලවාන, අයගම වගේ ප්‍රදේශවල අපට දකින්න ලැබෙනවා විශාල වශයෙන් අවතැන් වූ පිරිස් ඉන්නවා, ඒ අයට නියමිත ආකාරයේ පහසුකම් මේ වෙනකල් ලැබිලා නැති. ඒ නිසා ඒ පිළිබඳව අපේ ගරු මන්ත්‍රීතුමන්ලා, අමාත්‍යතුමන්ලා මේ පිළිබඳව දීර්ඝ විස්තරයක් කළා. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි දන්නවා මේ රත්නපුර දිස්ත්‍රික්කය තුළ මේ වෙනකොට සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ගංවතුරත්, සමහර ප්‍රාදේශීය ලේකම් වසර කීපයකින් කීපය සෑම වසරකම වගේ කොහේ හරි ස්ථානයක, කොහේ හරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක මේ නාය යෑම් සිදුවෙලා අපේ ජනතාව ජීවිතක්ෂයට පත් වුනා. ඒ වගේම අවතැන් වුනා. ඒ අවස්ථාවල දී අපි දැක්කේ මේවා දින හතක්, එහෙම නැත්නම් මාසයක්, මාස තුනක් යනකොට අමතක වෙලා යනවා. ඒ වගේම වසරක් විතර යනකොට එහෙම සිද්ධියක් වුනාද කියලාවත් දන්නේ නැති තත්ත්වයට පත්වෙලා තියනවා. ඒ වගේ දේවල් අද බොහොමයක් තිබෙනවා. මම උදාහරණයක් වශයෙන් ගත්තොත් කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දැන් වසර 7කට විතර ඉස්සෙල්ලා සිදුවුන නාය යෑමක් නිසා ලංකාබේරිය විද්‍යාලය වසා දමන්න සිදු වුනා. එහි සිසුන් මේ වෙනකොට ලයින් කාමරයක තමයි අධ්‍යාපනය ලබන්නේ. කාමර දෙකක වගේ. මේ පිළිබඳව මම මේ පළාත් සභාවෙත් කථා කළා. සම්බන්ධීකරණ කමිටුවලත් කථා කළා. ඒත් අපේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මුදල් වෙන් වෙලා තිබුණත් ඒ පාසැල ඉදිකරන්න, ඒ ලංකාබේරිය වතුයායෙන් නියමිත ස්ථානයේ ඉඩමක් ලබාදෙන්නෙ නෑ. අදත් මේ දරුවන් පාසැල් අධ්‍යාපනය කරන්නේ ලයින් කාමරයක ගරු සභාපතිතුමනි. ඒ නිසා මේ පිළිබඳව අපි සෑම සම්බන්ධීකරණ කමිටුවකම කථා කළා. ඒ වගේම තමයි එක්බර්ත් වත්තේ එච්.ජී. කියන කොටසේ පවුල් 86 ක් පහුගිය කාලේ අවතැන් වුනා. නාය යෑමට ලක්වෙන බව ඒ වාර්තාවලින් සඳහන් කිරීමෙන් අනතුරුව ඒ අය වරින් වර පාසැලේ තමයි ගතකළේ. ඒත් මෙවර මේ වර්ෂාව නිසා ඒ තලගහවත්ත කියන ප්‍රදේශයේ පවුල් ප්‍රමාණයක් පාසැල වෙත ගිහිල්ලා හිටියා. ඒ වගේම තව නාය යෑම හේතුවෙන් උල්ලිඳුවාව ප්‍රදේශයේ පවුල් 15

ක් පමණ ඒ ප්‍රදේශයේ විහාරස්ථානයක රැඳී සිටිනවා. ඒ වගේම අපි අර ස්ථානයට ගිහිල්ලා අර එච්.ජී.කියන කොටසේ ඉන්න පවුල් 86 ට අයින් වෙන්න කිව්වා ප්‍රාදේශීය

ලේකම්තුමන්ලා, ග්‍රාම නිළධාරීතුමන්ලා, පොලිසියෙන් ගිහිල්ලා කිව්වත් මෙවර ඒ අය අයින් වුනේ නෑ. මොකද ඒ අයගේ ඒ ඉඩම්වලින් අයින් වුනේ නැත්තේ ඒ අය කියනවා අපට හැමදාම ගිහිල්ලා ඉස්කෝලේ ඉන්න කියනවා වහිනකොට. ආයේ අපට එන්න කියනවා වත්තට. ආවාට අපට මේ වෙනකල් පර්චස් 10 ක ඉඩමක්වත් ලබාදුන්නෙ නෑ කියන මතය තුළ මෙවර ඒ අය ඒ වත්තෙන් අයින් වුනේ නෑ. මොකද නාය ඇවිල්ලා යට වුනත් අපි අයින් වෙන්නේ නෑ කියන මතය තුළ ඒ අය හිටියා.

ඒ නිසා ගරු සභාපතිතුමනි, මෙවැනි ස්ථාන හඳුනාගෙන විශේෂයෙන් කඩිනමින් අපි දින හතකින්,මාස තුනෙන්, අවුරුද්දෙන් මේවා අමතක කරලා දාන්නේ නැතිව ගරු සභාපතිතුමනි, යම් වැඩ පිළිවෙලක් හදලා මේ අයට අවශ්‍ය කරන ඉඩම ලබාදීලා, ඉඩම ලබාදීම පමණක් ප්‍රමාණවත් වෙන්නේ නෑ. මොකද අපි දන්නවා විශේෂයෙන් වතුකරයේ ඉන්න ජනතාවටත්, ඒ වගේම අපේ අනෙකුත් ජනතාවටත් ඒ ඉඩම් කැබලි ලබාදීම පමණක් ප්‍රමාණවත් වෙන්නේ නෑ. ඒ නිවාස ඉදිකිරීම සඳහා අවශ්‍ය කරන ඒ පහසුකම් ලබාදීලා ඒ අයට අවශ්‍ය කරන ඒ පසුබිම සකස් කරලා දෙන්න ඕන. ඒ වගේම තමයි අපේ සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා විශේෂ යෝජනාවක් කළා. මම ඒ යෝජනාව ස්ථිර කරන්න ඕන. මොකද අක්කර 27 ක ඉඩමක් එතුමා කිව්වා ව්‍යාපාරිකයෙකුට දෙන්න සැළසුම් කරලා තිබුණා. සම්බන්ධීකරණයේ අනුමැතිය ගත්තා කියලා. ඒ වගේම තමයි අපේ කොලොන්න ප්‍රදේශයේ කොලොන්න

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නාය යෑමට අවධානම් කලාපයක් තියෙන්නේ. එහිදී 2003 වර්ෂයේ දී අක්කර 100 ක ඉඩමක් ගත්තා ඒ නාය යන අයට දෙන්න. මේ වෙනකොට පවුල් 180 ක් විතර එහි

පදිංචි කරලා තියනවා. ඒ අක්කර සියයේ ඉඩමෙන් අක්කර 50 ක ඉඩම් කොටසක් මේ වෙනකොට ඔප්පුවකින් ලබාදීලා තියනවා පුද්ගලයෙකුට ගාල්ල ප්‍රදේශයේ. ඒක පසුගිය සම්බන්ධීකරණයේ දී යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරලා ඒ ඉඩම් අක්කර 50 නිදහස් කරලා ඉල්ලුවා ඒ පුද්ගලයා. ඒ අවස්ථාවේ දී අපි සියළුදෙනාම විරුද්ධ වෙලා ඒ කටයුතු එතනින් නතර කළත් ඒ පුද්ගලයා එදා සම්බන්ධීකරණයට ඇවිල්ලා එළියට බැහැලා ගියේ සම්බන්ධීකරණයේ සභාපතිතුමාට අපි අධිකරණය මඟින් හරි ක්‍රියාත්මක වෙලා මේ ඉඩම ලබාගන්නවා කියලා ප්‍රකාශ කළා. ඒ වගේම මේ ආපදාවලට ලක්වුන අයට ඉන්න හිටින්න ඉඩම් නැති වුන අවස්ථාවල දී තමයි විවිධ නම්වලින්, විවිධ සමාගම් මඟින්, විවිධ පුද්ගලයෝ මේ අක්කර 100 මේ වෙනකොට අරගෙන තියනවා. අපි දන්නවා ඒ නාය ගියාට පසුව අක්කර 100 ක් හේයස් වත්තෙන් එක පුද්ගලයෙක් අරගෙන තියනවා. ඒ වගේම අක්කර 10 ක් සූරියකන්ද වත්තෙන් ගත්තා. ඒත් ඒ ප්‍රදේශයේ නාය යන අයට අපට මේ වෙනකොට පර්චස් 20 ක ප්‍රමාණයක්වත්, පර්චස් 10 ක් වත් දීගන්න නොහැකි වෙලා තියනවා. ඒ නිසා තමයි ඒ ප්‍රදේශයේ ජනතාව එදා ගියේ නැත්තේ.

ගරු සභාපතිතුමනි, තව මිනිත්තුවක් දෙන්න. ඒ වගේම ගරු සභාපතිතුමනි, මේ වෙනකොට අපි දන්නවා මේ ප්‍රදේශවල වගේම රත්නපුර දිස්ත්‍රික්කය තුළ අවතැන් වුන ඒ ජනතාව වෙනුවෙන් අපි අපේ සහෝදර ජනතාව

වෙනුවෙන් උදව් කරන්න අද අපේ ගම්වල ඉන්න සමිති සමාගම්, ඒ වගේම විහාරස්ථාන ඒ වගේම විවිධ ව්‍යාපාරිකයින්, ඒ වගේම විවිධ මාධ්‍ය ආයතන අද ඉදිරිපත් වෙලා ඒ ව්‍යසනයට පත් නොවූ ප්‍රදේශවල අය අද තමන්ට හැකි

පමණින් උදව් උපකාර කරමින් ඒ ප්‍රදේශයට ඇවිල්ලා ඒ ජනතාවට අවශ්‍ය කරන සහන සළසමින් සිටිනවා. අපි සබරගමුව පළාත් සභාව වෙනුවෙන්, ඒ වගේම ගරු සභාපතිතුමනි, අපි ඒ සියළුදෙනාටම ස්තූතිවන්ත වෙන්න ඕන මේ කරන්නා වූ කටයුත්තට. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම වැඩිදුර කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නෑ. මෙවැනි ව්‍යසනයක් ඉදිරියේ දී වළක්වා ගැනීම සඳහා අපි කටයුතු කරනකොට අපි මේවා අමතක කරන්නේ නැතුව කඩිනමින් ඒ විසඳුම් ලබාදීමට අවශ්‍ය කටයුතු කරමුයි කියලා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තූතියි ! ගරු ආරියවංශ බාසූරිය මැතිතුමනි. මීළඟට ගරු මන්ත්‍රී ලක්ෂ්මන් කොඩිකාර මැතිතුමා.

***ගරු මන්ත්‍රී ලක්ෂ්මන් කොඩිකාර.***
*கௌரவ உறுப்பினர் லக்ஷ்மன் கொடிகார*
*Hon.Member Luxman Kodikara.*

---

ගරු සභාපතිතුමනි, සමස්ත ශ්‍රී ලංකාවේම ආපදා තත්ත්වයක් මුහුණපා තිබෙන අවස්ථාවේ සබරගමුව පළාත් සභාව හැටියට අද මේ අවස්ථාවේ සභාව මේ ආපදා තත්ත්වය සිදුවූ අවස්ථාවේ ඒ ගංවතුර, නාය ගිය අයට ආපදා තත්ත්වයක් ප්‍රකාශ කරලා, අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ස්තූතිවන්ත වෙනවා. අද අපි දන්නවා මේ වෙනකොට

ශ්‍රී ලංකාවේම වැඩිම හානිදායක තත්ත්වයක් උදාවෙලා තියෙන්නේ සබරගමුව පළාත් සභාවේ රත්නපුර දිස්ත්‍රික්කයට. කෑගල්ල දිස්ත්‍රික්කයේ අපේ ආසනයේ දැරණියගල දෙහිඕවිට ප්‍රදේශයට ඒ ජල ගැලීම් සිදුවුනාට බහුතරයක්, වැඩිපුර රත්නපුර දිස්ත්‍රික්කයේ නාය යෑම්, ජල ගැලීම්වලින් ජීවිත නැති වෙලා තියනවා. ලෙඩදුක් හැදිලා, තුවාල වෙලා, අසරණ වෙලා තියන සෑම සියළුදෙනාටම අපේ බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා. මොකද අපි දන්නවා ගරු සභාපතිතුමනි, දැන් දිගින් දිගට එන වර්ෂාව, බොහොම ජල ගැලීම් බවට පත් වෙනවා. නාය යෑම් බවට පත් වෙනවා. අපි බලන්න ඕන ගරු සභාපතිතුමනි, මොකද මේ තත්ත්වයට හේතුවෙලා තියෙන්නේ කියලා. අර කියමනක් තියනවා මිනිසා ස්වභාව ධර්මයට එරෙහි වුනාම ස්වභාව ධර්මය මිනිසාට එරෙහි වෙනවා කියලා. අද අපි දන්නවා මේ ගංගා ආශ්‍රිත, වැව් ආශ්‍රිත අනවසර ඉදිකිරීම් වෙනවා. ජලය මනා ලෙස ගලාගෙන යන්න අපහසුතා තියෙනවා. අද ගොඩාක්ම මේ වැවිලි සමාගම් ඉඩම්වල පස සංරක්ෂණය කරන වැඩ පිළිවෙලක් නෑ. එදා අපි දන්නවා මේ ඉඩම්වල යම් දුර ප්‍රමාණයකින් කාණු කපලා ඒ වර්ෂාව කාලයට ඒ කාණුවල වතුර එකතු වෙලා, ඒ වතුර පිටාර ගලලා පහළ කාණුවලට ගිහිල්ලා ඒවා පිරිලා, ඒ යනකොට ඒ පහළ ඇළට එන වතුර ප්‍රමාණය අඩු වෙලා ඒ ඉඩම්වල, ඒ කාණුවල එකතු වෙන වතුර පොළවට උරාගෙන පොළවේ ජල තත්ත්වය ඉහළ යනවා. අද මේ වෙනකොට කිසිම සංරක්ෂණයක් නැති නිසා නියඟය කාලෙට

අපට නියගයට මුහුණ දෙන්න වෙනවා. වර්ෂාව කාලයට නාය යෑම්, ගංවතුරට මුහුණ දෙන්න වෙනවා. ගරු සභාපතිතුමනි, අපි කිව්වා වගේ අපේ ඇමතිවරු, මන්ත්‍රීවරු යෝජනා කළා මේ හදිසි ආපදා තත්ත්වයට මුහුණ දෙන්න ආපදා කමිටුවක් සංවිධානය කරන්න ඕන කියලා. ඒක බොහොම යෝග්‍ය වෙනවා.

මොකද අපි මේ වෙලාවෙත් අසරණ තත්ත්වයට පත් වූ අයට මේ බඩු බාහිරාදිය බෙදා දීමට අපොහොසත් වෙලා තියනවා. ඉතින් ඒකට අපි දන්නවා මේ ආපදා කළමනාකරණයේ හොඳ ක්‍රමවේදයක් හදාගත්තොත් අපට ඉදිරියේ දී හරි මේ එන ආපදා තත්ත්වයකට මුහුණ දෙන්න හොඳ ක්‍රමවේදයක් ඇති වෙයි. ඒ වෙනකොට අපට ක්ෂණිකව ඒ තැන්වලට යන්න එන්න ක්‍රමය හැදෙයි. මොකද අපි දන්නවා ශ්‍රී ලංකාවාසී ජනතාවට ජනතාව යම් දෙයකින් ඛේදජනක දෙයකට පත් වුනාම ඒ විපතට පත් උදවියට ඒ ආධාර උපකාර එකතු කරලා ඒ ආපදාවලට ලක් වුන ප්‍රදේශවලට ස්වෝත්සාහයෙන් කැප වෙලා ඒ බඩු මුට්ටු ගෙනත් දීලා ඒ බෙදා හැරීම් කරනවා. රජයක් හැටියට ඒ රජයේ නිළධාරීන්, ඒ වසම්වල නිළධාරීන්, ඒ ගමේ තරුණ තරුණියෝ ඒවාට දායක වෙනවා. ඉතින් මේ අවස්ථාවේ දීත් ක්ෂණිකව ඒ දේ කල් ඇතිව දැනුවත් නොවුනත් ඒ ක්‍රියා මාර්ග ගන්න යනකොට පොඩි ප්‍රමාද දෝෂ ඇති වෙලා තියනවා. නමුත් අපි ඒවා ඔක්කෝම වළක්වා ගන්න මේ සබරගමුව පළාතක් හැටියට හොඳ සාකච්ඡා මට්ටමට ඇවිල්ලා, අපේ ලොකු වගකීමක් තියනවා සමාජ සේවා ඇමතිතුමාට. ඒ වගේම ඉඩම් ඇමතිතුමාට. මේ සබරගමුවේ මේ ජල ගැලීම් තත්ත්වය යම්තාක් දුරට හෝ පාලනය කර ගැනීමට, පහුගිය කාලයේ නියං තත්ත්වයක් තිබුණා. ඒ නියං තත්ත්වයක් මගහැර ගැනීමට, පස සංරක්ෂණය කර ගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙලකුත් ආරම්භ කරලා මේ ජල ගැලීම්වලට හේතුවෙන කාරණාත් අවම කරගෙන ඉදිරියේ දී මේ සබරගමුවේ ජනතාවට වෙන්නා වූ විපත් ගොඩාක් දුරට අවම කර ගැනීමට මේ ඇමතිතුමන්ලා, මන්ත්‍රීවරු, නිළධාරී මණ්ඩලය සියළුදෙනාම හොඳ සංවිධානාත්මක වැඩ පිළිවෙලක් දියත් කරලා සබරගමුවේ ජනතාවට මේ වෙලාවේ සිද්ධ වූ ඒ දුක් කම්කටොළුවලට ශෝකය ප්‍රකාශ කරමින්, අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන්

ස්තුතිවන්ත වෙමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි !

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ! ගරු ලක්ෂ්මන් කොඩිකාර ගරු මන්ත්‍රීතුමාට. මීළඟට ගරු වරුණ ලියනගේ ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී වරුණ ලියනගේ*
*கௌரவ உறுப்பினர் வருண லியனகே* *Hon.Member Waruna Liyanage* --
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මේ සභාව කල් තබන අවස්ථාවේ දී සියළුදෙනාටම මේ උවදුර සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාවක් උදාකර දීම සම්බන්ධයෙන්. ඉතින් ඇත්තටම ගරු සභාපතිතුමනි, අපේ සියළුම මන්ත්‍රීතුමන්ලා කථා කළා. ඒ සියළුම මන්ත්‍රීතුමන්ලා සියළුදෙනාම පහුගිය ගංවතුර, ඒ වගේම දැන් පවතින තත්ත්වයත් එක්ක සියළුදෙනාම මහන්සි වෙලා මේ වැඩ කටයුතු කරගෙන යනවා. කිසිම ගැටළුවක් නෑ, අපේ පළාත් සභාවේ

සියළුමදෙනා ඒ කටයුත්තේ නියැලිලා ඉන්නවා කියලා අපි මේ කථා කරනකොට දැක්කා. ඉතින් ඇත්තටම අද ගරු සභාපතිතුමනි, අපේ දිස්ත්‍රික්කයේ නායයෑම, ඒ වගේම ගංවතුරෙන් ජීවිත හානි වෙච්ච සියළුමදෙනාට මගේ පෞද්ගලික ශෝකය මේ වෙලාවේ පුද කරන්න කැමතියි. ඉතින් ඇත්තටම කිරිබත්ගලත්, ඇහැළියගොඩ ප්‍රදේශය ගැනත් කථා කළා. ඉතින් ඇත්තටම අපි දැක්කා මේ සියළුම

වගේ ඒවා තියනවාද ? දන්නේ නෑ. ඉතින් ඇත්තටම අපි හන්දුරුකන්දේ ගියා. ඇහැළියගොඩ ගියා. ගරු සභාපතිතුමා, තියනවාද ? නැද්ද ? දන්නේ නෑ. අරයාට කථා කරන්න, මෙයාට කථා කරන්න කියනවා. කිසි දෙයක් වෙන්නේ නෑ. ඉතින් ඇත්තටම ඇහැළියගොඩ අපේ සලිත මන්ත්‍රීතුමා කිව්වා වගේ, ඒ වගේම අපේ කේ.එල්.රත්නායක මන්ත්‍රීතුමා කිව්වා වගේ කිරිබත්ගලත් තියනවා. මම එතන හිටියා ගරු සභාපතිතුමනි. මම ඒක අත්වින්දා.

ජීවිත හානිවල දී පෞද්ගලික ව්‍යාපාරිකයන්, පෞද්ගලික මැදිහත්වීම් තුළින් තමයි ඒ සියළුම අවසන් කටයුතු කිරීම සඳහා ඒ සියළුම ශක්තිය ලබාදීලා තියෙන්නේ. එතකොට ආණ්ඩුවෙන් ඒකට කිසිම සාධාරණයක් ඉෂ්ඨ වෙලා නෑ. ඉතින් ඇත්තටම ආණ්ඩුවක් ගත්තාම ආණ්ඩුවෙන් ඒ ජීවිතයක් හානි වුනාට පස්සේ ලක්ෂයක වන්දි මුදලක් තමයි දෙන්නේ. අපේ පළාත් සභාවෙනුත් රු.10,000/- ක වන්දි මුදලක් දෙන්න තමයි ලෑස්ති කරලා තියෙන්නේ. ඒක ඇතිද ? මදිද ? කියන කාරණය අපි සතුව තිබෙනවා. ඒ නිසා ඇත්තටම ලක්ෂය දෙන්නෙත් වාරික වශයෙන්. අපේ ලේකම්තුමිය ප්‍රාදේශීය ලේකම්තුමියක් වශයෙන් ඉන්නකොට එතුමිය දන්නවා ඇති මේ ආපදාවකට ලක් වුනාම දෙන ආකාරය. රු.15,000/- තමයි පළවෙනි වාරිකය දෙන්නේ. පළවෙනි වාරිකයේ දී අවසන් කටයුතු සිදුකරන එක ජීවිතයකට රු.15,000/- ක් දෙනවා. සමහර වෙලාවට ඒ පවුලේ කිසිම කෙනෙක් නෑ. එතකොට 15,000/- කින් කරන්න පුළුවන් දෙයකුත් නෑ. පෙට්ටියක් ගන්නවත් බෑ. ඉතින් ඒ නිසා ඇත්තටම අපි ඉල්ලීමක් කරන්නේ සභාපතිතුමා, මේක පළවෙනි වාරිකය, දෙවෙනි වාරිකය, තුන්වෙනි වාරිකය වශයෙන් යන්නේ නැතුව එක සැරේම මේ වන්දි මුදල දීලා ඉවර කරන්න. මොකද ඒ මිනිස්සු ආයේ රස්තියාදු කරන්න හොඳ නෑ. මේකේ ඇත්තටම ආපදා කළමනාකරණ අමාත්‍යාංශයක් තියනවා. මෙතුමා කිව්වා

මිනිස්සු එහේට කථා කරනවා. මෙහේට කථා කරනවා. කවුරුවත් ඉදිරිපත් වෙන්නේ නෑ. ඉතින් ඇත්තටම ප්‍රාදේශීය ලේකම්තුමියට එන්න විදිහක් නෑ. පාරවල් කීපයකින් වැහිලා. නිළධාරියෙකුට කියලා ඉන්නේ ගමේ ග්‍රාම නිළධාරී විතරයි. එතුමිය තමයි හිටියේ. ඉතින් ඇත්තටම මම මැදිහත් වෙලා ඒ අවසන් කටයුතු සියළු දේවල් කළේ. ඒ ශක්තිය, ඒ නායකත්වය අපි ලබාදුන්නා. අපි සියළුම මන්ත්‍රීතුමන්ලා ලබාදුන්නා. ඒ නිසා ඒ දේවල් ඒ ආකාරයෙන් සිදුවෙනවා. නමුත් ආණ්ඩුවක් විදිහට, රජයක් විදිහට මේවට නිසි වැඩ පිළිවෙලක් එන්න ඕන කියලා මම විශ්වාස කරනවා. මොකද අපි දැක්කාට පස්සේ සමහර වෙලාවට පවුලේ ඉන්න සහෝදරවරු ඔක්කෝම නෑ. තාත්තා විතරයි ඉන්නේ. නෝනත් නෑ. ආච්චිත් නෑ. ළමයි ටිකත් නෑ. මේ සියළුදෙනා අහිමි වෙලා ගිහිල්ලා තියනවා. ඒ නිසා කිසිම වැඩ පිළිවෙලක් තිබුනේ නෑ. ඒ නිසා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ගැන මම කණගාටුව මේ වෙලාවේ ප්‍රකාශ කරන්න කැමතියි. ඉතින් ඇත්තටම නොයෙකුත් දෙනා නොයෙකුත් දේවල් කිව්වා. ඇත්තටම මම අර ඊයේ ජනාධිපතිතුමාට යෝජනාවකුත් කළේ සභාපතිතුමා මේකට ඊට ඉස්සෙල්ලා අපි කමිටුවක් දාලා රැස්වෙලා මේ ගැන සොයා බලන්න ඕන. හැමදාම අවුරුද්දකට සැරයක් අනිවාර්යයෙන්ම ගලනවා. අනිවාර්යයෙන් නාය යනවා කොහේ හරි.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්*
*கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்*
*Hon.Member M.Y.M.Iflar*
----------------------------------------

කොළඹ ඉදන් අවශ්‍ය කටයුතු කරන්න වෙනවා.

*ගරු මන්ත්‍රී වරුණ ලියනගේ*
*கௌரவ உறுப்பினர் வருண லியனகே* *Hon.Member Waruna Liyanage* --
-----------------------------------------------------

ඉතින් ඔබතුමන්ලා තමයි දන්නේ. මම නම් දැක්කේ නෑ. ඇත්තටම අපට ප්‍රශ්නයක්, මේ අමාත්‍යාංශයක් තියනවාද ? නැද්ද ? කියන කාරණාව සම්බන්ධයෙන්. ඉතින් ඇත්තටම ගරු සභාපතිතුමනි, අපි කියන්නේ දැන් නොයෙකුත් දේවල් කථා කළා. හෙට අනිද්දා වෙනකොට තවත් ඉතාම අමාරු තත්ත්වයක් රත්නපුරේටත්, ඒ වගේම කහවත්ත ප්‍රදේශයටත් ඇති වෙන්න ඉඩකඩ තියනවා කියලා මම විශ්වාස කරනවා. මොකද කළුගඟට නුදුරින් තියන බලිබත්ගොඩ ප්‍රදේශයේ කන්ද. ඔබතුමා ඇමතිතුමා විදිහට දන්නවා නාය යන්න තියෙන්නේ. එන්.බී.ආර්.ඕ. එකෙත් වාර්තාව දීලා තියෙන්නේ. එතකොට නාය ගියොත් මොකද වෙන්නේ ? ගඟම වැහෙනවා. ගඟ වැහුනාට පස්සේ ආපහු ගංවතුර තත්ත්වයක් ඇති වෙනවා. ඉතින් මේවාට අපි ලෑස්ති වෙන්න ඕන නැද්ද ? තවම ඒ ගැන කථාවක්වත් නෑ. කහවතු කන්ද නාය යන්න ඔක්කෝම මිනිස්සු අයින් කරලා. පැළිලා ඉරි ඔක්කෝම ගිහිල්ලා. ඉතින් කහවත්ත ගඟ වැහුනාට පස්සේ වේ ගඟ වැහෙනවා. එහෙම වුනාම පස්සේ මොකද වෙන්නේ ? කහවත්ත නගරයත් ඉවරයි. ඕපනායක ප්‍රදේශයට එනකල් යට වෙනවා. ඉතින් ඒ ගැන සාකච්ඡාවක්වත් නෑ. ඉතින් මොකද කරන්නේ ? මේ දිස්ත්‍රික් ලේකම්වරු ඉන්නවා. නිළධාරීන් ඉන්නවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාල තියනවා. දැනුවත් වීමක් නෑ. ක්‍රියාවක් නෑ. මම හිතන්නේ මේ නාය යනකල් බලාගෙන ඉන්නවා, ගඟ වැහෙනකල්. ගඟ වැහුනාට පස්සේ එතනින් ඉවරයි. ඉතින් ඇත්තටම ගරු සභාපතිතුමා, මේවා කථා කරලා ඉවර කරලා අපි ගෙදර යනවාද ? එහෙම නැත්නම් මේවාට නිදි මරාගෙන වැඩ

සටහන් සකස් කරනවාද ? කියලා තමයි දැන් තියෙන්නේ.

ඉතින් ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි කථා කළා ගංවතුර පාලනය කරන්න ඕන කොහොමද කියන එක ගැන. නමුත් අනවසර ඉදිකිරීම් කළා. හදන්න එපා කිව්වා. මම කිව්වා කියලා ලියාගන්න කිව්වා. නමුත් හැදුවා. ගංවතුර ආවා. ගරු සභාපතිතුමනි, අපේ ගේත් යට වුනා. අපේ ගේත් යට වෙලා තියෙද්දී අපි මේ ගිහිල්ලා උදව් කරන්නේ අනෙක් මිනිස්සුන්ට. ඇත්තටම ගරු සභාපතිතුමා, මේ කියන දේවල් පොඩ්ඩක් අහලා බලලා ඔබතුමා මැදිහත් වෙලා මේ කමිටුවක් හරි පත් කරන්න. පත් කරලා මේවාට එන්න පුළුවන් මන්ත්‍රීවරු ටික හරි පත් කරලා මේවා ගැන හොයලා බලන්න කටයුතු කරන්න. එහෙම නැත්නම් අපි ඇවිල්ලා මෙතන කියන එකේ තේරුමක් නෑ ගරු සභාපතිතුමනි, අපි ප්‍රායෝගිකව අත්විඳපු මන්ත්‍රීවරු පිරිසක් තමයි මෙතන ඉන්නේ. ඒක කථා කරන්න ඕන නිසා තමයි ආවේ. එහෙම නැත්නම් අදත් තව කොහේ හරි ගිහිල්ලා. මේ ටික කියලා යන්න තමයි ආවේ. ඉතින් ඒ නිසා ගරු සභාපතිතුමනි, තව කියන්න ගොඩාක් කාරණා තියනවා. ඔබතුමා කමිටුවක් පත් කරන්න අදම. අද හවසම. මොකද අර බලිබත්ගොඩ නාය ගියොත් ගංවතුර ආපහු. ඊට පස්සේ

කහවත්තේ කන්ද නාය ගියොත් කහවත්ත නගරය ඔක්කෝම ඉවරයිනේ. ඉතින් ඒ නිසා මේක ගැන අවධානයෙන් ඉන්න කියලා ඉල්ලා සිටිමින්, සියළුමදෙනාට ශෝකය පුද කරමින් අවසන් වෙච්ච, නිහඬ වෙනවා. බොහොම ස්තුතියි !

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ! ගරු වරුණ ප්‍රියන්ත ලියනගේ මන්ත්‍රීතුමාට. මීළඟට ගරු මන්ත්‍රී රංජිත් පොල්ගම්පොල මැතිතුමා. එතුමා සභාවේ නෑ. මීළඟට ගරු සිරිල් පල්ලෙපොල මන්ත්‍රීතුමා. එතුමාත් සභාවේ නෑ. මීළඟට ගරු විපක්ෂනායක ඩබ්ලිව්.සෝමදාස මැතිතුමා.

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස*
*கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச*
*Hon.Opposition Leader W.Somadasa*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, අද සබරගමුව පළාත තුළ ගත්තාම රත්නපුර දිස්ත්‍රික්කයේ සහ කෑගලු දිස්ත්‍රික්කයේ සුළු ප්‍රමාණයක් ග්‍රාම සේවා වසම් කීපයක මේ ආපදාවලට ලක්වෙලා, ජනතාව පීඩාවට පත්වෙලා. ඒ වගේම විශාල වශයෙන් ජනතාව අසරණභාවයට පත්වෙලා, ඒ වගේම 77 ක් වගේ ප්‍රමාණයක් ජීවිතක්ෂයට පත්වෙලා අද බොහොම කණගාටුදායක තත්ත්වයකට පත්වෙලා තිබෙනවා කියන එක පළමුවෙන්ම කියන්න ඕන. ඒ එක්කම අපි ගත්තාම දිස්ත්‍රික්ක 08 ක ඒ වගේ ආපදාවන්ට මුහුණ දෙන්න සිදුවෙලා තිබෙනවා ඒ සිටින ජනතාවට. මේ ජනතාව පීඩාවට පත්වෙලා මුහුණ දෙනකොට මෙහි වගකීම භාරගත යුත්තේ රජය. රජයේ නිළධාරීන් මුල්වෙලා ඒ කටයුතු කරන්න ඕන. ඉතින් අපි ඒක දකිනවා අද රත්නපුරේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු කථා කරනකොට රාජ්‍ය නිළධාරීන්ගේ විශාල අඩුපාඩුවක් පෙන්නලා දෙන්න කටයුතු කරනවා.

හැබැයි මට කියන්න සිද්ධ වෙනවා මීට වර්ෂයකට පෙර කෑගලු දිස්ත්‍රික්කයේ නාය යෑම් වලින්, ගංවතුරෙන් පීඩාවට පත්වෙනකොට ඒ වෙලාවේ රාජ්‍ය නිළධාරීන් 95% ක් විතර අවංකව කැපවීමෙන් කටයුතු කළා කියන එක අපට කියන්න වෙනවා. දැන් මෙතනදී අපට පේනවා ජනතාව වෙනුවෙන් කටයුතු කරපු නිළධාරීන්, සමහර විට සුළු පිරිසක් කරන්න ඇති. විශාල පිරිසක් ඒ කටයුතු අවංකව කරලා නෑ කියන එක තමයි අපේ මන්ත්‍රීවරුන්ගේ ප්‍රකාශ වලින් අදහස් වුනේ.

ඉතින් ඒ ගැන අපි කණගාටු වෙනවා. නමුත් මීටත් එහා මේ විදිහට යන්න දෙන්න පුළුවන් කමක් නෑ. පළාත් සභාව සමඟ, පළාත් සභාව වෙන් නොකර ආපදාවට ලක් වෙනකොට පළාත් සභාව තුළ සමාජ සේවා අමාත්‍යාංශයක් තියනවා. අමාත්‍යවරයෙක් ඉන්නවා. ඔහුගේ සේවය කරන්නත්, ඒ වගේම රජයෙන් දිසා ලේකම්වරයාගේ සිට දේශපාලන අධිකාරිය කටයුතු කරනකොට එක් වෙලා ඒ කටයුතු කරන්නත්, අපි ජාතික ආපදා කමිටුවක් පත්කර ගතයුතුයි කියන එක අපේ අධ්‍යාපන ඇමතිතුමා ප්‍රකාශ කළා. මම ඒක ස්ථිර කරනවා. මොකද මෙතන දී මට පැහැදිලිවම පේනවා එක දෙයක් කියන්න පුළුවන් කෑගලු දිස්ත්‍රික්කයේ ආපදාවට

පත්වුනාට පස්සේ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ඒ හානියට පත් වුන මාර්ග සංවර්ධනය කරන්න කෑගල්ල කච්චේරියෙන් පළාත් සභාවට එව්වා. ඒ වෙලාවේ පළාත් සභාවේ කොමසාරිස්තුමා ගාව අධික කාලයක් ඒ යෝජනා ටික ප්‍රමාද වුනා. ඒ නිසා අර හානියට පත් වුන මාර්ග සකස් කරන්න කාලයක් ගියා. මෙන්න මේ වගේ දුර්වලකම් කොයි පැත්තෙත් තියනවා. අපි ඒවා ඉදිරියේ දී හදාගන්න ඕන. අද අපි මුහුණ දෙනවා. හෙටත් මේ වගේ දෙයකට මුහුණ දෙන්න අපි සූදානම් වෙන්න හොඳ නෑ. එහෙම නම් අපි දැන

ගන්න ඕන රාජ්‍ය අංශයත්, පළාත් අංශයත්, ඒ වගේම දේශපාලන අධිකාරියත් එක්වෙලා මේ කටයුතු මුල් වෙලා කරනවා නම් මේ තරම් පීඩාවට ජනතාව පත් වෙන්නේ නෑ කියන එක අපි කවුරුත් අද තේරුම් අරගෙන තියනවා. මීට වඩා අවම කරගන්න පුළුවන් කියන එක ජනාධිපතිතුමා, අගමැතිතුමා ප්‍රකාශ කළා. මීට වඩා අවම කරගන්න පුළුවන් රාජ්‍ය නිළධාරීන් මීට වඩා උනන්දුවෙන් කටයුතු කළා නම් කියන එක කිව්වා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපි ස්තුතිවන්ත වෙන්න ඕන අතිගරු ජනාධිපතිතුමා ඒ වගේම ගරු අග්‍රාමාත්‍යතුමා පියවර ගත්තා, හැම නිළධාරියෙකුටම කිව්වා චක්‍රලේඛවලට යට වෙන්න එපා. තමුන් කළයුතු වැඩ කොටස කරන්න ඕන කියන එක. ඒ වගේම සබරගමුව පළාත් සභාවේ සමාජ සේවා අමාත්‍යතුමා රංජිත් බණ්ඩාර ඇමතිතුමාත් එතුමාට පුළුවන් ආකාරයට ග්‍රාම නිළධාරීන් හරි දැනුවත් කළා තමුන්ට පුළුවන් ආකාරයට ඒ පීඩාවට පත් වෙච්ච ජනතාවට සේවය කරන්න කියන එක. මේ කාර්යයන් හරියට සිදුවුනා. නිළධාරීන්ගේ අඩුපාඩුකම් උඩ ජනතාවට අසාධාරණයක් වුනා කියන එක අපට දැන් පැහැදිලිව

පේන්න තියනවා. එහෙම නම් අපි මේ දේවල් කරන්න කටයුතු කරද්දී අපි කවුරුත් සමගි වෙලා කටයුතු කරන්න ඕන කියන එක තමයි මගේ යෝජනාව.

ඒ වගේම දැන් අපි ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ සේවය බලාපොරොත්තු වෙනවා. ඒ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් ගෙන්වලා දැන් මේ ප්‍රදේශයේ ගත්තාම රත්නපුර දිස්ත්‍රික්කයේ පමණක් නෙමෙයි තව දිස්ත්‍රික්ක අටක ඒ අයට සමීක්ෂණය කරන්න සිදුවෙනවා. කෑගලු දිස්ත්‍රික්කයේ

සිදුවුන ආකාරයට ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිළධාරීන්ට කටයුතු අවසන් කරන්න මාස 6 කට වත් පුළුවන් කමක් වුනේ නෑ. එතකොට එක දිස්ත්‍රික්කයක පමණයි ඒ හානිය සිදුවෙලා තිබුනේ. දැන් අපට පේනවා දිස්ත්‍රික්ක 8 කට මේ නිළධාරීන්ගේ අවශ්‍යතාවය තියනවා. එහෙම නම් අපි මේ ගැන වගකිවයුත්තන්ට අවධානය කරවලා මේ ප්‍රදේශවල රත්නපුර දිස්ත්‍රික්කයට පමණක් නෙමෙයි අනෙකුත් දිස්ත්‍රික්ක ගැනත් අපට කථා කරන්න වෙනවා. මේ හැම තැනටම නිළධාරීන් ඉක්මණට යවලා සමීක්ෂණය කරලා පදිංචි වෙන්න සුදුසු ද ? නැද්ද ? කියන තීන්දුව ඉතා ඉක්මණින් දෙන්න කියලා. මේක ඉල්ලන්න අපට සිද්ධ වෙනවා.

ඒ වගේම විශේෂයෙන්ම අපි සමාජ සේවා අමාත්‍යාංශයේ අපි යෝජනා ගේනවා සභාපතිතුමාට පළාත් සභාවේ මෙන්න මේ වගේ වැඩ කොටසක් කෙරෙන්න ඕන. පළාත් සභාව තුළින් අපි ලොකු වැඩ කොටසක් බලාපොරොත්තු වෙනවා. නමුත් අපි කල්පනා කරන්න ඕන සමාජ සේවා අමාත්‍යාංශයට අයවැයෙන් මුදල් වෙන් කරන්නේ කොහොමද කියන එක.

හැම වෙලාවේම අනෙකුත් අමාත්‍යාංශවල වඩා අඩු මුදලක් තමයි සමාජ සේවා අමාත්‍යාංශයට ලබාදෙන්නේ. එහෙම නම් අපි අද තීන්දුවක් ගන්න ඕන, අපි සාකච්ඡා කරන්න ඕන ප්‍රධාන ඇමතිතුමාත් එක්ක සමාජ සේවා අමාත්‍යාංශයේ දී මේ අවශ්‍යතාවයන් ඉටුකර ගැනීම සඳහා, මේ සම්පත් ලබා ගැනීම සඳහා, අපි යෝජනා කරනවා ඔරුවක් දෙන්න, අරක දෙන්න, මේක දෙන්න කියලා. එහෙම නම් මේවාට මුදල් අවශ්‍යයි. මුදල් නැතුව එතුමාට ඒක කරන්න බෑ, ඒ අමාත්‍යවරයාට. එහෙම නම් අපි ප්‍රධාන අමාත්‍යවරයාට යෝජනා කරලා අපි විශේෂයෙන්ම වැඩ කටයුතු කාරක සභාවේ දී ඒ අදහස යොමු කරවලා

මීට වඩා වැඩි මුදලක් ඊළඟ අයවැයේ දී මේ සමාජ සේවා අමාත්‍යාංශයට ලබාදෙන්න කියලා අපි දැන් මේ වෙනකොට ඉදිරියේ දී අපි යෝජනා කරන්න ඕන.

ඒ එක්කම ගරු සභාපතිතුමනි, දීර්ඝ වශයෙන් කථා කරන්න මම කැමති නෑ. නමුත් බාස්කරන් මන්ත්‍රීතුමා ලොකු කථාවක් කරලා ගියා. ලොකු කථාවක් කළා එයා. එයාට අමතක වෙලා තිබුණා මේ දැන් තියෙන්නේ යහ පාලනය කියන එක. එතුමා කළුපහණ වත්ත ගැන කථා කළා. ඒ වගේම දෙහිඕවිට දෙමළ විද්‍යාලය ගැන කථා කළා. ඇත්ත, ප්‍රමාද වෙලා තියනවා. නමුත් ප්‍රමාද වුනාට දෙහිඕවිට දෙමළ විද්‍යාලය ඇවිල්ලා පළාත් සභාවට අයත් පාසැලක්. ඒ වගේම දෙහිඕවිට දෙමළ විද්‍යාලය හදලා තියෙන්නේ පුද්ගලික සමාගමකට, වැවිලි සමාගමකට අයිති ඉඩමක. ඉතින් මේවා එකවර පවරා ගන්න බෑ. අර තොන්ඩමන් ඇමතිතුමා වගේ රෙද්ද උස්සාගෙන ගිහිල්ලා, රබර් ගස් ටික ගලවලා පාසැල් හදන්න බෑ. මේක යහ පාලන ආණ්ඩුව. නීතියක් තියනවා රටේ. නීතිය නමන කට්ටියත් හිටියා. නමුත් දැන් නීතිය නැමෙන්නේ නෑ. අද නීතිය හරියට ක්‍රියාත්මක වෙලා යනවා. යහ පාලනයක් තුළ ඒ කටයුතු කෙරෙනවා. එතකොට මේ අයට තමන්ගේ අයිතිවාසිකම් ඉදිරිපත් කරන්න යන්න එන්න පුළුවන්. ඒ වුනත් එහෙම කරන්න බැරි ප්‍රමාදයක් තියනවා මේ දෙමළ විද්‍යාලය ගැන. නමුත් මේ වෙනකොට ඉඩම් පවරා ගෙන අවසන්. දැන් තියෙන්නේ පළාත් සභා කැබිනට් එකේ අනුමැතියක් දීලා ඒ කටයුතු අවසන් කරන්න තමයි මේ වෙනකොට තියෙන්නේ. ඒ වගේම කළුපහණ වත්ත ගැන කථා කළා. පවුල් කීපයක්, ඇත්ත කථාව. පවුල් කීපයක් පදිංචි කරවලා තියනවා. ගෙවල් හදලා දීලා තියනවා. සමහර ඒවාට මුදල් දීලා තියනවා. ගරු

සභාපතිතුමනි, අපි සිහිපත් කරන්න ඕන මේ ආණ්ඩුවෙන්, මේ විපත් රාශියක් සිදුවෙනකොට මේ හැම එකකටම මුහුණ දීලා තියනවා. වැඩි පිරිසකට සාධාරණය ඉෂ්ඨ කරලා දීලා තියනවා. සමහර අයට ගෙවල් ගන්න ලක්ෂ 12 ක් දීලා තියනවා. ඉඩම සහ සම්පූර්ණ නැති වෙලා යනකොට, ගෙවල් විනාශ වෙලා ගිය කට්ටිය, නාය ගිය කට්ටියට ලක්ෂ 12 ක් මේ වෙනකොට දෙනවා.

ඒ එක්කම ව්‍යාපාරික ප්‍රජාවට රුපියල් ලක්ෂයක් දීලා තියනවා. ඒක අපි කියන්නේ නෑ සාධාරණයි කියලා. නමුත් වෙච්ච අසාධාරණයට සම්පූර්ණ වගකීම රජයට ගන්න විදිහක් නෑ. ව්‍යාපාරය රක්ෂණය කරලා ඒ වගේ දෙයක් තියෙන්න ඕන. නමුත් ඒ අයටත් රුපියල් ලක්ෂයක් මේ ආණ්ඩුව දීලා තියනවා. ඉතින් වැඩ කළේ නෑ කියලා කියන්න බෑ. අපේ මේ පවතින ආණ්ඩුව මම හිතනවා විශාල වැඩ කොටසක් කරනවා කියලා. අපේ මන්ත්‍රීතුමෙක් කිව්වා ගරු සභාපතිතුමනි, ආපදා කටයුතු අමාත්‍යාංශයක් තියනවා ද දන්නේ නෑ කියලා. අපි දන්නෙ නෑ

රත්නපුරේ මොකක්ද සිද්ධ වුනේ කියන එක. නමුත් අපි කියන්න ඕන කෑගල්ල දිස්ත්‍රික්කයේ යමක් වුන වෙලාවේ ආපදා කටයුතු අමාත්‍යාංශයේ ඇමතිවරයා ආවා. ගරු ජනාධිපතිතුමා ආවා. අගමැතිතුමා ආවා. මාසෙන් මාසෙට රැස්වීම් තිබ්බා. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරු දෙපළ මුල් වෙලා, සම සභාපතිවරු දෙපළ මුල් වෙලා ඒ අමාත්‍යාංශවල නිළධාරීන් ගෙන්වලා සාකච්ඡා කළා. මම හිතන්නේ අපේ දිසානායක මන්ත්‍රීතුමා දන්නවා . එතුමාත් හැම වෙලාවේම වගේ, එතුමාගේ පියා සහභාගී වුනා. ඒ තැන්වල අඩුපාඩු ඒ හිටපු ඇමතිතුමා පෙන්වලා දුන්නා. ඉතින් මේ වගේ ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ කියලා දේශපාලන භේදයකින් තොරව කෑගලු

දිස්ත්‍රික්කයේ වැඩ ටික කෙරුනා. ඒක අපි කියන්න ඕන. රත්නපුර දිස්ත්‍රික්කයේ වැඩ ටික කෙරෙන්න තියෙන්නේ දැන් ඉදිරියේ දී. එක මොහොතින් සිදුවෙන දේවල් නෙමෙයි. නමුත් අපි අර කියපු විදිහට අපි කවුරුත් එකතු වෙලා සමගියෙන් කටයුතු කරනවා නම් අපි මේ අසරණ ජනතාවට ලබාදිය යුතු සේවය ඉක්මණින් ලබාදෙන්න පුළුවන් කියන එක මම ඔබතුමාට සිහිපත් කරලා දෙනවා.

එහෙම නම් මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තුවක් නෑ. ගරු සභාපතිතුමනි, ඔබතුමාට මම නැවතත් ස්තුති කරනවා. ඒ වගේම රංජිත් බණ්ඩාර ඇමතිතුමා මේ යෝජනාව ගෙනාවා මීට ඉස්සර වෙලා. එතුමාටත් ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු විපක්ෂනායක ඩබ්ලිව්.සෝමදාස මැතිතුමාට. මීළඟට සමාජ සුභ සාධන, ග්‍රාමීය සංවර්ධන කටයුතු ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමාට ආරාධනා කරනවා.

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර..***
***கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார*** *Hon. Minister Ranjith Bandara*

---

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේ සභාවේ අනෙකුත් කටයුතු කල් තබලා අද රත්නපුර දිස්ත්‍රික්කයටත්, ඒ වගේම මුළු මහත් ශ්‍රී ලංකාව තුළ මේ ව්‍යසනයට පත් වෙච්ච ජනතාව ගැන අදහස් ප්‍රකාශ කරන්න මේ සභාවේ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට අපේ ස්තුතිය පුද කරමින් විශේෂයෙන්ම රත්නපුර දිස්ත්‍රික්කයෙත්, කෑගල්ල දිස්ත්‍රික්කයෙත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11 ක, 12 ක පමණ වෙච්ච විපත සම්බන්ධව මන්ත්‍රීවරුන්ගේ මැති ඇමතිවරුන්ගේ අදහස් ප්‍රකාශ කරලා විවිධ යෝජනා, ඒ වගේම වියයුතු දේවල් අද මේ සභාව හමුවේ ප්‍රකාශ කළා. මෙම අවස්ථාවේ පැහැදිලිව මතක් කරන්න ඕන සමාජ සේවා දෙපාර්තමේන්තුව, ඒ වගේම අමාත්‍යාංශය හරහා අපි විවිධ අවස්ථාවන්වල දී අපට පුළුවන් ශක්ති ප්‍රමාණයෙන් අපි ඒ ව්‍යසනයට පත් වෙච්ච පවුල්වලට, ඒ වගේම ඒ ප්‍රදේශවලට අපේ හස්තය දිගු

කළා. අපි දන්නවා මේ සමාජ සේවා විෂයය සමගාමී ලැයිස්තුවේ තියන විෂයයක් හැටියට මධ්‍යම රජයත්, පළාත් සභාවත් මේ කියන ආයතන දෙකම ඒකාබද්ධ වෙලා තමයි අපි මේ ව්‍යසනයට පත් වෙච්ච අයට උදව් උපකාර කරන්න ලැස්ති වුනේ. එහිදී අපි නිළධාරීන්ට කිසිසේත්ම දොස් කියන්න කටයුතු කරන්නේ නෑ. මොකද, මේ නිළධාරීන් කියන අයත් මනුෂ්‍යයෝ. මේ අයත් මේ ව්‍යසනයට ලක් වුනා. ගංවතුරට එහෙම නැත්නම් නාය ගිය අවස්ථාවල දී ඒ අයටත් ඒ දේ අත්විදින්න සිද්ධ වුනා. සමහර අවස්ථාවල දී අපි ග්‍රාම නිළධාරීන්ට කථා කරනකොට ඒ ග්‍රාම නිළධාරී තමන්ගේ ගෙයි බඩු අස් කරනවා. සමාජ සේවා නිළධාරීන්ට කථා කරනකොට අල්ලපු

එක්ක පුළුවන් කමක් තිබුනේ නෑ මේ සෑම තැනකටම යන්න. ඒ නිසා අපි තීන්දුවක් ගත්තා ඒ ඒ ප්‍රදේශවල ඉන්න ග්‍රාම නිළධාරීන්, සමාජ සේවා නිළධාරීන් හරහා ඒ ඒ ප්‍රදේශවල තියන වෙළඳසැල් වලින් , අළෙවිසැල් වලින් භාණ්ඩ ලබාගෙන අපි ඉවුම් පිහුම් කට්ටල ලබාදීලා තියනවා සෑම ග්‍රාම සේවා වසමකටම. මේවා උපයෝගී කරගෙන ඒ ජනතාවට අවශ්‍ය කරන කෑම බීම ටික පිළියෙල කරලා දෙන්න. සමහර තැන්වල සමූපකාර සමිති යට වෙලා තිබුණා. ඒ සමූපකාර සමිතිවලින් ගන්න බැරි දේවල් අපි කිව්වා අළෙවි සැළකින් ලබාගන්න. අරගෙන ග්‍රාම සේවකගේ නිර්දේශයත් එක්ක ඒ අවශ්‍ය කටයුතු කරන්න කියලා සෑම මහජන නියෝජිතයෙකුටම, ඒ වගේ යම් යම් ප්‍රදේශවලින් කථා කරපු සෑම

ගෙදර හරි ගිහිල්ලා උදව්වක් කරනවා. ඉතින් මේ වගේ තත්ත්වයකට පළවෙනි දවසේ අපට මුහුණ දෙන්න සිද්ධ වුනා. අපගේ රාජ්‍ය යාන්ත්‍රණය, යමක් කළහැකි රාජ්‍ය යාන්ත්‍රණය ගමට පළවෙනි දවසේ තමන්ගේ උපරිමය කරන්න බැරි වුනා. ඒක පිළිගන්න ඕන. නමුත් ඒ පිළිගන්න ඕන කාරණාව අපි පිළිගන්න සිද්ධ වෙන්නේ ඒ අයත් ඒ ව්‍යසනයට ලක්වෙච්ච නිසා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඒ යාන්ත්‍රණය යම්කිසි දුරට සකස් වෙනකොට අපට පුළුවන් වුනා අර කිව්ව ජනතාවට පුළුවන් ආකාරයට ඒ උදව් උපකාර කරන්න. එහිදී මහජන නියෝජිතයෝ, මම හිතන්නේ පළාත් සභාවේ, පාර්ලිමේන්තු, ඒ වගේම ප්‍රාදේශීය සභාවල හිටපු සභාපතිතුමන්ලා, මන්ත්‍රීතුමන්ලා මේ සියළුදෙනාම අපට ඒ ඒ ප්‍රදේශවල තත්ත්වයන් අපට පැහැදිලිව කථා කළා. එහිදී අපි අමාත්‍යාංශය ගත්ත එක්තරා තීන්දුවක් වුනේ ආපදාවට ලක් වෙච්ච අය ජීවත් කරවීම. ඒ වගේම ඒ අයට අවශ්‍ය කරන එදිනෙදා පරිභෝජනයට අවශ්‍ය කරන ආහාර ද්‍රව්‍ය ලබාදීම. අපට මේ ගංවතුරත් එක්ක සහ නාය යෑම් එක්ක මේ මාර්ගවල යෑමට තිබුණ අපහසුවත්

පුද්ගලයෙකුටම අපි කිව්වේ මේ වගේ ක්‍රියාදාමය ඉෂ්ඨ කරන්න. සියළුදෙනාම තමන්ට පුළුවන් ආකාරයෙන් ඒ දේ ඉෂ්ඨ සිද්ධ කළා. නමුත් අර කිව්වා වගේ සමහර මහජන නියෝජිතයෝ කිව්වා යාමට තවමත් බැරි ස්ථාන තිබෙනවා. ඒවාට ගුවනින් තමයි ආහාර ද්‍රව්‍ය ලබාදුන්නේ. සමහර තැන්වල ගුවනින් ආහාර ද්‍රව්‍ය ලබාදෙනකොට අපි දන්නවා ඒවා විනාශ වෙනවා. නමුත් අපට ඒකට කරන්න දෙයක් නෑ. බත් පාර්සල් 500 ක් ඕන තැනට අපි 1000 ක් දානවා. අඩුගානේ 500 ක් හරි ලැබෙනවා එතකොට. වෙන කරන්න දෙයක් නෑ. ඒ යන්න බැරි තැන්වලට ගුවනින්, ගුවන් හමුදාව විශාල සහයෝගයක් අපට ලබාදුන්නා ඒ අවස්ථාවේ. නමුත් දැන් මේ වෙනකොට තත්ත්වය ගොඩාක් දුරට පහ වෙලා ගිහිල්ලා. අද මාර්ග පද්ධතිය පිළිසකර කරලා, අද රාජ්‍ය යාන්ත්‍රණය ඉතාමත්ම උවමනාවෙන් ජනතාවගේ පහසුකම් සඳහා අද ක්‍රියාත්මක වෙනවා. අද විදුලිය ලබාදීම, ඒ වගේම මාර්ග පහසුකම් ලබාදීම, සන්නිවේදන පහසුකම් ලබාදීම මේ සියල්ලක්ම අද යථා තත්ත්වයට පත්

වෙමින් ඉන්නවා. දැන් අපට තියන ප්‍රධානම කාරණාව අපි මේ ඊයේ පෙරෙයිදා පළාත් සභාවේ අමාත්‍යාංශ පහම එකට ඒකරාශී වෙලා කමිටුවක් පිහිටෙව්වා. සෞඛ්‍ය අංශය, ඒ වගේම පළාත් පාලන, ඒ වගේම කෘෂිකර්ම, ඒ වගේම අධ්‍යාපන, සමාජ සේවා මේ කියන විෂයයන් පහම ඒකරාශී කරලා අපි කමිටුවක් පිහිටුවලා ඒ කමිටුව හරහා මේ අපේ පළාතේ මේ ව්‍යසනයට පත් වෙච්ච ජනතාවගේ විවිධ අවශ්‍යතාවයන්, අපි දන්නවා අධ්‍යාපනය පැත්තෙන් ගත්තාම දරුවන්ගේ අද පෙළ පොත්, පාසැල් පොත්, ඇඳුම් පැළඳුම් මේ සියල්ලක්ම අද නැති වෙලා තිබෙනවා. ගංවතුරට ගහගෙන ගිහිල්ලා. ඒ වගේම පාසැල් දරුවන් අද නාය යෑම්වලට ලක් වෙලා අහිමි වෙලා තිබෙනවා, විශාල ප්‍රමාණයක්. මෙන්න මේ අයට අධ්‍යාපනය පැත්තෙන් ලබාදෙන්න ඕන උදව් උපකාර

පළාත් පාලන දෙපාර්තමේන්තුව මැදිහත් වෙලා අද මේ ලිං පිරිසිදු කිරීම සහ ක්ලෝරීන් කිරීම සම්බන්ධයෙන් අද මේ වෙනකොට ආරම්භ කරලා තිබෙනවා.

ඉතින් මේවා අද වෙනකොට විවිධ අංශ සෞඛ්‍ය අංශය ඒ වගේ මැදිහත් වෙනවා. ඒ වගේම අද ඇළ වේලි කඩාගෙන ගිහිල්ලා අද මේවා පිළිසකර කිරීම මම හිතන්නේ වාර්තාවල් ලැබෙමින් තිබෙනවා. කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් අද පහත් බිම් තවමත් ජලයෙන් යට වෙලා තිබෙන්නේ. මේවා ගැන තොරතුරු ලැබෙමින් පවතිනවා. ඉතින් ඒ නිසා අද අන්තර් සම්බන්ධීකරණය මේ පළාත් සභාවේ අමාත්‍යාංශ සියල්ලක්ම ඒකරාශී වෙලා සමාජ සේවා අමාත්‍යාංශයත් එක්ක මේවාට මැදිහත් වෙලා ක්‍රියාත්මක

අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මක කරන්න අපි උපදෙස් දීලා තියනවා. ඒ වගේම සෞඛ්‍ය පැත්තෙන් අද සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට ප්‍රධාන අමාත්‍යතුමා මැදිහත් වෙලා අද පළාත් පාලන ආයතන සියල්ලකටම මේ ව්‍යසනයට ගොදුරු නොවිච්ච විශේෂයෙන්ම කෑගල්ල දිස්ත්‍රික්කයේ යම් යම් පළාත් පාලන ආයතන, ඒ වගේම මේ පළාතෙන් පිට අපි දන්නවා මොණරාගල පැත්තේ, ඒ වගේම බදුල්ල යම්කිසි ප්‍රමාණයක මේ අයට අපි ඉල්ලීමක් කළා මේ අයගේ සම්පත් අපට ලබාදෙන්න. විශේෂයෙන් පානීය ජලය අවශ්‍යතාවය අපිට දැඩිව තිබෙනවා. රත්නපුර නගරය, ඒ වගේම නගරයෙන් පිට මේ සියළුම තැන්වල අද වෙනකොට පානීය ජලය බොහොම ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඉතින් ඒ නිසා අද පානීය ජල බෝතල් විවිධ ස්වෙච්ඡා සංවිධානවලින් විවිධ අංශවලින් අපට ලැබුණත් එය බීමට පමණයි. නමුත් අපට අවශ්‍යයි මේ ලිං, අපේ ලිං ටික පිරිසිදු කරගන්න. ඒ නිසා අද වෙනකොට සෞඛ්‍ය අමාත්‍යාංශයේ මැදිහත් වීම, ඒ වගේම

කරනවා. මම කියන්නේ මේ සියල්ලක්ම 100% ක් ක්‍රියාත්මක වෙලා නෑ. අපි දන්නවා ඊයේ වෙනකොට අපට මාධ්‍යවේදී මහත්මයෙක් කිව්වා යම්කිසි ස්ථානයක් ගැන. අතිගරු ජනාධිපතිතුමාගේ සාකච්ඡාවේ දී ජනාධිපතිතුමාට පැවසුවා යම්කිසි ස්ථානයක මේ වගේ සිද්ධ වෙලා කියලා. ඒ වගේ සිද්ධ නොවිච්ච තැන් තියනවා. අපට තොරතුරු ලැබෙමින් පවතිනවා තවමත්. අපට දැන් අද උදේ අජිත් කුමාර මන්ත්‍රීතුමායි මමයි පළාත් සභාවට ආවාම අපට දුරකථන පණිවිඩයක් ආවා කොහේද කිරිඇල්ලේ නැඳුන් විහාරයේ අවතැන් වෙච්ච පිරිසක් ඉන්නවා 100 ක් විතර කියලා. දවල්ට කෑමත් නෑ. ඉතින් අපි ක්ෂණිකව මැදිහත් වුනා මේකට. ඒ වගේ අපට තවමත් තොරතුරු ලැබෙමින් පවතිනවා. දැන් දුරකථන ඇමතුම් විශාල ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙනවා. කථා කරගන්න බැරුව ඉන්නේ.

ඉතින් ඒ නිසා විශේෂයෙන්ම අපේ මාධ්‍යවේදීන්ට ස්තුතිවන්ත වෙනවා යම් යම් දේවල් දැනුවත් කරනවා. ඒ වගේම ඒ අයගෙත් යම් යම් සම්බන්ධතා උඩ අපට ඒ තොරතුරු ලබාදීම සම්බන්ධව. ඉතින් ඒ නිසා මම කාලය ගන්නේ නෑ, ගොඩාක් කථා කරන්න. අපි වැඩ කරන්න ඕන. පුළුවන් විදිහට අමාත්‍යාංශය, අපේ විපක්ෂනායකතුමා කිව්වා බොහොම දුප්පත් අමාත්‍යාංශයක්. නමුත දුප්පත් වුනත් අපි ඒ දුප්පත්කම නොසළකා අපි ජනතාව වෙනුවෙන් කරන්න ඕන ටික පැහැදිලිව අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමිය ප්‍රධාන සියළුම නිළධාරීන් මේකට මැදිහත් වෙලා සෘජුව කටයුතු කරනවා. ඔබ තුමුන්නාන්සේලාගේ ලැබුණ සහයෝගය ඉදිරියටත් අපට ලබාදෙන්න කියලා ඒ ඉල්ලීම කරනවා.

ඒ වගේම තවත් විශේෂ පණිවිඩයක් මම මාධ්‍යයෙන් ඉල්ලනවා. ඊයේ රෑ යම්කිසි මාධ්‍යයක ගියා මුවගම කන්ද නාය යනවා කියලා. මේක නිවැරදි කරන්න. මොකද මුවගම කන්ද නෙමෙයි නාය යන්නේ, ගොරොක්ගොඩ කන්ද. ගොරොක්ගොඩ කන්ද නාය ගියාට කළුගඟ හරස් වෙන්නේ නෑ. මෙන්න මේක ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මාධ්‍යවේදීන්ගෙන් ප්‍රකාශයට පත් කරන්න. මොකද අද විශාල ජනතාවක් අපහසුතාවයට පත්වෙලා තියනවා, මුවගම කන්ද යනවා. ගියොත් රත්නපුර නගරයම යට වෙනවා. අද නගරයේ ඉන්න අය පිටත් වෙන්න යනවා. මේ වැරදි පණිවිඩයක් ගියා මාධ්‍යයෙන්. මම මාධ්‍යය මොකක්ද කියන්නේ නෑ. නමුත් ඒක නිවැරදි කරමු. ගොරොක්ගොඩ කන්ද නාය යෑමට ලක්වෙලා තිබෙන්නේ. ඒ නිසා ඒ අය ඉවත් කළා ඊයේ පවුල් 75 ක් පමණ බාලිකා විද්‍යාලයට. එතනින් අද උදේ ගිහිල්ලා බලනකොට ඒ අය නැවතත් ගමට ගිහිල්ලා. පනහක්, විසිපහක් විතර ආයේ බාලිකාවේ රැඳී ඉන්නේ. ඒ නිසා ගොරොක්ගොඩ කන්ද තමයි පැලීමට ලක්වෙලා තිබෙන්නේ. මුවගම කන්දත් පැලීමට ලක්වෙලා තිබෙනවා නම් අපි එන්.බී.ආර්.ඕ. එකෙන් වාර්තාවක් අරගෙන තමයි අපට ඒක තහවුරු කරගන්න වෙන්නේ. ඒ වගේම ගොඩනැගිලි පර්යේෂණ ආයතනය ගැනත් සඳහන් වුනා. විශේෂයෙන්ම රත්නපුර දිස්ත්‍රික්කයේ පමණක් නෙමෙයි ලංකාවේ හැම දිස්ත්‍රික්කයකම දෙන්නයි ඉන්නේ. නමුත් මේ වෙනකොට 50 ක කණ්ඩායමක් රත්නපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වෙනවා. ඒ අය සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින්, ඒ වගේම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් ලැබෙන හැම පණිවිඩියකටම, හැම කන්දක්ම ඒ අය පරීක්ෂා කරනවා. හැබැයි ප්‍රමාදකම් තිබෙනවා. මොකද කන්දක් පරීක්ෂා කරන්න දවසක් දෙකක් යනවා මේ අයට. ක්ෂණිකව ගිහිල්ලා මේ කඳු තරණය කරලා මේ පරීක්ෂාව කිරීමට නොහැකියි. ඒ වගේම ඒ අයත් හැම වෙලාවේම කියන්නේ නාය යාමට සුදුසුයි කියලා ගඟේ වතුර පාරක් එනවා නම් ඒ අය කියන්නෙත් ඉවත් වෙන්න කියලා. ඒ අය කියන්නේ නෑ මේකේ ඉන්න කියලා. ඒ අය කියන්නෙත් ඉවත් වෙන්න. ඉවත් වෙලා කඳවුරකට ගිහිල්ලා හිටියාම කඳවුරක් රැක බලා ගැනීම අපට කරන්න සිද්ධ වෙනවා. නමුත් ඒ අය නැවත වතාවක් ආයේ පහුගිය කාලේ සිද්ධ වෙච්ච වගේම ඒ තැනටම යනවා.

ඉතින් ඒ නිසා මේ කාරණාව සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා කියනවා වගේ වඳුරෝ ගෙවල් හදනවා වගේ තමයි අපිත්. වැඩ පිළිවෙලවල් කොච්චර තිබුණත්, මට මතකයි 2003 ගංවතුරට ඒ ඉඩම් දීපු මිනිස්සු ඒ ඉඩම්වලට ගියා නම් අද ඔය තත්ත්වයන් ඇති වෙන්නේ නෑ. අද ඒ ඉඩම් අර ගත්තු මිනිස්සු ඒ ඉඩම්වල ගෙවල්

හදලා පරණ තැනම පදිංචි වෙලා ඉන්නවා. දැන් මේක තමයි ලංකාවේ සිද්ධිය. සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා හැමදාම මතු කරන්නේ ඒ කාරණාව. එදා ජනාධිපතිතුමා ඉස්සරහා මතු කළෙත් ඒ කාරණාව. ඉඩම් දුන්නා නම් ඒ අය ඉඩම්වලින් යා යුතුයි. පරණ ඉඩම් රක්ෂිත කළයුතුයි. ඉතින් මේක සිද්ධ වෙන්නේ නෑ. එමනිසා තීන්දු තීරණ බාස්කරන් මන්ත්‍රීතුමා කිව්වා වගේ අර ජනාධිපති බලතල මෙන්න මේවාට ක්‍රියාත්මක කරන්න. හොඳ දෙයට ක්‍රියාත්මක කරන්න ඕන. ඉතින් මේක තමයි අපි දකින්නේ. ගොඩාක් කාරණා අපි දකිනවා. කොච්චර කාරණා දැක්කත් ඒවා නැවත නැවත අප ව්‍යසනයක් වුනාම කථා කරනවා. ඊට පස්සේ අපිත් අර ගොළුබෙල්ලා කට්ට ඇතුලට ගියා වගේ පැත්තකට වෙලා ඉන්නවා. ඒ නිසා එහෙම නැතුව අපි අර කිව්වා වගේ පළාතක් හැටියට අපේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ඒ වගේම පළාත් සභා ප්‍රධාන ලේකම් කාර්යාලය මේ සියළුදෙනාම ඒකරාශී

වෙලා මේ කටයුත්තට මැදිහත් වෙලා අපි පාට පක්ෂ භේදයකින් තොරව, ජාතීන් අතර භේදයකින් තොරව අපි සියළුදෙනාටම මේ වෙච්ච ව්‍යසනය ඉදිරියට කාටත් නොවේවා කියලා ප්‍රාර්ථනා කරමින්, මේ ව්‍යසනයෙන් ජීවිත හානි වෙච්ච පවුල්වලට, ඒ වගේම ආපදාවට ලක් වෙච්ච සියළුම පවුල්වලට පළාත් සභාවේ කණගාටුව සහ ශෝකය ප්‍රකාශ කරමින්, ඔබතුමාට දුන්නා වූ අවස්ථාවට බොහොම ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ! ගරු රංජිත් බණ්ඩාර ඇමතිතුමාට.

**සභාව කල් තැබීමේ යෝජනාව :**

***ගරු සභාපති කංචන ජයරත්න***
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ගරු සභානායකතුමාට අවස්ථාව.

***ගරු සභානායක අසෝක ජයවර්ධන.***
*கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன*
*Hon.Gov.Whip Asoka Jayawardane*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මෙම ගරු සභාව 2017 ජූනි 13 දින පෙරවරු 10.00 දක්වා කල් තබන ලෙස යෝජනා කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ! සභානායක අසෝක ජයවර්ධන මැතිතුමනි.

**සභාව කල් තබන අවස්ථාවේ යෝජනා :**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

මේ යටතේ කිසිවක් ලැබී නැහැ. දැන් වේලාව මධ්‍යාහ්න 1.30 යි. මම හිතන්නේ රංජිත් බණ්ඩාර ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා වගේ මම හිතන්නේ සමස්ත රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවටත්, සබරගමුව පළාතේ ජනතාවටත්, ඒ වගේම ලංකාවේ බහුතර ප්‍රදේශයකටත් ඇති වුන මේ තත්ත්වය යටතේ අද දවසේ දී සභාවේ කටයුතු අත්හිටුවමින් ඒ පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවට එකඟ වෙමින් ඒ කටයුතු පිළිබඳව ආණ්ඩු පක්ෂයෙත්, විපක්ෂයෙත් සියළුම ගරු මැති ඇමතිතුමන්ලා ඒ පිළිබඳව ඉතාම වැදගත් වූ, ඉතාම වටිනා වූ ඒ වගේම අපෙන් ඉටුවිය යුතු යුතුකම් පිළිබඳව බොහොම පැහැදිලිව විපක්ෂනායකතුමා ඇතුළුව සියළුදෙනාම ප්‍රකාශ කරන්න යෙදුනා.

ඒ නිසා ඒ සියළුදෙනාටම අපි මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙමින්, නැවත වතාවක් මේ ව්‍යසනයෙන් විපතට පත් වෙච්ච රත්නපුර දිස්ත්‍රික්කයෙත් ඒ වගේම සබරගමුව පළාතෙත් , ඒ වගේම සමස්ත ලංකාවෙත් ඒ විපතට පත් වෙච්ච, ඒ වගේම මිය ගිය සියළුම දෙනාගේ පවුල්වල ඥාතීන්ට අපගේ බලවත් ශෝකයත්, ඒ වගේම විපතට පත් වෙච්ච ජනතාවට අපගේ බලවත් කණගාටුවත් මේ අවස්ථාවේ ප්‍රකාශ කරමින්, ඉදිරි දිනයක දී ඉතාමත්ම ශක්තිමත්ව විශේෂයෙන් වරුණ ලියනගේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේ ශක්තිමත් වැඩ පිළිවෙලක් ඔස්සේ මේ පළාත් සභාව හරහා මේ කටයුතු සාර්ථකව කිරීමට ශක්තිය ලබාදෙන්න කටයුතු කරමු කියලා යෝජනා කරමින්, මෙම ගරු සභාවේ වැඩ කටයුතු අදට අවසන් කරනවා.

මෙම ගරු සභාව 2017 ක් වූ ජූනි මස 13 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබනවා.

අත්/කළේ :

කංචන ජයරත්න,
සභාපති,
සබරගමුව පළාත් සභාව.

පී.එස්.ආර්.එම්.විජයරාජ,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2017 ක් වූ ජූනි මස 09 වෙනි දින,
සභා ලේකම් කාර්යාලයේ දීය.

(අශෝධිත පිටපත)